ශීර්ෂය 111 - සෞඛ්‍ය අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 111 සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 18 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ පිටු අංක 6 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල පිටු අංක 06 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සෞඛ්‍ය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2018 වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය රු.මිලියන 46,940.73 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ඉන් රු.මිලියන 7,102.99 ක් 2019 වර්ෂයේදි අළුතින් ඉඩම් අත්පත් කර ගැනීමක් ලෙස දක්වා තිබුණි.	සැසඳීම් කටයුතු සිදු කරමින් පවතින බව.	වැරදි නිවැරදි කර 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
(ii)	2018 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.මිලියන 14,793.13 කින් අඩුවෙන් දක්වා තිබීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට මූලධන වත්කම් ඊට සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.	ඇතැම් දීර්ඝකාලීන ව්‍යාපෘති හරහා ජනිතවී ඇති වත්කම් අතරින් රුපියල් මිලියන 14,676.29ක පමණ වටිනාකමක් 2024 දෙසැම්බර් 31 වන විට ප්‍රාග්ධනිත කරන ලද බව, මීට අමතරව අමාත්‍යාංශයේ ශීර්ෂය හැර වෙනත් ආයතන ශීර්ෂ හරහා සිදුවී ඇති වත්කම් ජනනය කිරීම් හඳුනාගැනීම් සිදුකෙරෙමින් පවතින බව.	-එම-
(iii)	භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන අනුව 2019 වර්ෂය තුළදී අත්පත් කර ගෙන තිබුණු ගොඩනැගිලි හා ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 6,501.94 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණු අතර 2019 වර්ෂය තුළදී අත්පත් කර ගෙන තිබුණු වත්කම් වල පිරිවැය රු.මිලියන 2,967.27 ක් වැඩියෙන් ගිණුම් ගත කිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට සැසඳීම් කටයුතු සිදු කරමින් පවතින බව.	-එම-
(iv)	භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන එස්ජී 80 මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශයට හා එස්ජී 82 සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවට අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල පිරිවැයෙහි පැවති රු.මිලියන 19,789.44 ක වෙනසට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.	දීර්ඝකාලීන ව්‍යාපෘති හරහා ජනිතවී ඇති වත්කම් අතරින් රුපියල් මිලියන 14,676.29 ක පමණ වටිනාකමක් 2024 **දෙසැම්බර්** 31 වන විට ප්‍රාග්ධනිත කරන ලද බව, මීට අමතරව අමාත්‍යාංශයේ ශීර්ෂය හැර වෙනත් ආයතන ශීර්ෂ හරහා සිදුවී ඇති වත්කම් ජනනය කිරීම් හඳුනාගැනීම් සිදුකෙරෙමින් පවතින බව.	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

(v)	2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2021 ජනවාරි 01 දිනට දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය රු.මිලියන 192,229.15 ක් වුවද, භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශය (SA 80) හා සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) ප්‍රකාරව එම අගය පිළිවෙලින් රු.මිලියන 172,439.71 ක් හා රු.මිලියන 184,327.77 ක් වූයෙන් පැවති පිළිවෙලින් රු.මිලියන 19,789.44 ක හා රු.මිලියන 7,901.38 ක වෙනස්කම්වලට හේතු අනාවරණය නොකෙරුණි.	-එම-	-එම-
(vi)	2021 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු මාසික වියදම් සාරාංශය (SA 10) ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් හා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) ප්‍රකාරව එම අගය අතර වූ රු.මිලියන 16,877.89 ක වෙනස සඳහා හේතු අනාවරණය නොකෙරුණි.	-එම-	-එම-
(vii)	2020 වර්ෂයේදී විවිධ දේශීය, විදේශීය ආයතන, සංවිධාන හා පුද්ගලයින් විසින් අමාත්‍යාංශයට හා ඒ යටතේ පවතින රෝහල් ආයතන හා විවිධ අංශ වෙත මූල්‍ය නොවන ආධාර හෝ පරිත්‍යාග ලෙස වටිනාකම රු.මිලියන 1,339.25 ක භාණ්ඩ උපකරණ හා වෛද්‍ය සැපයීම්ද වටිනාකම නොදත් භාණ්ඩ හා උපකරණ ඒකක 2,444 ලබාදී තිබුණු බැව් තහවුරු වුවද ඒවායේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.	වෙනත් ආයතන වලින් මාරුකරන ලද වත්කම් Transfer in යටතේ New-Cigas පද්ධතියේ වත්කම් මොඩියුලයට ඇතුළත් කළ යුතු බවට ප්‍රධාන මූල්‍ය නිළධාරී iii ගේ අත්සනින් යුක්තව නිකුත්කළ ලිපිය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින රෝහල් හා ආයතන දැනුවත් කර ඇති අතර වර්තමානයේ එම ගිණුම්ගත කිරීම් සිදු කිරීමට අඛණ්ඩව උපදෙස් ලබාදීම් හා අධීක්ෂණ කටයුතු සිදු කරන බව.	ගිණුම්ගත නොකළ සියලුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
(viii)	2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු විදේශාධාර ව්‍යාපෘති 54 ක් යටතේ දරන ලද රු.මිලියන 7,603.09 ක වියදම තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් හා සංවර්ධනය සඳහා දරන ලද වියදම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ඇතැම් ව්‍යාපෘති මඟින් ස්ථාවර වත්කම් ජනනය වී නොමැති බව, එමෙන්ම ස්ථාවර වත්කම් ජනනය වූ ඇතැම් ව්‍යාපෘති බොහොමයක් විසින් එම වත්කම් ලබාදී ඇත්තේ මධ්‍යම රජය යටතේ පාලනය නොවන රෝහල් හා ආයතන සඳහා වන බව, සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින රෝහල් හා ආයතන සඳහා ලබාදී ඇති ඇතැම් වත්කම් **Transfer in** යටතේ **New-Cigas** පද්ධතියේ	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියලුම මූල්‍ය නොවන වත්කම් අමාත්‍යාංශයේ හෝ එම වත්කම් ලබාදුන් ආයතනවල හෝ මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කළ බව තහවුරු කරන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ

		වත්කම් මොඩියුලයට ඇතුළත් කර ඇති බව.	යුතුය.
(ix)	2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව හා භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එදිනට මූල්‍ය නොවන වත්කම්වල අගය හා 2022 වර්ෂයේ භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2022 ජනවාරි 01 දිනට එම අගය අතර රු. මිලියන 5,244.56 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනසට හේතුව විගණනයේදී පැහැදිලි නොකෙරුණි.	අදාළ ආයතන හා රෝහල් වලින් ලබාගත් තොරතුරු රැස්කර එක් ගොණුවක් සේ සැකසීමේදී සිදුව ඇති පද්ධති දෝෂයක් හේතුවෙන් සත්‍ය අගයන් ගොණුගතවී නොමැති බව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර එම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
(x)	2022 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 ට අනුව, 2022 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් හා භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එම අගය අතර රු. මිලියන 11,423.16 ක වෙනසක් පැවතුණි.	-එම-	-එම-
(xi)	කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,326.05 ක මූල්‍ය නොවන වත්කම් මිලදීගෙන තිබුණු අතර මෙම වත්කම්වල පිරිවැය අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	2023 හා 2024 වර්ෂයන්වල ප්‍රාග්ධනිත කර ඇති වටිනාකම් සම්බන්ධ තොරතුරු 2024 ජූනි 26 දින විගණනයට වාර්තා කර ඇති බව.	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියලුම වත්කම් ගිණුම් ගත කළ බව තහවුරුවන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.
(xii)	විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන 59 ක 2022 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව රෝහල් /ආයතන 25 ක ඉඩම් මෙන්ම රෝහල් /ආයතන 05 ක ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	2024 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රගතිය ඉදිරිපත් කර ඇති බව.	කඩිනමින් මෙම වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.
(xiii)	ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට හා සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අයිතිය පවරන ලද වාහන දෙකක පිරිවැය රු. මිලියන 11.55 ක් 2022 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය වාර්තාවල ඇතුළත්ව තිබුණි.	ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා ඇති වාහනය CIGAS ගිණුම් පද්ධතියට ඇතුළත් කර මුද්‍රිත පිටපතක් යොමුකරන ලෙස පොලිස් මූලස්ථානය වෙත දන්වා ඇති බව, සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අයත් රුපියල් 6,850,000 ක් වටිනා වාහනය New Cigas පද්ධතිය	වරද නිවැරදි කර ඒ බව විගණනයට තහවුරු කළ යුතුය.

		වෙතින් ඉවත්කර ඇති බව.	
(xiv)	විගණනය විසින් ඉල්ලුම් කළ තොරතුරු ඇතැම් ආයතන විසින් ලබාදී නොතිබුණි. අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්, අනෙකුත් සෞඛ්‍ය ආයතන, පුහුණු ආයතන හා අංශ 11 ක 2017, 2018, 2019 යන වර්ෂ වලට අදාළව එකතුව රු. මිලියන 2.66 ක් පිරිවැය වූ භාණ්ඩ හා බදුල්ල පළාත් මහ රෝහලට අදාළ පිරිවැය සඳහන් නොකළ භාණ්ඩ පොත් වලින් කපා හැරීමට කටයුතු කර තිබුණි. නමුත් එම අපහරණය කළ භාණ්ඩවල පිරිවැය අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කලේද යන්න විගණනය වෙත තහවුරු කර නොතිබුණි.එසේම ඇතැම් රෝහල්වල අපහරණ කටයුතු අවසන් කර නොතිබුණු අවස්ථා, පත්කරණ ලද අපහරණ මණ්ඩල විසින් අදාළ අපහරණ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණු අවස්ථා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්ට අදාළ ඌණතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.	2020 වර්ෂයට අදාළව අපහරණය කළ භාණ්ඩවල පිරිවැය අතපසු වීමකින් සටහන් කිරීමට නොහැකි වූ අතර එම භාණ්ඩවල වටිනාකම රු. 79,800 ක් බව, එම අපහරණය කළ භාණ්ඩවල පිරිවැය අමාත්‍යාංශ මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කර නොමැති බව, 2015 වර්ෂයේ සිට මිළ දී ගන්නා ලද භාණ්ඩ සිගාස් දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති අතර මෙම අපහරණය කරන ලද භාණ්ඩ 2015 ට පෙර මිළ දී ගත් භාණ්ඩ බව.	ඉල්ලුම් කර ඇති තොරතුරු සියලුම ආයතන විසින් ලබාදිය යුතු අතර අපහරණය කළ වත්කම් වලට අදාළ නිවැරදි ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකළ යුතුය. එමෙන්ම සමීක්ෂණ මණ්ඩල වාර්තා ලැබීමෙන් පසු විෂමතා, ඌණතා සහ නැතිවීම් කිසිවක් වෙතොත් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව ක්‍රියා කළ යුතුය.
(xv)	ආයතන / රෝහල් හා අංශ 31 ක් වෙත 2020 හා 2021 වර්ෂ වලදී ලැබී තිබුණු රු. මිලියන 2,588.30 වටිනා භාණ්ඩ හා ආයතන / රෝහල් හා අංශ 30 ක් වෙත ලැබී තිබුණු වටිනාකම පිළිබඳ තොරතුරු ඇතුළත් නොවූ අවස්ථා 2057 කට අදාළ භාණ්ඩ විධිමත් පරිදි ලේඛනගත කර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.	වෙනත් ආයතන වලින් මාරුකරන ලද වත්කම් Transfer in යටතේ New-Cigas පද්ධතියේ වත්කම් මොඩියුලයට ඇතුළත් කළ යුතු බවට ප්‍රධාන මූල්‍ය නිළධාරී iii ගේ අත්සනින් යුක්තව නිකුත් කළ ලිපිය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින රෝහල් හා ආයතන දැනුවත් කර ඇති බව.	සියලුම පරිත්‍යාග නියමිත පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.
(xvi)	2023 දෙසැම්බර් 31දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව 2023 ජනවාරි 01 දිනට දේපළ, පිරියත හා උපකරණවල අගය රු. මිලියන 195,221.42 ක් විය. නමුත් භාණ්ඩාගාර මුද්‍රිත, මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශය (SA 80) හි 2023 ජනවාරි 01දිනට වූ ආරම්භක ශේෂය රු.මිලියන 200,118.27 ක් විය.	New-Cigas පද්ධතියේ දෝෂයක් හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබෙන අතර, එම වැරදි නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව.	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.
(xvii)	2022 වර්ෂයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල අගය රු. මිලියන 200,118.27 ක් වූ අතර 2023 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු එම වාර්තාවේ 2023 ජනවාරි 01 දිනට එම අගය රු. මිලියන 195,221.42 ක් විය. මේ අනුව රු.මිලියන 4,896.85 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම	**New-Cigas** පද්ධති 61ක තොරතුරු ඒකාබද්ධ කිරීමේදී තාක්ෂණික දෝෂ මත මෙවැනි තත්ත්ව ඇතිවන නමුත්, අදාළ දෝෂ හඳුනාගෙන නිවැරදි කිරීම සිදුවනුයේ අදාළ වර්ෂයට පසු වර්ෂයේදී බව, එසේ හඳුනාගෙන	-එම-

	වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.	නිවැරදි කළද, එය පොදුවේ නිකුත්කර ඇති පැරණි වර්ෂයන්ට අදාළ අවසන් වාර්තාවන්ට අදාළව සංශෝධනය කිරීමක් පද්ධතිය මඟින් සිදු කළ නොහැකි බව.	
(xviii)	2023 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 ට අනුව, 2023 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.මිලියන 11,605.50 ක් වුවද භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව සමාලෝචිත වර්ෂයේ වත්කම් මිලදී ගැනීම රු. මිලියන 3,698.37 ක් වූයෙන් වත්කම්වල පිරිවැය රු. මිලියන 7,907.13 ක් අඩුවෙන් දක්වා තිබුණි.	-එම-	-එම-
(xix)	අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු. මිලියන 204,292.96 ක් වුවද විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන 63 ක 2023 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව එම වත්කම්වල වටිනාකම රු. මිලියන 215,870.86 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. මිලියන 11,577.90 ක වෙනසක් නිරීක්ෂණය විය.	-එම-	-එම-
(xx)	2018 වර්ෂයෙන් පසු පේරාදෙණිය රෝහල් පරිශ්‍රයේ වකුගඩු ප්‍රතිකාර ඒකකයක සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ප්‍රතිපාදන යටතේ මහල් 03 කින් සමන්විත ශල්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදිකර තිබුණද මෙම ගොඩනැගිලිවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරු හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ තීරණය පරිදි දෙවන වටයේ තක්සේරු කිරීම් ආරම්භ කරන තෙක් පොරොත්තු ලේඛනයේ සිටීමට සිදුව ඇති බව, කෙසේ වෙතත් මෙම ගොඩනැගිලි තක්සේරු කිරීම් සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර ගෙන යන බව.	වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.
(xxi)	2023 දෙසැම්බර් 31 දිනට සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.මිලියන 204,292.96 ක් වුවද 2024 වර්ෂයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2024 ජනවාරි 01 දිනට එම අගය රු.මිලියන 263,472.20 ක් විය. මේ අනුව රු.මිලියන 59,179.24 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනසට හේතුව විගණනයේදී පැහැදිලි නොකෙරුණි.	හඳුනාගත නොහැකි පද්ධති දෝෂයක් හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබෙන අතර, 2023 වර්ෂයේ අවසන් ගිණුම් වලට අදාළ තොරතුරු නිසි පරිදි යාවත්කාලීන වී නොමැති බැවින් 2023 දෙසැම්බර් 31 දිනට අදාළ ශේෂ නිවැරදි නොවන බව, නමුත්, 2024 ජනවාරි 01 දිනට අදාළ ශේෂ 2024 දෙසැම්බර් 31 දින යොමුකළ තොරතුරු මත පදනම්ව සැකසෙන බැවින්, 2023 දෙසැම්බර් 31 දින	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

		ශේෂය හා 2024 ජනවාරි 01 අතර ශේෂයන් නොගැලපීම සිදුවී ඇති බව.	
(xxii)	අමාත්‍යාංශය හා ඊට අයත් ආයතනයන්හි 2023 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගනක මෘදු පිටපත් අනුව ව්‍යාපෘති 03 කට අදාළව පැවති රු.මිලියන1,857.48 ක් වූ මූල්‍ය නොවන වත්කම් 2024 වර්ෂයේ මෘදු පිටපත් අනුව ආරම්භක ශේෂ ලෙස අන්තර්ගත වී නොතිබුණි.	ව්‍යාපෘති ඇවරකිරීමෙන් පසු එහි ක්‍රියාත්මක **New-Cigas** පද්ධතියෙහි පවතින වත්කම් සඳහා ඊට පසු වර්ෂයේ අවසන් ගිණුම් වෙනුවෙන් යොමුකිරීමට නිළධාරියකු නොමැති වීම හේතුවෙන් මෙම තත්ත්වය පැනනැගී ඇති බව.	වැරදි නිවැරදි කර 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
(xxiii)	2024 වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 ට අනුව, 2024 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.මිලියන15,723.34 ක් වුවද භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව සමාලෝචිත වර්ෂයේ වත්කම් මිලදී ගැනීම රු.මිලියන10,713.70 ක් වූයෙන් වත්කම්වල පිරිවැය රු.මිලියන 5,009.64 ක් අඩුවෙන් දක්වා තිබුණි.	විශේෂයෙන් ව්‍යාපෘති හරහා ජනනය වන මූල්‍ය නොවන වත්කම් ව්‍යාපෘතිය අවසන් කරනු ලබන තෙක් ගිණුම්ගත කිරීමේ ගැටලු, සෞඛ්‍ය අමාත්‍යාංශයට පරිබාහිර ආයතන වෙතින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් දරනු ලබන වියදම් ගිණුම්ගත කිරීමේ ගැටලු, විනිමය අනුපාත වෙනස්වීමේ ගැටලු පවතින බව හඳුනාගෙන ඇති අතර, ඒවා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
(xxiv)	අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය රු. මිලියන 254,485.18 විය. විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන 61 ක 2024 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව වූ වත්කම්වල පිරිවැය රු.මිලියන 243,639.47 ක් විය. ඒ අනුව රු.මිලියන 10,845.71 ක වෙනසක් නිරීක්ෂණය විය.	-එම-	-එම-
(xxv)	කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර හා සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ තෙවන අතිරේක මූල්‍යකරණ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මගින් 2022 වර්ෂයේදී පිරිවැය රු. මිලියන 173.13 ක්වූ ලීටර් 6800 ක හිස් ඔක්සිජන් සිලින්ඩර් (Oxygen Cylinders) 3764ක් මිලදී ගෙන රෝහල් වෙත ලබා දී තිබුණද එම වත්කම්වල පිරිවැය අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	අදාළ තොරතුරු හඳුනාගනිමින් පවතින අතර, එම තොරතුරු හඳුනාගත් පසු පරීක්ෂාකර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියලුම මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කළ බව තහවුරුවන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.

(xxvi)	අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 02 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 46.44 ක මූල්‍ය නොවන වත්කම් පැවති අතර මෙම වත්කම් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති හරහා ජනනය වන මූල්‍ය නොවන වත්කම් ව්‍යාපෘතිය අවසන් කරනු ලබන තෙක් ගිණුම්ගත කිරීමේ ගැටලු, සෞඛ්‍ය අමාත්‍යාංශයට පරිබාහිර ආයතන වෙතින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් දරනු ලබන වියදම් ගිණුම්ගත කිරීමේ ගැටලු, විනිමය අනුපාත වෙනස්වීමේ ගැටලු පවතින බැවින් ඒවා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	-එම-
(xxvii)	නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහල 2023 වර්ෂයේදී මධ්‍යම රජයට පවරාගෙන තිබුණු අතර එහි පවතින සියලුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කළයුතු වුවත්, විගණනය වෙත ඉදිරිපත් කරන ලද නව CIGAS පරිගණක මෘදු පිටපත අනුව අනෙකුත් යන්ත්‍ර හා උපකරණ පිරිවැය රු. මිලියන 5.17 ක් පමණක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි.	වර්ෂයේ මිලට ගන්නා ලද වත්කම්, වත්කම් මොඩියුලය හරහා ගිණුම්ගත කිරීමටත් ඊට පෙර වර්ෂ වලදී මිලදීගත් හා ප්‍රදානයන් වශයෙන් ලද මූල්‍ය නොවන වත්කම් සඳහා අභ්‍යන්තර මිළ තක්සේරු කමිටුවක් හරහා මූල්‍ය වටිනාකම තක්සේරු කිරීමටත් එම තොරතුරු **New-Cigas** පද්ධතියට නිසි පරිදි ඇතුළත් කිරිමටත් උපදෙස් ලබාදී ඇති බව.	ගිණුම්ගත නොකළ සියලුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කරමින් 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
(xxviii)	2024 වර්ෂයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවෙහි (SA 82) ප්‍රවාහන උපකරණ යටතේ නැව් ලෙස සඳහන්ව රු.මිලියන 1.15 ක් දක්වා තිබුණු අතර ඉන් රු.382,440 ක් පමණක් මඩකලපුව ශික්ෂණ රෝහලට අයත් වත්කම් ලෙස පරිගණක මෘදු පිටපත තුළ අන්තර්ගතව තිබුණි. ඉතිරි රු. 764,880 ක ශේෂය කුමන ආයතනය සතු වත්කමක් ද යන්න විගණනය වෙත ඉදිරිපත් කරන ලද CIGAS මෘදුපිටපත මගින් තහවුරු නොවීය.	තොරතුරු විමසීම සිදු කර ඇති බව.	වත්කම් හඳුනාගෙන එය තහවුරුවන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.
(xxix)	විගණනය වෙත ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් රෝහල් /ආයතන 63 ක පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව රෝහල්/ ආයතන 27 ක ඉඩම් මෙන්ම රෝහල්/ ආයතන 04 ක ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා	රෝහල් ඉඩම් සම්බන්ධ ඇතැම් තොරතුරු විවිධ නොවැළැක්විය හැකි හේතුන්මත සොයාගත නොහැකි තත්ත්වයක් හඳුනාගෙන ඇති බව, එම තොරතුරු හඳුනාගත් විගස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර අවසන් කිරීමට කටයුතු කරන බව.	කඩිනමින් මෙම වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමටත් ඒ බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය.

	ඊට අයත් රෝහල් /ආයතන 61 ක 2024 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව රෝහල් 05 ක ඉඩම් මෙන්ම එක් රෝහලක ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර ගිණුම්ගත වූ තොරතුරුවල නිවැරදි බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.		
(xxx)	රිජ්වේ ආර්යා ළමා රෝහලට පරිත්‍යාග ලෙස ලැබුණු පිරිවැය/ වටිනාකම නිසි පරිදි තක්සේරු නොකළ උපකරණ/ භාණ්ඩ වර්ග 97 කට අයත් ඒකක 237 ක පිරිවැය/ වටිනාකම හා පිරිවැය/ වටිනාකම තක්සේරු කරන ලද උපකරණ/ භාණ්ඩ වර්ග 07 කට අයත් මුළු පිරිවැය/ වටිනාකම රු.2,219,825 ක් වූ ඒකක 20 ක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	පරිත්‍යාග වට්ටෝරු ගත කිරිමේදී වටිනාකම නිසි පරිදි තක්සේරු නොකිරිම නිසා **Cigas** ගිණුම් පද්ධතියට පරිත්‍යාග ඇතුළත් කිරීමට නොහැකි වී ඇති බව, නිසි පරිදි වටිනාකම තක්සේරු කිරීමෙන් අනතුරුව එම පරිත්‍යාග **Cigas** පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත නොකළ සියලුම පරිත්‍යාග තක්සේරුකර ගිණුම්ගත කර 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

(ආ) විගණන සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුළු පිරිවැය රු.මිලියන 254,485.18ක් වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳව විස්තරාත්මක උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා සහ CIGAS වැඩසටහන අනුව දැක්වෙන වත්කම් පිළිබඳ තොරතුරු, ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් ශේෂයට ගැලපීම් කර තිබුණු රු.මිලියන 2.46ක මුදලට, සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් මිළදී ගැනීම් ලෙස ගිණුම්ගත කර තිබුණු රු. මිලියන 10,713.70 කට අදාළව මෙන්ම රු. මිලියන 19,703.18 ක වත්කම් අපහරණයන්වලට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණු බැවින් එම අගයන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. ස්ථාන මාරුවී ගිය, වැඩ තහනමට ලක් වූ, සේවය අතහැර ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 62 දෙනෙකුගෙන් අයවීමට තිබුණු රු. මිලියන12.71 කට අදාළ දේපල/ වාහන ණය ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. අමාත්‍යාංශය සතු වාහන උපයෝජනය පිළිබඳ කාර්යසාධනය ඇගයීම සඳහා අවශ්‍ය 2021, 2022 , 2023 හා වර්ෂ තුනට අදාළ තොරතුරුද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර ඊට අමතරව විවිධ කාරණා සම්බන්ධයෙන් තොරතුරු කැඳවීම් ලිපි 36 කින් කැඳවූ විගණනය සඳහා අවශ්‍ය තොරතුරු 2024 අප්‍රේල් 11 දින වන විටත් ඉදිරිපත් නොකිරීම හෝ සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් නොකිරීම හෝ හේතුවෙන් අදාළ ක්ෂේත්‍ර නිසි ලෙස විගණනය කළ	මේ වන විටත් ඉදිරිපත් නොකරන ලද දේපල හා වාහන ණයවලට අදාළ ලිපිගොනු පිළිබඳ විශේෂ අභ්‍යන්තර විගණනයක් සිදු කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව, 2021 හා 2022 වර්ෂ වලට අදාළ තොරතුරු අමාත්‍යාංශය යටතේ පවතින සියලුම රෝහල් ආයතන සහ ව්‍යාපෘති මඟින් ලබාගෙන ඉදිරිපත් කළ යුතුව ඇති බැවින් සහ දීර්ඝ කාලයක් ගත වී ඇති බැවින් අදාළ තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවයක් පවතින බව, නිල ප්‍රවාහන කටයුතු සඳහා තම පෞද්ගලික වාහන භාවිතය වෙනුවෙන් ප්‍රවාහන හා ඉන්ධන දීමනා ගෙවීමට අදාළ 2021, 2022, 2023 වර්ෂවල තොරතුරු කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 42 (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

නොහැකි විය. ඇතැම් තොරතුරු කැඳවීමේ ලිපි නිකුත්කර මාස 40 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	**ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය**	**මෙම වාර්තාවේ ඡේද යොමුව**	
1.6.1(අ),(ආ),(ඇ)	මෙම වැරදි නිවැරදි කර ඊළඟ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (අ)	(i)(ii)(iii)
1.6.1(ඈ) ,(ඉ),(ඊ)	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර ඊළඟ වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1(අ(	(iv)(v) (vi)
1.6.1(උ)	ගිණුම්ගත නොකළ සියළුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කරමින් ඊළඟ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (අ)	(vii)
1.6.1(ඌ)	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියළුම වත්කම් ගිණුම් ගත කළ බව තහවුරු කරන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (අ)	(viii)
1.6.1(එ) ,(ඒ)	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර ඊළඟ වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1(අ(	(ix)(x)
1.6.1(ඔ)	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියළුම වත්කම් ගිණුම් ගත කළ බව තහවුරුවන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (අ)	(xi)
1.6.1(ඕ)	කඩිනමින් මෙම වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (අ)	(xii)
1.6.1(ක)	මෙම වරද නිවැරදි කර ඒ බව විගණනයට තහවුරු කළ යුතුය.	1.6.1 (අ)	(xiii)
1.6.1(ග)	විගණනය විසින් ඉල්ලුම් කර ඇති තොරතුරු සියළුම ආයතන විසින් ලබාදිය යුතු අතර අපහරණය කළ වත්කම් වලට අදාල නිවැරදි ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකළ යුතුය.එමෙන්ම සමීක්ෂණ මණ්ඩල වාර්තා ලැබීමෙන් පසු විෂමතා, ඌණතා සහ නැතිවීම් කිසිවක් වෙතොත් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව ක්‍රියා කළ යුතුය.	1.6.1 (අ)	(xiv)
1.6.1(ච)	සියළුම පරිත්‍යාග නියමිත පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (අ)	(xv)
1.6.1(ඡ),(ජ),(ට), (ඨ)	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය	1.6.1 (අ)	(xvi) (xvii) (xviii) (xix)
1.6.1 (ත)	ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය	1.6.1 (අ)	(xx)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු අතර විස්තර පහත පරිදි විය.		
(අ) 2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් පුනරාවර්තන වැය විෂයයන් 2 ක් සඳහා සලසා ගෙන තිබුණු රු. මිලියන 34 ක් වූ මුළු ප්‍රතිපාදනයම, මුදල් රෙගුලාසි 66 හා 69 මගින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.	අමාත්‍යාංශය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කුලී පදනම මත වාහන සඳහා නැවත ගිවිසුම් අළුත්කර ගැනිමේ අපේක්ෂාවෙන් 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තුවට ප්‍රතිපාදන ඇතුළත් කරන ලද බව, නමුත් ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව කටයුතු කිරිම නිසා කල් බදු පදනම මත වාහන ලබා නොගැනිම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වූ බව.	විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.
(ආ) 2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් පිළිවෙලින් පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 8 ක් හා 3 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.මිලියන 10,115.50 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන්, සියයට 65ත් සියයට 97 ත් අතර ප්‍රතිශතයකින් මුදල් රෙගුලාසි 66 හා 69 මගින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.	කෙටුම්පත් ඇස්තමේන්තුව මඟින් ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදනයම භාණ්ඩාගාරය විසින් ලබා නොදිම නිසා එම වැය විෂයයන්වලට ප්‍රතිපාදන අවශ්‍ය වන බව, මහාභාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන ඉල්ලුම් කළද, පවතින ආර්ථික අර්බුදකාරි තත්ත්වය හේතුවෙන් රේඛිය අමාත්‍යාංශයට වෙන්ව ඇති ප්‍රතිපාදනය තුළ කළමනාකරණය කර ගන්නා ලෙස දන්වා ඇති බව, මෙම හේතුව නිසා වැය විෂයයන්හි ප්‍රතිපාදනයන් මුදල් රෙගුලාසි 66 මඟින් අත්‍යවශ්‍ය වැය විෂයයන් සඳහා මාරු කර ගත් බව.	-එම-
(ඇ) 2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 10 ක් 3 ක් සඳහා සලසා ගෙන තිබුණු පිළිවෙලින් රු.මිලියන 2,132.70 ක් රු.මිලියන 24 ක් වශයෙන් එකතුව මිලියන රු. 2,156.70 ක් වූ ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තු මඟින් හා මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මඟින් පිළිවෙලින් රු. මිලියන 18.995	2024 අයවැය යෝජනාව අනුව රාජ්‍ය සේවයේ වැඩිවූ ජීවන වියදම් දිමනාව ගෙවිම සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා ගන්නා ලද බව, නමුත් සිදුවූ දේශපාලන වෙනස්විම හේතුවෙන් කාර්යය මණ්ඩල වෙනස්විම මත මෙම	-එම-

	ක් හා රු.මිලියන 8,974.97 ක් ලෙස සියයට 100 සිට සියයට 3557 දක්වා ප්‍රතිශතයන්ගෙන් වැඩි කර ගෙන තිබුණි.	ප්‍රතිපාදනයෙහි ඉතිරි වීමක් සිදු වූ බව, කෙටුම්පත් ඇස්තමේන්තුව මඟින් අත්‍යවශ්‍ය වැය විෂයයන් සඳහා ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදනය නොලැබීම නිසා ප්‍රතිපාදන වැඩි කර ගැනීමට සිදු වූ බව, ජපන් ඉන්ධන ආධාර තොගය ගිණුම් ගත කිරීම සඳහා පාර්ලිමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන ලබා දුන් බව.	
(ඇ)	පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් පිළිවෙලින් 7 ක් හා 21 ක් ඇතුළුව වැය විෂයයන් 28 ක් සඳහා සලසා ගෙන තිබුණු එකතුව රු.මිලියන 9,385.40 ක මූලික ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.	වරින් වර සිදුවූ දේශපාලන වෙනස් වීම නිසා නිල ඇඳුම් හිමි නිලධාරින් නොමැතිවීම, අමාත්‍ය කාර්යාලය සඳහා නියමිත වූ වාහන නොමැති වීම, දේශීය වෛද්‍ය අංශය සෞඛ්‍ය අමාත්‍යායට අයත් ගොඩනැගිල්ලක ස්ථාපිතව ඇති බැවින් එම ගොඩනැගිල්ලේ ජලය, විදුලිය, පිරිසිදු කිරීම් හා ආරක්ෂක කටයුතු සිදු වන්නේ මෙම අමාත්‍යාංශය මඟින් බව, සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පවුල් සෞඛ්‍ය) විශ්‍රාම යෑම හේතුවෙන් එම ප්‍රතිපාදනයද ඉතිරි වූ බව.	-එම-
(ඉ)	මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 48 ක් හා 18 ක් සඳහා සලසාගෙන තිබුණු රු.මිලියන 49,134.28 ක්වූ මූලික ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,536.81ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුව ඉතිරි රු.මිලියන 47,597.47ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 33,271.33ක ප්‍රතිපාදන උපයෝජනයට ගෙන නොතිබුණි. එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 99 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 ට අනුව වියදම් කළමනාකරණයට උපදෙස් ලබා දෙන ලද බව, , ආයතනය සතු සියලුම වාහන රක්ෂණය කිරීමෙන් පසුව මෙම ප්‍රතිපාදනය ඉතිරිවිම, 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කරන විට ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධාරින් 05දෙනෙකු සිටිය අතර, එයින් නිලධාරින් 03දෙනෙකු ඖෂධ වංචාව යටතේ බන්ධනාගාරගත වීම, යනාදී හේතුන් නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වි ඇති බව.	-එම-
(ඊ)	පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 5ක් හා 4 ක් ලෙස වැය විෂයයන් 9 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් සලසා ගෙන තිබුණු රු.මිලියන 344.92 ක් වූ අතිරේක ප්‍රතිපාදනයන්ගෙන් රු. මිලියන 280.65ක් ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිවීම්වල ප්‍රතිශතය අතිරේක ප්‍රතිපාදනයෙන් සියයට 45 ත්	සිදුවූ දේශපාලන වෙනස් වීම නිසා රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි වූ අතර අමාත්‍ය කාර්යාලය සඳහා වෙන් කර ගත් ප්‍රතිපාදන ඉතිරි වූ බව, පිරිසිදු කිරීම් සඳහා වැය විෂයයට ප්‍රතිපාදන සලසා ගත්තද	-එම-

	98 ත් අතර පරාසයක පැවතුණි.	නොවැම්බර් හා දෙසැම්බර් පිරිසිදු කිරීමේ බිල්පත් 2024 දෙසැම්බර් 31 දිනට නොලැබීම නිසා ගෙවීම් කිරීමට නොහැකි වූ බව, එම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව.	

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුල්‍ය ප්‍රකාශන අනුව අමාත්‍යාංශයට අයත් ආයතන විසින් මෙහෙයුම් වැඩසටහනට අදාළව වැය විෂයයන් **34** කට ලබාදී තිබුණු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා රු.මිලියන 2,616.17 ක් බැරකම් වලට එළඹී තිබුණි.	සෞඛ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමේදී පවතින ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කිරීම ප්‍රායෝගිකව අපහසු බව, කෙසේ නමුත් මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇති කර නොගන්නා ලෙසට සියලු සෞඛ්‍ය ආයතනවල ප්‍රධානින් නිරන්තරයෙන් දැනුවත් කර ඇති බව.	මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් හෝ අළුතින් ඇතිකරන ලද වැය විෂයයන් හෝ නොවන, මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් යටතේ වැය විෂයයන් 7 ක් වෙනුවෙන් එකතුව රු.මිලියන 5,469.26 ක් වූ බැරකම් දක්වා තිබුණි.	ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවන පරිදි කටයුතු කිරීමට අදාළ විෂය නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බව.	බැඳීම් හා බැරකම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට පැවති බැරකම රු. මිලියන 1,096.53 ක් වූ අතර රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට කිසිදු බැරකමක් නොමැති ලෙස දක්වා තිබුණි. නමුත් එම ආයතන දෙකෙහි 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල පිළිවෙලින් රු. මිලියන 38,317.97 ක් හා රු. මිලියන 1,777.45 ක් වුයෙන් පිළිවෙලින් රු. මිලියන 37,221.44 ක හා රු. මිලියන 1,777.45 ක වෙනසක් නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වෛද්‍ය සැපයීම් අංශය විසින් ගෙවිය යුතු වටිනාකම් පිළිබඳව වෛද්‍ය සැපයිම් අංශය වෙතින් විමසා ඇති බව, වෛද්‍ය සැපයිම් අංශය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් ලබාගත් ඖෂධ සමඟ සැසඳිම් සිදු කරමින් පවතින අතර එම සැසඳිම් අවසන් වන තුරු එම වටිනාකම පිළිබඳව නිශ්චිතවම අදහසක් ඉදිරිපත් කළ නොහැකි බව.	-එම-
(ඈ)	විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් මිලදිගත් ජීව වෛද්‍ය උපකරණ වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 346.50 ක් ගෙවිය යුතු ශේෂ පැවතියද, 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ එම අගය බැරකම් ලෙස දක්වා නොතිබුණි.	අඩුපාඩු සිදු නොවීමට වග බලා ගන්නා ලෙස අදාළ නිලධාරින් දැනුවත් කර ඇති බව .	-එම-

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණකාධිපතිට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දි නොතිබුණි.	විගණන විමසුම් සඳහා අමාත්‍යාංශය හා ඊට අදාළ අනෙකුත් රෝහල් හා ආයතන වෙත යොමුකර පැහැදිලි කිරීම් ලබාගත යුතු අතර එලෙස පිළිතුරු ගෙන්වා ගැනීමේදී යම් කාල පමාවක් සිදුවන බව.	සියලුම විගණන විමසුම් සඳහා නියමිත කාලයන් තුළ පිළිතුරු ඉදිරිපත් කළ යුතුය.

3.4 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ශ්‍රී ජයවර්ධනපුර රෝහල වෙත අවස්ථා 213 කදි වෛද්‍ය සැපයීම් හා ලිපිද්‍රව්‍ය අයිතමයන් 65 කට අයත් ඒකක 216,094 ක් නොමිලේ නිකුත් කර තිබුණු අතර මෙම අයිතමයන් නොමිලේ නිකුත් කිරීම සඳහා ලැබී ඇති විධිමත් අනුමැතිය/ අනුමැතින් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම කිසියම් ඖෂධයක් හෝ ශල්‍ය ද්‍රව්‍යයක් නොමිලේ නිකුත් කිරීමේදි එම ඖෂධය හෝ ශල්‍ය ද්‍රව්‍යය රෝගින්ට ගාස්තු අයකිරීමකින් තොරව නොමිලේ ලබාදෙන බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් අමාත්‍යාංශය සතුව නොමැති බව තහවුරු විය.	මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව, ඉදිරියේදී ප්‍රගතිය දක්වන බව.	විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු අතර විධිමත් අනුමැතියක් රහිත නිකුත් කිරීම් වලට අදාළ මුදල් අයකරගත යුතුය.
(ආ)	රෝගී නිරීක්ෂණ පාඨමාලා සඳහා පෞද්ගලික ආයතන 06 ක් විසින් ගාල්ල ජාතික රෝහලට යොමු කරනු ලබන විදේශිය සිසුන් වෙනුවෙන් රෝහලට ගෙවීම සඳහා එම පෞද්ගලික ආයතන විසින් සිසුන්ගෙන් අයකරනු ලැබූ ගාස්තු, රෝහලෙන් පරිබාහිර ස්වේච්ඡා සංවිධානයක් විසින් පරිපාලනය කරනු ලබන තත්ත්ව ප්‍රවර්ධන අරමුදල නැමැති අරමුදලකට බැරකර තිබුණි. 2020 සිට 2024 දක්වා කාලය තුළ එකතුව රු. මිලියන 32.52 ක්වූ මුදලක් මෙලෙස බැර වී තිබුණු අතර ඉන් එකතුව රු.මිලියන 31.88 ක වියදමක්ද එම අරමුදලින් දරා තිබුණි.	විදේශීය සිසුන්ට පහසුකම් සැලැසීමේ කටයුත්ත අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය එකඟතාවයන් ප්‍රකාශ කර තිබුණද ගාස්තු අය කිරීම සම්බන්ධව මාර්ගෝපදේශයන් ඉදිරිපත් කර නොමැති බව, එම නිසා විදේශීය සිසුන් ගෙන්වන ආයතන වෙතින් තත්ත්ව ප්‍රවර්ධන පදනම වෙත ලැබෙන පරිත්‍යාග ලෙස ලබාගෙන ඇති බව, එම පරිත්‍යාග මුදල්ද රෝහල් කටයුතු සඳහා යොදාගෙන ඇති බව.	අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතු අතර ලැබෙන සියළුම මුදල් රාජ්‍ය ආදායමට බැර කළ යුතුය.
(ඇ)	බදුල්ල ශික්ෂණ රෝහලේ ඉදිකරමින් පවතින දසමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා සහ ඉදිකිරීම් කටයුතුවල නිරත වන	ඉදිකිරීම් ආරම්භ කළ දින සිට 2024 අගෝස්තු 24 දින දක්වා රු. 7,500 බැගින් රු. 496,802 ක (බදු	අදාළ කරුණු සලකා බැලීමෙන් පසු රජයට අයවිය යුතු සියලු

	සේවකයින්ගේ පරිභෝජනයට අවශ්‍ය වූ ජලය ලබාගැනීම සඳහා රෝහල් පරිපාලනයේ අවසරයකින් තොරව, ව්‍යාපෘති ආරම්භ වූ 2020 ජනවාරි 30 දින සිට විගණිත දිනය වූ 2024 සැප්තැම්බර් 30 දක්වා රෝහල් නල පද්ධතියෙන් ජලය ලබාගැනීම තුළින් රජයට දැරීමට සිදු වූ මූල්‍ය අලාභය රු.506,100 ක් වී තිබුණි.	සහිත) අලාභයක් සිදුව ඇති බවට අදාළ සමාගමට දැනුම් දෙන ලද බව, ඒ අනුව, එම සමාගම විසින් ඉදි කිරීම් කටයුතු ආරම්භ කළ දින සිට යන කරුණ සඳහා නොඑකඟතාවය පෙන්වා දෙමින් ලිපියක් ඉදිරිපත් කරන ලද බව ,ඒ අනුව අදාළ සමාගම සමඟ සාකච්ඡා කර මුදල් අය කර ගැනීම සඳහා ක්‍රියා මාර්ග ගන්නා බව.	මුදල් කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළ යුතුය.
(ඇ)	කොළඹ ජාතික රෝහලේ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අවශ්‍ය බහාලුම් කොන්ත්‍රාත්කරු විසින් සපයා නොමැති තත්ත්වයක් තුළ ඒ පිළිබඳ සැලකිලිමත් නොවී 2017 ජනවාරි 01 දින සිට 2019 මාර්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ බැහැර කරන ලද සායනික අපද්‍රව්‍ය කි.ග්‍රෑ.1,012,139 ක් සඳහා කි.ග්‍රෑ 1කට රු.28.24 ක් ලෙස එකතුව රු මිලියන 28.58 ක බහාලුම් ගාස්තුද ඇතුළත් කරමින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් සිදුකර තිබුණි. එසේම 2019 අප්‍රේල් 01 දින සිට 2022 ජූලි 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සායනික අපද්‍රව්‍ය කි.ග්‍රෑ. 2,628,815 ක් බැහැර කිරීමට අදාළව කි.ග්‍රෑ. 1 ක් සඳහා රු.3.81 බැගින් රු. මිලියන 10.01 ක බහාලුම් ගාස්තුව ද ඇතුළත් කර ගෙවීම් සිදුකර තිබුණි. මෙම වැඩිපුර ගෙවූ බහාලුම් ගාස්තු පිරිවැය නැවත අයකර ගැනීම සඳහා ගණනය කිරීමේදී රු. මිලියන 10.38 ක මුදලක් අඩුවෙන් ගණනය කර තිබුණි. එසේම විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2019 අප්‍රේල් 01 දින සිට 2022 ජූලි 31 දින දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව පමණක් සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා රෝහල විසින් මිලදී ගන්නා ලද බහාලුම් සඳහා රු. මිලියන 44.28 ක මුදලක් වැය කර තිබුණද එම කාලයට අදාළව කොන්ත්‍රාත්කරුගෙන් රු. මිලියන 5.01 ක මුදලක් පමණක් අයකර ගැනීමට ගණනයන් සිදුකිරීම හේතුවෙන් තවදුරටත් එම කාලයට අදාළව රු. මිලියන 39.26 ක මුදලක් රජයට අයකර ගත යුතුව පැවතුණි.	වැඩිපුර ගෙවූ මුදල මේ වන විට අයකර ඇති බව.	වැඩිපුර ගෙවූ මුදල් අයකරගැනීම් පිළිබඳව විගණනයට සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය
(ඉ)	රජයේ රෝහල් වලින් පුරවැසියන් සඳහා සලසන ගෙවන වාට්ටු පහසුකම් සහ ශ්‍රී ලාංකික නොවන අය සඳහා වන සෞඛ්‍ය සේවාවන් සඳහා ගාස්තු අනුමත කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යතුමාගේ 2023 අප්‍රේල් 10 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2.1 ඡේදය අනුව දැනට පවතින අයකිරීම් යාන්ත්‍රණය යල්පැන ගොස් ඇති	මේ සඳහා කමිටුවක් පත්කර ඇති අතර කමිටු නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.	සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු චක්‍රලේඛ උපදෙස් අනුව හා අවම වශයෙන් දරනු ලබන පිරිවැය ආවරණය වන පරිදි

	බවත්, සපයනු ලබන සේවාවන් සඳහා දරන පිරිවැය සහ අයකර ගැනීම අතර පැහැදිලි නොගැලපීමක් ඇති බව නිරීක්ෂණය වී ඇති බවත්, එම සංදේශයේ 2.2 ඡේදය අනුව ගාස්තු සංශෝධනය කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීමේ අවශ්‍යතාවයක් පවතින බවත්, මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ කමිටුවක් පත් කර යෝජිත ක්‍රමය ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරෙන බවත් දක්වා තිබුණද ඊට අනුකූල වෙමින් අවම පිරිවැය හෝ ආවරණය කර ගැනීමේ ගාස්තු ක්‍රමවේදයක් 2025 අප්‍රේල් 01 වන විටද සිදුකර නොමැති බව කොළඹ ජාතික රෝහලෙහි ගෙවන වාට්ටු සඳහා ගාස්තු අයකිරීම් සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී නිරීක්ෂණය විය.		සංශෝධනය කළ යුතුය.
(ඊ)	මහනුවර ජාතික රෝහලෙහි රු. මිලියන 64 කට වඩා අධික අගයක් පවතින ජීව වෛද්‍ය උපකරණ 06 විධිමත් ගිවිසුම්ගත වීමකින් තොරව අලුත්වැඩියාවක් වෙනුවෙන් බාහිර නියෝජිත ආයතනය වෙත ලබාදී තිබුණි. එම උපකරණ 2024 සැප්තැම්බර් 19 දින වන විට රෝහලෙන් පිටතට රැගෙන ගොස් මාස 01 සිට 18 දක්වා කාලයක් ගතවන තුරු අලුත්වැඩියා කර රෝහලට ලබා දී නොතිබුණු අතර එයින් උපකරණ 04 ක් සඳහා එම නියෝජිත ආයතනය විසින් රු. 10,254,110 ක අලුත්වැඩියා ගාස්තුවක් අයකර තිබුණු අතර තවත් රුපියල් මිලියන 16 කට ආසන්න වටිනාකමක් සහිත උපකරණ 02 ක් සඳහා රු. 11,254,840 ක ඇස්තමේන්තුවක් ලබාදී තිබුණි. කෙසේ නමුත් එලෙස නියෝජිත ආයතන වෙත ලබාදී ඇති උපකරණ අලුත්වැඩියාව සම්බන්ධ පසුවිපරම් හෝ අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.	අත්සන් කර ඇති වාර්ෂික නඩත්තු හා සේවා ගිවිසුම් පිටපත් ලබා දෙන මෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු) වෙත දන්වා ඇති බව, මේ දක්වා ගිවිසුම් පිටපත් හෝ ගිවිසුම් ගත වී නොමැති බවක් හෝ දන්වා නොමැති බව, ජීව වෛද්‍ය උපකරණ අලුත්වැඩියාවට යොමු කිරීමේදී හා ඉන් පසු ප්‍රගතිය නිරන්තර පසු විපරම් කිරීමෙන් එහි කටයුතු අධීක්ෂණය කිරීම ජීව වෛද්‍ය ඉංජිනේරු හා එම කාර්ය මණ්ඩලය මෙන්ම අංශභාර හෙද සොයුරු විසින් සිදු කර ඇති බව, අදාළ උපකරණ අලුත්වැඩියා සිදු කිරීමේදී අමතර කොටස් මව් රටින් ගෙන්වන අතර රේගු නිශ්කාෂණ ක්‍රියාවලියේ ගැටළු සහගත තත්ත්වයන් නිසා ප්‍රමාද වන බව අදාළ ආයතන දන්වා සිටින බව.	අලුත්වැඩියාවන් වෙනුවෙන් ආයතන සමඟ විධිමත්ව ගිවිසුම්ගත වීමටත් ඒ පිළිබඳව පසුවිපරම් කර කඩිනමින් කාර්ය ඉටුකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(උ)	සිරිමාවෝ බණ්ඩාරණායක විශේෂිත ළමා රෝහල තුළ 2005 වර්ෂයේ ස්ථාපිත කර ඇති MRI ස්කෑන් යන්ත්‍රය 2018 වර්ෂයේ සිලින්ඩරයක් වැදීම හේතුවෙන් රු. 15,812,500 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණි. එම අලුත්වැඩියාවෙන් දින 05 කට පසු එම යන්ත්‍රය අලුත්වැඩියා කළ නොහැකි පරිදි ක්‍රියාවිරහිත වී තිබීම සම්බන්ධයෙන් රෝහල විසින් පරස්පර අදහස් ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. එසේම අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පැවති මෙම යන්ත්‍රය සම්බන්ධයෙන් පසුගිය කාලයකට	මෙම අලුත්වැඩියා කටයුත්ත හා නඩත්තු හා සේවා ගිවිසුමට එළඹ ඇත්තේ අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් බව, විධිමත් විනය පරීක්ෂණය අමාත්‍යාංශය මගින් පත්කළ කමිටුව විසින් සිදුකර ඇත. ඒ අනුව දිනක වැටුප අයකරන ලෙස විනය නියෝග පනවා ඇති බව, එම විනය නියෝගය අනුව අයකර වාර්තා කිරීම සිදු කර ඇති බව, එම විනය නියෝගයට අභියාචනා	වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් නොසැලකිළිමත්ව කටයුතු නොකළ යුතුය.

අදාළව 2019 මාර්තු 18 දින සේවා ගිවිසුමකට එළඹ ඒ සඳහා රු. 3,632,720 ක් සේවා ගාස්තුවක් සමාගමකට ගෙවා තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් යන්ත්‍රය යථා තත්ත්වයට පත්කර නොතිබුණි.	කිරීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් විනය නියෝගය සංශෝධනය කර ඇති බව, ඒ අනුව අයකළ දිනක වැටුප නැවත ගෙවීම් කර ඇති බව, මීට අමතර වශයෙන් මේ සම්බන්ධ පරීක්ෂණයක් අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාවෙන් සිදු කර ගෙන යනු ලබන බව, තවද මෙම යන්ත්‍රය අපහරණය කිරීම සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයෙන් කමිටුවක් පත් කර ඇති බව.	
(ඌ) වෛද්‍ය සැපයීම් අංශය විසින් තත්ත්වයෙන් අසමත් ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය හා රසායනාගාර ද්‍රව්‍ය අපහරණය කිරීම වෙනුවෙන් 2023 හා 2024 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 109.75 ක් හා රු.මිලියන13.49 ක් ඇතුළුව රු.මිලියන 123.24 ක් පුද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i) වෛද්‍ය සැපයීම් අංශය විසින් මෙම වියදම් සඳහා 2023 වාර්ෂික ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හෝ ඒ සඳහා මුදල් රෙගුලාසි 68 අනුව නව වැය විෂයයක් ඇති කිරීමටද කටයුතු කර නොතිබුණි. ඒ අනුව අපහරණ වියදම් ඔක්සිජන් ප්‍රතික්‍රියක හා පරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම් වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	වියදම් දැරීමට පෙර වාර්ෂික ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන සලසාගැනීමට හෝ මුදල් රෙගුලාසි අනුව නව වැය විෂයයක් ඇති කිරීමට කටයුතු කළ යුතුය.
(ii) මීට අදාළව 2022 අගෝස්තු 25 දින මිල ගණන් කැඳවීමක් සිදුකර තිබුණද මිල ගණන් ඉදිරිපත් කළ එක් සමාගමක් විසින් 2018 ජුනි 26 දින සිට වසර 10 ක් දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශය, එම පුද්ගලික සමාගම සහ මධ්‍යම පරිසර අධිකාරිය අතර ත්‍රෛයිපාර්ශවීය ගිවිසුමක් ක්‍රියාත්මක වන බව දන්වා තිබීම පදනම් කරගෙන එම ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව අපහරණ කටයුතු සිදුකර ගැනීම සුදුසු බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තීරණය කර තිබුණි. තත්ත්වයෙන් අසමත් අභාවිත ශල්‍ය ද්‍රව්‍ය හා රසායනාගාර අයිතම කිලෝ ග්‍රෑම් එකක් සඳහා ගිවිසුමේ සඳහන් මුදල (රු.260) ගෙවීමටත් රජයේ වාහන නොමැති අවස්ථාවලදී පමණක් බස්නාහිර, මධ්‍යම සහ දකුණු පළාත් හැර අනෙකුත්	-එම-	තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව ගිවිසුමේ විෂය පථය හා අදාළ කරගත යුතු කරුණු පරීක්ෂා කිරීමකින් තොරව අනුමැතීන් ලබාදීම තුළින් වගකීම් පැහැර හැරීම පිළිබඳව විමර්ශණය කර විගණනයට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

	පළාත් සඳහා කිලෝ මීටරයට රු.200 ක් හෝ ගිවිසුමේ සඳහන් මුදල යන දෙකින් අඩු මුදල ගෙවීමටත් අනුමැතිය ලබා දී තිබුණි. මේ අනුව අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුගේ කිලෝ ග්‍රෑමයකට රු.99.84 වෙනුවට ගිවිසුම්ගත වටිනාකම වූ කිලෝ ග්‍රෑමයකට රු.260 බැගින් ගෙවීමට එකඟ වී තිබුණි. එහිදී ගිවිසුමෙන් ආවරණය වන පළාත්වලින් බැහැරව අනෙකුත් පළාත්වල සායනික අපද්‍රව්‍ය අපහරණය සඳහා ඕස්ට්‍රේලියානු ව්‍යාපෘතියක් මගින් ගෙන්වන ලද යන්ත්‍ර උපයෝගී කර ගැනීම පිළිබඳව හෝ අනෙකුත් පළාත් සඳහා ලංසු කැඳවීමකින් තොරව හා ගිවිසුමේ විෂය පථය පරීක්ෂා කිරීමකින් තොරව තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව අදාළ අනුමැතීන් ලබා දී තිබුණි.		
(iii)	මේ අනුව ත්‍රෛයිපාර්ශවීය ගිවිසුමේ III (a) ඡේදය ප්‍රකාරව බස්නාහිර, මධ්‍යම සහ දකුණු පළාත්වල සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වල සායනික අපද්‍රව්‍ය සහ ගිවිසුමේ A-2 ලැයිස්තුව යටතේ ලැයිස්තුගත කර ඇති සියලුම පළාත්වල රෝහල්වලින් එකතුවන සයිටොටොක්සික් (Cytotoxic) අපද්‍රව්‍ය ආවරණය කරන නමුත් ඊට පටහැනිව වෛද්‍ය සැපයීම් අංශය විසින් බස්නාහිර, දකුණ සහ මධ්‍යම පළාත්වල හැර අනෙකුත් පළාත්වල සායනික අපද්‍රව්‍ය අපහරණ කටයුතුද අවස්ථා 33කදී පුද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. ඒ අනුව කිලෝග්‍රෑම් 208,520 ක් අපහරණය සඳහා රු.62,430,286 ගෙවීම් සිදුකර තිබුණු අතර එහිදී එම අපද්‍රව්‍ය සයිටොටොක්සික් හෝ සයිටොටොක්සික් නොවන ලෙස වර්ග කිරීමක් සිදුකර නොතිබුණි. එහෙත් එම සමාගම විසින් ලබාදී ඇති Clinical Waste Collection Document අනුව මින් ආයතන 18 ක අපද්‍රව්‍ය වර්ග කල් ඉකුත්වූ ඖෂධ ලෙස දක්වා තිබුණි.	-එම-	රජයට අවම පිරිවැයක් වන ලෙස තීරණ නොගැනීම පිළිබඳව විමර්ශනය කර වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(iv)	2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 3 (ආ) අනුව ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන බැහැර කිරීම හා සම්බන්ධ සියලු කාරණා සඳහා මධ්‍යම නියාමක ලෙස කටයුතු කිරීම අධිකාරියේ ප්‍රධාන අරමුණක් වන	මෙම ක්‍රියාවලියේදී අපහරණය සිදු කලේ එම අධිකාරිය මඟින් ඉවත් කිරීමට නියම කරන ලද වෛද්‍ය සැපයීම් බව, මෙම ක්‍රියාවලිය සිදු කරන ලද්දේ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් වීම මත එයින්	2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය.

අතර ඊට අනුකූලව ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් කල් ඉකුත් වූ සහ අනවශ්‍ය ඖෂධ බැහැර කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ මාලාවක් 2021 පෙබරවාරි 01 දින නිකුත් කර තිබුණි. ඒ අනුව ඖෂධ බැහැර කිරීම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ බලයලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතු අතර, බැහැර කිරීමට පෙර අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු විය. එහෙත් වෛද්‍ය සැපයීම් අංශය විසින් ඖෂධ අපහරණය සිදු කිරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව එම කටයුතු සිදුකර තිබුණු අතර ඒ වෙනුවට එක් එක් ආයතනවල අපහරණයන් සඳහා දින වෙන් කිරීමේ ලිපිවල පිටපත් සහ අපහරණයන් සිදු කිරීමෙන් පසුව ඊට අදාළ විස්තර ඇතුළත් බැහැර කිරීමේ සහතික (Destruction Certificates) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි වෙත යොමු කර තිබුණි.	බැහැර වීම එම අධිකාරියේ ද එකඟත්වය මත සිදුකරන ලද්දක් බව, ඒ අනුව පනතේ අවශ්‍යතාව සැපිරීම මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය නොවූ අතර ඒ සඳහා අවශ්‍ය අවසරය ඖෂධ නියාමන අධිකාරිය මඟින් අපහරණ කටයුතු සිදු කළ ආයතනයට ලබා දී ඇති බව, ඒ අනුව අපහරණය කළ වෛද්‍ය සැපයීම් පිළිබඳ විස්තර ඔවුන් වෙත ලබා දී ඇති අතර ඔවුන් ඒවා එකඟ වූ පරිදි භාරගෙන ඇති බව.

3.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තොරතුරු) ලෙස කටයුතු කරන වෛද්‍ය නිලධාරියා විසින් විදේශ ගමන් බලපත්‍ර දෙකක් භාවිතා කරමින් සිදුකරන ලද විදේශ ගමන් පිළිබඳව ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු සමඟ නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුව පරීක්ෂා කිරීමේදී නිලධාරියාගේ 2013 ජනවාරි 21 දින සිට 2024 ජූලි 12 දින දක්වා වූ විදේශ ගමන් 18 ක් සඳහා ලබාගත් අනුමැතීන් ඔහුගේ පුද්ගලික ලිපිගොනුවේ ඇතුළත් නොවීය. නිලධාරියාට 2015 නොවැම්බර් 27 සිට 2015 දෙසැම්බර් 07 දක්වා නිවාඩුව අනුමත කර තිබුණද , නිලධාරියා රෝගී තත්ත්වයක් හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණ 2015 දෙසැම්බර් 03 දින නැවත සේවයට වාර්තා කළ බැවින් නිවාඩුව 2015 නොවැම්බර් 27 සිට 2015 දෙසැම්බර් 03 ලෙස සංශෝධනය කර අනුමත කර තිබුණි. නමුත් නිලධාරියා සත්‍ය ලෙස ශ්‍රී ලංකාවට පැමිණ තිබුණේ 2015 නොවැම්බර් 27 දින විය. තවද නිලධාරියාට අනුමත කරන ලද විදේශ නිවාඩුව ආරම්භ වන දිනට පෙර විදේශ	පිළිතුරු ඉදිරිපත් කර නැත.	පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

	ගතවූ අවස්ථාවන් හා නිවාඩුව අවසන් වන දිනට පසුව ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථා 20 ක් නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම් සඳහා විධිමත් අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.		
(ආ)	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට අයත් අංක PD-0736 දරන වාහනයේ ලොග් සටහන් පොතට අනුව 2023 මාර්තු 04 දින රු. 245,741.57 ක් පිරිවැය වූ **Ferentino** වර්ගයේ ටයර් 04 ක් වාහනයට ලබාදී තිබුණි. 2024 මාර්තු 19 දින ටයර් 04 ක් ලබාදෙන ලෙස රියදුරු විසින් ඉල්ලීමක් කර තිබුණු අතර අධ්‍යක්ෂ (ප්‍රවාහන) විසින් එය අනුමත කර තිබුණි. වාහනයේ ලොග් සටහන් පොතට අනුව 2024 සැප්තැම්බර් 30 දින (දිනය 2024 සැප්තැම්බර් 30 ද 2024 අප්‍රේල් 30 ද යන්න පැහැදිලි නැත) රු. 193,520 ක් පිරිවැය වූ Farroad වර්ගයේ ටයර් 04 ක් වාහනයට ලබාදී තිබුණි. මෙම ටයර් මිලදී ගැනීමට අදාළව ලබාදී තිබුණු 2024 අප්‍රේල් 30 දිනැති මිලදීගැනීම් බිල්පතෙහි 2024 ජුනි 25 දින ගබඩාවට ටයර් ලැබුණු බවට තොග සහතිකයක් ඇතුළත් විය. මේ සම්බන්ධයෙන් ගණකාධිකාරී (සැපයීම්) ගෙන් 2025 මාර්තු 18 දින විමසීම් කිරීමේදී වාහනයෙන් ඉවත් කරන ලද ටයර් ගබඩාවට භාරනොදීම හේතුවෙන් ගෙවීම් කර නොමැති බව තහවුරු කරන ලදී.මේ අනුව වාහනයේ ලොග් සටහන් පොත අනුව 2024 සැප්තැම්බර් 30 දින ටයර් 04 ක් වාහනයට සවිකළ බවට යොදන ලද සටහන වංචනික ලෙස යොදන ලද සටහනක් බවත් ටයර් මිලදීගත් බවට හා ටයර් වාහනයට සවිකර wheel alignment හා wheel balancing කළ බවට ඉදිරිපත් කරන ලද මිලදීගැනීම් බිල් පත්‍රය වංචනික ලෙස ඉදිරිපත් කරන ලද බිල්පත්‍රයක් බවත් තහවුරු විය.	2023 මාර්තු 04 දිනැතිව බිල්පතක් ප්‍රවාහන අංශය වෙත ඉදිරිපත් කර ඇති බව, නිවැරදිව ටයර් යොදා ඇති බවට තාක්ෂණික නිලධාරීන්ගේ නිර්දේශයෙන් පසුව ලොග් සටහන් පොතේ සටහන් කර සැපයීම් අංශය වෙත යොමුකර ඇති බව. 2024 අප්‍රේල් 30 දිනැති බිල්පතක් ප්‍රවාහන අංශය වෙත ඉදිරිපත් කර ඇති බවත්. ඒ අනුව, ටයර් යොදා ඇති බවට තාක්ෂණික නිලධාරීන් නිර්දේශ කිරීමෙන් අනතුරුව බිල්පත සැපයීම් අංශය වෙත යොමුකර ඇති බව, වාහනයෙන් ඉවත් කරන ලද ටයර් ප්‍රවාහන අංශය මඟින් භාර ගැනීමක් සිදු නොවන බව,ටයර් ලබාගත් දිනය 2024 සැප්තැම්බර් 30 දින ලෙස වංචනිකව සටහන් කර ඇති බව සඳහන් කර ඇතත්, ලොග් සටහන් පොතේ සඳහන් දිනය 2024 අප්‍රේල් 30 බැවින්, ප්‍රවාහන අංශයෙන් වංචාවක් සිදුව නොමැති බව .	වංචනික ක්‍රියා සිදු නොවන ආකාරයට වාහන නඩත්තු කටයුතු සම්බන්ධ අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කළ යුතු අතර මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය
(ඇ)	මහරගම අපේක්ෂා රෝහල විසින් රේඛීය ත්වරණ ප්‍රතිකාර යන්ත්‍රය හරහා සිදුකරනු ලබන විකිරණ ප්‍රතිකාර වෙනුවෙන් දීමනා ගෙවීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
	(i) රේඛීය ත්වරණ ප්‍රතිකාර යන්ත්‍රය හරහා එක් රෝගියකු වෙත එක් වරකදී ලබා දෙන ප්‍රතිකාරය සඳහා ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රතිකාරක විකිරණ ශිල්පීන් දෙදෙනෙකු ප්‍රමාණවත් බව 2022 මාර්තු 15 දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතීත්වයෙන් යුත් කමිටුවක් විසින් තහවුරු කර තිබුණද ප්‍රතිකාරක විකිරණ	පිළිතුරු ඉදිරිපත් කර නැත.	මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් පැහැදිලි හා විධිමත් චක්‍රලේඛයක් අලුතින් නිකුත් කළ යුතු අතර සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ලබාගත් දීමනා නැවත

		ශිල්පීන් 03 දෙනෙකු සම්බන්ධ කර ගෙන රෝගියා සඳහා විකිරණ ප්‍රතිකාර විශේෂඥ වෛද්‍යවරයා තීරණය කරන කෝණ (ක්ෂේත්‍ර) ප්‍රමාණයට අතිරේකව තවත් ක්ෂේත්‍ර 10 ක් ඊට එකතු කර දීමනා ගෙවා තිබුණු අතර ඇතැම් අවස්ථාවලදි එක් රෝගියකු සඳහා ස්ථාන දෙකක් වෙත විකිරණ ක්ෂේත්‍ර එකවර ලබා දීමේදි ඉහතින් දැක්වූ අතිරේක ක්ෂේත්‍ර 10 වෙන වෙනම එම ස්ථාන දෙක වෙනුවෙන්ම එකතුකර ක්ෂේත්‍ර 20 ක් ලෙස ගෙන දීමනා ගෙවීම් කර තිබුණි.		අයකරගැනීමටත් එම නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.
	(ii)	අයඩීන් ප්‍රතිකාර ලබාදීමේදී ප්‍රතිකාර විකිරණ ශිල්පීන් දෙදෙනකු සම්බන්ධ කර ගන්නා අතර රෝගියාට ලබා දෙන අයඩීන් පෙති/දියරවල අඩංගු අයඩීන් සංසටකයේ මිලි කියුරි ප්‍රමාණය පදනම් කර ගෙන මිලි කියුරි 1 කට රු. 22.50 බැගින් වූ අමතර රාජකාරි දීමනාවක් ගෙවා තිබුණි.	අදාළ චක්‍රලේඛ වලට පරිබාහිරව කටයුතු කිරීම මත වැඩිපුර දීමනා ගෙවී ඇතිනම් ඒවා අයකර ගැනීමටද එකඟ වී ඇති බව, අදාළ අනුමැතීන් මත ඉදිරි කටයුතු සිදු කරන බව.	-එම-
	(iii)	රේඛීය ත්වරණ යන්ත්‍ර 2 (**LA**2) සහ 3 (**LA**3) යන යන්ත්‍ර දෙකෙහි පිළිවෙලින් පිළිකා රෝගින් 997 කට සහ 1283 කට ප්‍රතිකාර ලබා දී තිබුණ ද විකිරණ ප්‍රතිකාරක ශිල්පීන් විසින් අමතර රාජකාරි දීමනා ලබා ගැනීමේදී එසේ ප්‍රතිකාර කරන ලද රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් 1910 ක් සහ 2183 ක් ලෙස සාවද්‍ය ලෙස සටහන් කර අමතර ක්ෂේත්‍ර 28,126 ක් සඳහා රු. 632,835 ක් වැඩිපුර දීමනා ගෙවීම් තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	-එම-
(ඇ)		2021 වර්ෂයේදී කල්මුණේ අෂ්රොෆ් අනුස්මරණ රෝහලට අයත් ඉරවිලික්කන්ඩම් **(Iravelikkandam)** නමැති ඉඩමට එකතුව රු1,408,750 ක්වූ පස් කියුබික් මීටර් 575 ක් ඇතිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගතව තිබුණද**,** පස් කියුබික් මීටර් 2235.86 ක් ඇතිරූ බවට මුදල් ගෙවා තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 288 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණු අතර විගණන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025 මාර්තු 26 දින සිදු කළ ඒකාබද්ධ භෞතික පරීක්ෂාවේදී පස් කියුබික් මීටර් 1779.6 ක් පමණක් අතුරා තිබුණු බව තහවුරු විය. ඒ අනුව පස් කියුබික් මීටර් 456.26 ක් වෙනුවෙන් රු.1,117,837 ක් වැඩිපුර ගෙවා තිබුණි . එසේම යොදන ලද පස් අනුමත පස් බවට හා යොදන ලද පස් නියමිත පරිදි සුසන්හසනය	-එම-	පූර්ණ විමර්ශණයක් සිදුකර වැඩිපුර ගෙවූ මුදල් අයකරගැනීමටත් වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනිමටත් කටයුතු කළ යුතුය.

(compaction report) කළ බව තහවුරු කෙරෙන රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණු බැවින් පස් වෙනුවෙන් සිදුකරන ලද සම්පූර්ණ ගෙවීම දෝෂ සහිත බව නිරීක්ෂණය විය.

3.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.			
(අ)	2024 දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් 31 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට පැවති ණය ශේෂ 2024 වර්ෂයේදී අයකරගෙන නොතිබුණි.	නිලධාරීන් විසින් ලබා නොගත් රජයේ ආදායමට බැර කර ඇති ණය ශේෂ ඉවත් කිරීමට කටයුතු කරන බව, නිලධාරීන් 07 දෙනෙකුට අදාළව එකතුව රු.1,622,188 ක්වූ ආපදා ණය මුදල 2024 වර්ෂය තුල නැවත අළුත්කර ඇති බව, එකතුව රු.813,125 ක් වූ ආපදා ණය ශේෂ විදෙස් ගතවී ඇති නිලධාරීන් දෙදෙනෙකුට අදාළ බව, අනෙකුත් නිලධාරීන්ට අදාළ ණය ශේෂ අය නොවීම සම්බන්ධව කටයුතු කරන බව.	මෙම එක් එක් නිලධාරියාගේ ණය ශේෂ අය නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ආ)	2024 සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම 3 අනුව වෙනත් රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවීමට පැවති ණයගැති ශේෂය රු. මිලියන 49.14 ක් විය. 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය අනුව නිලධාරියා මාරුවී ගොස් මාස දෙකක් ඇතුළත ණය ශේෂ නොපියවන ලද්දේ නම්, මාරුවීම ලැබූ දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරියා සේවය කරන බව තහවුරු කොට ගෙන එම දෙපාර්තමේන්තුවට ලිඛිතව දැනුම් දීමක් කොට තුන්වන මාසයේදී මාරුව ලබාදුන් දෙපාර්තමේන්තුව විසින් මාසික ගිණුම් සාරාංශය මගින් එම ණයශේෂ අයකර ගතයුතු අතර මාස තුනකට පසුව එම ණයශේෂ නොපෙන්වීමට වගබලා ගත යුතුය. නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත්	2024 වර්ෂ අවසාන දින වන විට නිරවුල් නොවී පැවති වෙනත් රජයේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු ගිය සහ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් මේ වන විට නිරවුල් වී ඇති අතර අභ්‍යන්තර ස්ථාන මාරු ගිය සහ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් 2020 වර්ෂයේ සිට ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමෙන් අනතුරුව සැසඳීම් කටයුතු සිදු කරන බැවින් 2020 වර්ෂයෙන් පසුව නොසැසඳෙන ණය ශේෂයන් ගිණුම තුළ නොපෙන්වන අතර 2020 වර්ෂයට පෙර ණය ශේෂයන්ද පෙර දත්ත	ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිලධාරියා ස්ථාන මාරුවී ගොස් මාස 03 ක් ඇතුළත ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

	ආයතන හා අංශ 61 කට අදාළව රු මිලියන 49.14 ක ණයගැති ශේෂ සම්බන්ධයෙන් යථෝක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එසේම ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදයේ 1:6 සහ 1:7 යන වගන්තිවලට අනුකූලව කටයුතු කර නොමැති බවද නිරික්ෂණය විය. මෙම ණයගැති ශේෂයන් අතුරෙන් රු.මිලියන 40.69 ක් වු ණයගැති ශේෂ වර්ෂ 5ට වඩා වැඩි පැරණි ණය ශේෂයන් වූ අතර එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 83 ක් පමණ විය. ඉතිරි ණයගැති ශේෂ වලින් රු.මිලියන 7.30 ක් වූ ණයගැති ශේෂ මාස 03 ඉක්ම වූ ණයගැති ශේෂ විය. මේ අනුව සමස්ථ ණයගැති ශේෂයෙන් රු.මිලියන 47.99 ක් හෙවත් සියයට 98 ක් නිලධාරින්ගේ නොසැලකිල්ල හේතුවෙන් උද්ගත වූ ණයගැති ශේෂ විය.	පරීක්ෂා කිරීමෙන් අනතුරුව සැසඳීමේ කටයුතු සිදු කරමින් පවතින බව, පළාත් සභා වෙත ස්ථාන මාරු ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන්ද අදාළ පළාත් සභා වෙත දැනුම් දීමෙන් අනතුරුව නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ලබන අතර ස්ථාන මාරු පැමිණි නිලධාරීන්ට අදාළ ණය ශේෂයන් ප්‍රතිපාදන නිදහස් කිරීමෙන් අනතුරුව මේ වන විටත් නිරවුල් කරමින් පවතින බව.	
(ඇ)	උපලේඛන අංක 3.2.2 හි ඇතුළත් 2024 දෙසැම්බර් 31 දිනට අයවිමට පැවති රු.මිලියන 11.37 ක ණයගැති ශේෂ සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන වලට ස්ථාන මාරුවූ නිලධාරින්ගෙන් අයවිය යුතු ණයගැති ශේෂ විය. 2019, 2020, 2021, 2022 හා 2023 වර්ෂ වලට අදාළ විගණකාධිපති වාර්තා මගින් මෙම තත්ත්වය අවධානයට යොමුකරන ලද අතර එකම වැය ශිර්ෂයක් තුළ පවතින ආයතන අතර ණයගැති හා ණයහිමි ශේෂ පැවතිය නොහැකි බැවින් මෙම ණයගැති ශේෂ පිළිබඳව පරික්ෂා කර නිරවුල් කිරිමට කටයුතු කරන ලෙස නිර්දේශ කලද 2024 දෙසැම්බර් 31 දින දක්වා මෙම ණයගැති ශේෂ හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අභ්‍යන්තර ස්ථාන මාරුවී ගිය සහ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් 2020 වර්ෂයේ සිට ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමෙන් අනතුරුව සැසඳීම් කටයුතු සිදු කරන බැවින් 2020 වර්ෂයෙන් පසුව නොසැසඳෙන ණය ශේෂයන් ගිණුම තුළ නොපෙන්වන අතර 2020 වර්ෂයට පෙර ණය ශේෂයන්ද පෙර දත්ත පරීක්ෂා කිරීමෙන් අනතුරුව සැසඳීමේ කටයුතු සිදු කරමින් පවතින බව.	-එම-
(ඇ)	වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 195 දෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. මිලියන 9.95 ක් වූ අතර ඉන් රු. මිලියන 7.31 ක් හෙවත් සියයට 73 ක ණය ශේෂ වර්ෂ **5** කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු. මිලියන 9.28 ක් හෙවත් සියයට 93 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය.	ඇතැම් ණය ශේෂයන් අයකර ගැනීම සඳහා නීති අංශය වෙත හා ඉතිරි ණය ශේෂයන් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙත, ඇපකරුවන් වෙත හා ප්‍රදේශය භාර වගකිව යුතු නිලධාරීන් වෙතින් තොරතුරු ලබා ගැනීමට යොමුකර ඇති බව, මීට අමතරව, අවශ්‍ය සියලු උත්සහයන් දැරීමෙන් අනතුරුව තවදුරටත් අයනොවී පවතීනම් පොතෙන් කපාහැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඉ)	සේවය අතහැර ගිය නිලධාරීන් 1224 දෙනෙකුගෙන් එකතුව රු. මිලියන 45.28 ක ණය ශේෂයන් අයවිය යුතුව තිබුණු අතර ඉන් රු. මිලියන 11.28 ක් හෙවත් සියයට 25 ක ණය ශේෂ වර්ෂ 5 කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු. මිලියන 25.11 ක් හෙවත් සියයට 55ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය.	පෞද්ගලික ලිපි ගොණු වලට අදාළ ලිපිනයන්වල පදිංචිව නොසිටීම, වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම, වසර 10 කට වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ට ඇපකරුවන් නොමැති විම මත ණය ශේෂ අය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් වර්ෂ 5 කට වඩා වැඩි හිඟ ණය ශේෂ පවතින බව, මීට අමතරව, අමාත්‍යාංශයට අයත් රෝහල් සහ ආයතන වෙත දීර්ඝ කාලීන ණය ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව, තවදුරටත් අයනොවී පවතීනම් පොතෙන් කපාහැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	-එම-
(ඊ)	විශ්‍රාම ගිය නිලධාරීන් 257 දෙනෙකුගෙන් අයවිය යුතු ණය මුදල රු. මිලියන 18.22 ක් වූ අතර එයින් රු. මිලියන 5.79 ක් හෙවත් සියයට 32 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය.	විශ්‍රාමික නිලධාරීන්ගේ ණය ශේෂයන් අවම කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කර ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කිරීම සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 05/2019 අනුව අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	-එම-
(උ)	2024 දෙසැම්බර් 31 දිනට මියගිය නිලධාරින්ගෙන් අය විය යුතු ණය මුදල රු. මිලියන 8.65 ක් වී තිබුණු අතර ඉන් නිලධාරීන් 29 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 1.72 ක් හෙවත් සියයට 20 ක ණය ශේෂ වර්ෂ 05 කට වඩා පැරණි ණය ශේෂ විය. ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.4 සිට 4.6 දක්වා වගන්ති අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ණයගැති ශේෂයෙන් රු. මිලියන 4.77 ක් හෙවත් සියයට 55 ක් වර්ෂයකට වඩා වැඩි ශේෂ විය.	මියගිය නිලධාරීන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක මරණ පාරිතෝෂිකය මේ දක්වා නිරවුල් වී නොමැති වීම හා උරුමකරුවන් ඉදිරිපත් නොවීම නිසා ගොණුවේ ඉදිරි කටයුතු සිදු නොවීම නිසා අයවීම් කටයුතු මෙතෙක් සිදු වී නොමැති අතර අමාත්‍යාංශයට අයත් රෝහල් සහ ආයතන වෙත දීර්ඝ කාලීන ණය ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව, තවදුරටත් අයනොවී පවතීනම් පොතෙන් කපාහැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇති බව.	-එම-

3.7 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට **CIGAS** පද්ධතිය අනුව තැන්පතු ගිණුම් සාරාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ කේවල ගිණුම් සාරාංශ ලේඛන අතර රු.මිලියන 10.58 ක ශුද්ධ වෙනසක් පැවතුණි.	මෙම වෙනසට හේතු විය හැක්කේ 2016 වර්ෂයේ පැරණි පොදු තැන්පත් ගිණුම් ශේෂ රජයේ ආදායමට බැර කිරීමේදීත් පැරණි ශේෂ අලුතින් ආරම්භ කරන ලද පොදු තැන්පත් ගිණුම් වලට මාරු කිරීමේ දී උද්ගත වී ඇති අවුල් සහගත තත්වයන් විය හැකි නමුත් හැකි උපරිමයෙන් මෙම වෙනස්කම් නිරවුල් කිරීමට කටයුතු කර ඇති බව.	මෙම වෙනසට හේතු හඳුනාගෙන කඩිනමින් නිවැරදි කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පොළොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහලෙහි වකුගඩු රෝගයට අදාළ පර්යේෂණ සිදු කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන අංශය පිහිටුවීම සඳහා චීන රජයෙන් ප්‍රදාන ලෙස ලද වර්ග 20කට අදාළ උපකරණ ඒකක 55 ක් එම අංශය පිහිටුවා නොතිබීම හේතුවෙන් නිෂ්කාර්යව රෝහලේ ගබඩා කර තිබුණි. තවද, නිෂ්කාර්යව පවතින මෙම උපකරණ භාවිතා නොකිරීම හේතුවෙන් තාක්ෂණික වශයෙන් යල් පැනීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.	කළමනාකරණ කමිටු රැස්වීමේදී පර්යේෂණ හා රසායනාගාර ආරම්භ කිරීම සඳහා රසායනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු විශ්ව විද්‍යාල නියෝජිතයින් සාකච්ඡා පවත්වා ඇති බවත්, එම කාර්යන් ඉදිරියට සිදු නොවී ඇති බැවින් පර්යේෂණ රසායනාගාරය තුළ පවතින උපකරණ අතරින් භාවිතා නොවන උපකරණ ලබා දිය හැකි ස්ථාන සොයා බලා එම රෝහල් සඳහා ලබා දීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙසට උපදෙස් ලැබී ඇති බව.	නිෂ්කාර්යව පවතින මෙම උපකරණ භාවිතයට ගැනීම හෝ අවශ්‍යතාවය මත ලබාදීමට හැකි ස්ථාන සොයා බලා ලබාදීමට කටයුතු කළ යුතුය.
(ආ)	කෑගල්ල ශික්ෂණ රෝහලේ 2023 හා 2024 වර්ෂවල පිළිවෙලින් ශල්‍ය කර්ම සඳහා ලියාපදිංචිව සිටි රෝගීන් 1794 ක් හා 1436 න්, 732 ක් හා 708 ක් වශයෙන් සියයට 50 කට අඩු රෝගීන් සංඛ්‍යාවකගේ පමණක් සැත්කම් සිදු කිරීමට හැකිවී තිබුණි.	2023 වර්ෂයේ මුල් භාගයේ සිටම රෝහල මඟින් ලබා දෙන අක්ෂි කාච, Cassette ප්‍රමාණවත් පරිදි ලැබී නොතිබීම, ඖෂධ හා ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හිඟ වූ අවස්ථාවල දී සමහර රෝගීන්ට එම ද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වීමත් නිසා 2023 හා	රෝගී සත්කාරක සේවා උපරිම කාර්යක්ෂමතාවයකින් සිදු කිරීමට කටයුතු කළ යුතුය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	2024 වර්ෂවල දී ශල්‍යකර්මය සඳහා ලියාපදිංචි වූ සියලුම රෝගීන් සඳහා ශල්‍යකර්මය සිදු කිරීමට නොහැකි වී ඇති බව.	

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 වර්ෂයේ ආරම්භ කරන ලද පොළොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහලේ වෛද්‍ය දැඩි සත්කාර ඒකකය විගණිත දින වූ 2025 පෙබරවාරි 10 දින දක්වා වර්ෂ 03 කට අධික කාලයක් ගතවී තිබුණද, මෙම ඒකකය ක්‍රියාකාරී මට්ටමේ නොපැවතුණ අතර එය ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වී නොතිබුණි.	රෝහලේ ස්ථාපිත වෛද්‍ය දැඩි සත්කාර ඒකකය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇති බව .	සැලසුම් කළ පරිදි අපේක්ෂිත ප්‍රතිලාභ නියමිත කාලය තුළ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.

4.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
හලාවත මහ රෝහලෙහි රු.1,170,171,946ක ඇස්තමේන්තුගත මුදලකට 2016 වර්ෂයේ සිට ගොඩනැගිලි 03ක් ඉදිකිරීම ආරම්භ කර තිබුණද එම ඉදිකිරීම් 2024 දෙසැම්බර් 31 දින වන විටද අවසන් කර නොතිබුණි. විස්තර පහත පරිදි විය.		
(අ) හදිසි අනතුරු ඒකකයක් ඉදිකිරීමේ දැඩි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් රු.මිලියන 501.21 ක ඇස්තමේන්තු මුදලකට දින 609 ක් තුළ නිම කිරීම සඳහා 2018 ජනවාරි 15 දින වැඩ ආරම්භ කර තිබුණද, මෙම ඉදිකිරීම 2024 වර්ෂය අවසාන වන විට අත්හැර දමා තිබුණි.	කොන්ත්‍රාත්කරු විසින් වැඩ බිමට රැගෙන එන ලද වානේ කම්බි පිළිබඳව ඇති වූ ගැටළු සහගත තත්ත්වයක් නිසා ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු කාලයකට ඇන හිටින ලද බව, ඒ පිළිබඳ පරීක්ෂණ අවසන් වූ පසු නැවත කොන්ත්‍රාකරු විසින් ඉදිකිරීම් ආරම්භ කරනු ලැබුවද අතරමගදී කිසිදු දැනුම් දීමකින් තොරව වැඩ බිම අතහැර යාමෙන් නැවතත් ඉදිකිරීම් කටයුතු ඇනහිට ඇති බව, 2025 වර්ෂය සඳහා නැවත වැඩ ආරම්භ කිරීමට ප්‍රතිපාදන වෙන්ව ඇති අතර කඩිනමින් මෙහි ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති බව.	ව්‍යාපෘතියේ වැඩ කොටස් නිමකර කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2018 පෙබරවාරි 19 ආරම්භ කරන ලද රු.මිලියන 583.78 ක ඇස්තමේන්තු වටිනාකමක් ඇති මහල් 05 කින් සමන්විත වෛද්‍ය වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ල 2020 වසර අවසානයේ අවසන් වීමට තිබුණද ,එහි ඉදිකිරීම් නවතා තිබුණු අතර එහි ගිවිසුම් කාලය දින 1700 ක් පමණ ඉක්මවා තිබුණි.	කොරෝනා වසංගතයත් ඉන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ ඇතිවූ ආර්ථික අර්බුදයත් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තුළ ඇති වූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන්ද මෙහි ඉදිකිරීම් අතර මග නතර කිරිමට සිදු වූ අතර ඒ සඳහා 2022 ජුනි මස 21 දිනැති අංක අමප/22/0718/520/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙහි උපදෙස් පරිදි සේවා යෝජකයාටත් කොන්ත්‍රාත්කරුටත් යන දෙපාර්ශවයටම අවාසියක් නොවන පරිදි ඉදිකිරීම් අත්හිටුවන ලද අතර 2025 වර්ෂයට අදාළව ප්‍රතිපාදන ලබා දී ඇති අතර නව ඇස්තමේන්තු කැඳවා ඇති බව.	ව්‍යාපෘතිය කඩිනමින් නිමකර රෝගී සත්කාරක සේවා සඳහා උපයෝජනයට ගත යුතුය.
(ඇ)	රෝහලේ පවතින දැඩි ඉඩකඩ හිඟය සඳහා ශල්‍යාගාරයක් හා දැඩි සත්කාර ඒකකයක් ඉතා ඉක්මනින් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් සාමාන්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යන කාලය අවම කරනු පිණිස යකඩ භාවිතයෙන් තාවකාලික ගොඩනැගිල්ලක් මාස 06 ක් තුළ ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර තිබුණද 2024 වර්ෂය අවසාන වන විටත් මෙම ගොඩනැගිල්ලේ 02 වන මහලේ වැඩ අවසන් කර නොතිබුණි. මෙම ප්‍රමාදය සඳහා කොන්ත්‍රාත්කරුගේ නොසැලකිලිමත්භාවය, සැලසුම් පිළියෙල කිරීමට පෙර අවශ්‍යතා හඳුනා නොගැනීම නිසා පසුව සැලසුම් වෙනස් කිරීම, ඉදිකිරීම් භූමිය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කිරීම, බිල්පත් ගෙවීම් ප්‍රමාදයන් ආදී කරුණු හේතු වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 85.18 ක් වූ මෙම ඉදිකිරීමේ ඇස්තමේන්තු වියදම රු.මිලියන 131.95 ක් දක්වා වැඩි කිරීමට කොන්ත්‍රාත්කරු 2021 මැයි 31 දින ඉල්ලා තිබුණි.	ඉදිකිරීම රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත කොන්ත්‍රාත් භාරදුන් අතර එම ආයතනයේ වගකීම් විරහිතභාවය නොසැලකිලිමත්භාවය නිසා ඉදිකිරීම් අතරමඟ ඇන හිටින ලද බව, ඉදිරියේදී මෙවන් තත්ත්වයන් ඇති නොවීම සඳහා මෙවැනි ආයතන සඳහා කොන්ත්‍රාත් ලබා නොදීමට කටයුතු යොදා ඇති බව, කෙසේ වෙතත් මේ වන විට රෝහලේ අවශ්‍යතාවය පරිදි දෙවන මහල අවසන් කිරිමට සැලසුම් සකස් කරමින් පවතින බව.	ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යනයකින් පසුව සැළසුම්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

4.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් සභා ප්‍රතිපාදන මත 2016 නොවැම්බර් 01 දින වැඩ ආරම්භ කර තිබුණු ඇස්තමේන්තු මුදල රු. මිලියන 218.44 වූ ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ බාහිර රෝගී අංශය පවතින ගොඩනැගිල්ලේ වැඩ 2018 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද, බිම් මහලේ සියයට 30 ක පමණ ප්‍රමාණයක ඉදිකිරීම් කටයුතු සිදු කර අතරමග නවතා දමා තිබුණි.	බාහිර රෝගී අංශයේ වම් අන්තයේ බිම් මහළ හා පළමු හා දෙවන මහළේ ඉතිරි ඉදි කිරීම් ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති අතර සබරගමුව පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් ඇස්තමේන්තු අනුමත කර ඇති බව, ඉදිරි ප්‍රසම්පාදන සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	ව්‍යාපෘතිය කඩිනමින් නිමකර ඵලදායි ලෙස උපයෝජනය සඳහා සුදුසු පියවර ගත යුතුය.

4.5 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් අංක KP-0050 දරන (Land Rover Discovery 04) වාහනය දේශිය නියෝජිත ආයතනයෙන් 2022 ඔක්තෝබර් 11 දින ඉදිරිපත් කරන ලද රු. 1,995,655 ක ඇස්තමේන්තුව මත අලුත්වැඩියා කර ගැනීමට අනුමැතිය ලබාදි තිබුණි. 2022 දෙසැම්බර් 02 දින මෙම වාහනය අලුත්වැඩියාව සඳහා දේශීය නියෝජිත ආයතනයට යොමුකර තිබුණු අතර එම ආයතනය විසින් 2022 දෙසැම්බර් 16 දින රු.2,124,076 ක නව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. 2023 පෙබරවාරි 13 දින නියෝජිත ආයතනය විසින් රු. 420,668 ක අතිරේක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර 2023 පෙබරවාරි 27 දින ඒ සඳහා අනුමැතිය ආයතනයට ලබාදි තිබුණි. නැවත 2023 අගෝස්තු 17 දින රු. 11,927,210 ක අතිරේක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර එය පරික්ෂා කරන ලද ප්‍රවාහන වැඩ මූලික හා යාන්ත්‍රික ඉංජිනේරු විසින් වාහනය අමාත්‍යාංශයට රැගෙන ඒමට නිර්දේශය ඔවුන්ගේ දින රහිත ලිපිය මගින් ලබාදී තිබුණි. නමුත් වගකිව යුතු නිලධාරීන් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණු අතර නැවත 2024 පෙබරවාරි 19 දින ප්‍රවාහන නිලධාරි විසින් වාර්තාවක් අධ්‍යක්ෂ (ප්‍රවාහන) වෙත ලබාදි තිබුණු අතර එමගින්ද අලුත්වැඩියාව අමතර කොටස් යොදා සිදුකර ඇති බවත් ලබාදි ඇති බිල් පත්‍රය ගෙවිය යුතු බවත් දන්වා තිබුණි. කඩිනමින් අලුත්වැඩියා කර	සිදුකර ඇති අලුත්වැඩියාවලට අදාළ බිල්පත ගෙවීමෙන් අනතුරුව රථය රැගෙන ඒම සිදුකළ යුතු අතර නියෝජිත ආයතනය මඟින් අවසන් බිල්පත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රථය රැගෙන ඒමට නොහැකිවී ඇති බව, මෙම රථය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව තීරණය කිරීම සඳහා පත්කර ඇති කමිටුවේ තීරණ ලද පසු ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. එන්ජින් ධාරිතාව 2300 CC වඩා වැඩි වාහන වෙන්දේසි කිරීම සඳහා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් පවතින බැවින්, ඒ අනුව මෙම රථය වෙන්දේසි කිරීම සඳහා යොමු කිරීමට නියමිතව ඇති බව.	විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	භාරදිය යුතු වාහනයක් ලෙස කටයුතු කර තිබුණද රියදුරු විසින් 2022 ජුලි 28 දින දැනුම්දී තිබුණු දෝෂය අලුත්වැඩියා කර වාහනය අමාත්‍යාංශයට ලබාගැනීමට වසර දෙකකට වැඩි කාලයක් ගතවී ඇතත් 2024 දෙසැම්බර් වන විටත් නොහැකි වී තිබුණි.		
(ආ)	මහනුවර ජාතික රෝහලේ අමු ආහාර ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී 2022/2023 වර්ෂයේ රු.මිලියන 380.92 කින් හා 2023/2024 වර්ෂයේදී රු.මිලියන 260.41 කින් අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් එම ලංසුව සඳහා කාර්යසාධන සුරක්ෂණය ඉහළ අගයක් පැවතීමෙන් අනෙකුත් තරඟකාරී ලංසු ඉදිරිපත් කළහැකි ලංසුකරුවන් අධෛර්යමත් වීමේ හැකියාව පැවතුණි.	2022/2023 සහ 2023/2024 වර්ෂවල මෙන්ම ඊට පෙර වර්ෂ වලදී ද අමු ආහාර ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සිදුව ඇති අඩු පාඩු දුර්වලතා මෙන්ම අධි ඇස්තමේන්තු පැවති බව, නමුත් මේ වන විට ආහාර කළමනාකරණ කමිටුවක් පත් කර පැවති අධි ඇස්තමේන්තු තත්වයන් ද නිවැරදි කරමින් 2024/2025 වර්ෂය සඳහා ආහාර ඇස්තමේන්තුව පිළියෙල කර ඇති බව.	තාත්වික ඇස්තමේන්තු පිළියෙලකර වඩාත් තරඟකාරී ලංසු ලබාගැනීමටත් අධි ඇස්තමේන්තු පිළියෙල කළ නිලධාරින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේ සපයන සේවාවන් පරිගණකගත කිරීම සඳහා **E-Health System** වැඩසටහනක් ස්ථාපිත කිරීමට අවස්ථා 02 කදී මිල ගණන් කැඳවා තිබුණු අතර දෙවන අවස්ථාවේදී රු. මිලියන 19.49 ක් (වැට් රහිත) වටිනාකමකට එනම් මුල් අවස්ථාවට වඩා රු. 879,105 ක වැඩි මිලකට හා මුල් අවස්ථාවේ වසර 05 ක කාලයකට අලුත්වැඩියාවන් හා ප්‍රතිස්ථාපනයන් ගාස්තු රහිතවද වසර 25 ක වගකීම් කාලය, ලෙස තිබූ වාසිදායක තත්ත්වය වෙනුවට වසර 03 ක වගකීම් කාලයක් හා වගකීම් කාලයෙන් පසුව වසර 10 ක් සඳහා රු. 3,500,000 ක මුදලකට නඩත්තු හා සේවා වර්ෂ 10 ක් ලෙස රජයට අවාසිදායක අයුරින් කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. එසේම, කෙසේ වෙතත් 2019 නොවැම්බර් 19 දින වැඩ නිමකර භාරදී තිබූ මෙම ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින වන විටත්, සක්‍රිය කරවා ගැනීමට කිසිදු සැලසුමක්, තාක්ෂණික උපකරණ මිලදී ගැනීමකින් හෝ තොරව මුළු මනින්ම අක්‍රිය වී පැවතුණි.	තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අනුව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති බැවින් රජයට උපරිම වාසිදායක ලෙස ප්‍රසම්පාදනය සිදු කර ඇති බව, පළමු ලංසුව සඳහා ලබාදී ඇති වගකීම් කොන්දේසිම දෙවන ලංසුව සඳහාද ලබා දී ඇති බව, ඒ අනුව අවස්ථා දෙකේදීම Passive Item සඳහා වසර 25 ක වගකීමක් ලබා දී ඇති බව, කොන්ත්‍රාත් වැඩ නිම වීමට පෙර එනම් 2019 **නොවැම්බර්** 19 දිනට පෙරත් ඉන්පසුවත් රෝහල සඳහා සුදුසු වැඩසටහනක් ස්ථාපිත කිරීමට අදාළ ඉදිරි කාර්යන් සිදු කරන ලෙස අමාත්‍යාංශය වෙතින් ඉල්ලා ඇති බව, මෙම පද්ධතිය ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ පමණක් වන බැවින් අප රෝහල විසින් මෙම කාර්ය සෘජුව ඉටු කළ නොහැකි බව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ නිලධාරි	ස්වාධීන විමර්ශනයක් සිදුකළ යුතුය.

		විසින් ලබා දී ඇති වාර්තාව අනුව fire wall උපාංගයේ බලපත්‍රය අළුත් නොකිරීමෙන් එමඟින් සපයන සේවා යම් ප්‍රමාණයකින් සිදු නොවන අතර එය සම්පූර්ණයෙන් ක්‍රියාවිරහිත වීමක් නොවන බව.	
(ඇ)	සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ 2015 මැයි 28 දිනැති පොදු චක්‍රලේඛ අංක 01-21/2015 හි 6.1 ඡේදය අනුව රෝහල් කනිෂ්ඨ සේවකයින්ට දිවා ආහාරය හෝ රාත්‍රී ආහාරය ලෙස එක් ආහාර වේලක් ඇතුළත් වන පරිදි අර්ධ ආහාර වටයක් ලබාදිය යුතු වුවත්, මෙම ප්‍රසම්පාදනයට අදාළව මාතලේ දිස්ත්‍රික් මහ රෝහල විසින් සකස් කර නිකුත් කර තිබුණු ලංසු පත්‍රයේ, කනිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා සපයනු ලබන අර්ධ ආහාර වටයක් යන්නට දවල් සහ රාත්‍රී ආහාරය ලෙස ආහාර වේල් 02 ක් ඇතුළත් විය යුතු බවට දෝෂ සහගත ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් තෝරාගත් සැපයුම්කරු විසින් අර්ධ ආහාර වටයක් වෙනුවෙන් ඉහල මිල ගණන් දක්වමින් ලංසු ඉදිරිපත් කර තිබුණු බව මධ්‍යම පළාතේ මධ්‍යම රජයේ වෙනත් රෝහලක මිලගණන් හා සැසදීමේදී නිරීක්ෂණය විය. ඒ අනුව සැපයූ එක් ආහාර වේලක් වෙනුවෙන් ආහාර වේල් දෙකක මිල ගෙවීම මත 2024 ජනවාරි 01 දින සිට 2024 අප්‍රේල් 31 දින දක්වා වූ මාස 04 ක කාලය සඳහා රු.3,695,875 කට කට ආසන්න අධි ගෙවීමක් සිදු වී තිබුණි. 2024 වර්ෂයේ ඉතිරි මාස 8 වෙනුවෙන් රු.7,391,750 කට ආසන්න අධි ගෙවීමක් සිදුවිය හැකිව තිබුණි.	ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුවට අදාළ ලංසු පත්‍රය මෙම අර්ධ ආහාර වටය එක් ආහාර වේලක් ලෙස නිවැරදි කර නැවත ලංසු පත්‍රය සංශෝධනය කර 2024/07/23 දිනැති සංශෝධන ප්‍රසම්පාදන තීරණයකට එළඹ ඇති බව, එම සංශෝධන ප්‍රසම්පාදන තීරණයද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන (සී) කමිටුව විසින් 2024 **ඔක්තෝබර්** 16 දිනැතිව අනුමත කර ඇති බව.	වගකිව යුතු නිලධාරින් සැළකිළිමත්ව කටයුතු කළ යුතු අතර නොසැලකිළිමත්ව කටයුතු කළ නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහලේ පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීමට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	අදාළ ලංසු කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතිවලට අනුකූල බවට කාර්මික තාක්ෂණික ආයතනය **(ITI)** මගින් සහතික කරන ලද රසායන ද්‍රව්‍ය ඒවායේ අඩංගු රසායනික සංයුතිය හා ප්‍රමාණය විධිමත් ලෙස සඳහන් කරන ලද මුද්‍රිත ඇසුරුම් සහිතව සැපයිය යුතු වුවද, සැපයුම්කාර ආයතනය විසින් රෝහලට සපයා තිබුණු පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍යවල නිෂ්පාදිත දිනය, කල් ඉකුත් වන දිනය, කාණ්ඩ අංකය හා ප්‍රමාණය අතින් ලියා ඇසුරුම්වල හා මුද්‍රා රහිත ඇසුරුම්වල	2024 **දෙසැම්බර්** 31 දිනැති ලිපියෙන් කොන්ත්‍රාත් සමාගමේ පවතින අඩු පාඩු කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව නිවැරදි කරන ලෙස උපදෙස් ලබා දුන් බව.	ලංසු කොන්දේසිවලට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	රසායන ද්‍රව්‍ය සපයා තිබුණු අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ප්‍රමිතිය සහතික කර නොතිබූ අවස්ථා ද නිරීක්ෂණය විය.		
	(ii) ලංසු කොන්දේසි ප්‍රකාරව ආයතන ප්‍රධානියා විසින් පිරිසිදු කිරීමේ කාර්යභාරයට අදාළ භූමි ප්‍රමාණය හා ගොඩනැගිලි විස්තර සපයා නොතිබුණු අතර, ලංසු කොන්දේසිවල 2.19 ප්‍රකාරව පිරිසිදු කිරීමේ සේවකයින්ගේ දෛනික පැමිණීමේ ලේඛනවල බලයලත් නිලධාරියෙකු පරීක්ෂා කර සහතික කිරීම හා කොන්දේසි අංක 2.7 ප්‍රකාරව පිරිසිදු කිරීමේ කාර්යය සඳහා සේවයේ යෙදිය යුතු අවම පිරිමි සේවක සංඛ්‍යාවක් යෙදවීම හා කොන්දේසි 16.3 ප්‍රකාරව පිරිසිදු කිරීමේ කාර්යය සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය නියමිත ප්‍රමිතියෙන් යුක්ත බවට ආසාදන පාලන ඒකකය විසින් පරීක්ෂා කර බලා තහවුරු කිරීම යන කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ බවට තහවුරු කර ගැනීම සිදු කර නොතිබුණි.	-එම-	-එම-
(ඊ)	අනුරාධපුර ශික්ෂණ රෝහලේ ආරක්ෂක සේවාව රජයට අනුබද්ධ සමාගමක් වෙත වසර 20 කට වැඩි කාලයක සිට අඛණ්ඩව ප්‍රදානය කර තිබුණු අතර එම සමාගමට එරෙහිව විවිධ පාර්ශව වෙතින් පැමිණිලි ඉදිරිපත් කර තිබුණ නමුත්, ප්‍රසම්පාදන තීරණ ගැනීමේ දී ඒ සම්බන්ධව අවධානයක් යොමු නොකර 2024 ඔක්තෝබර් 01 දින සිට 2025 මාර්තු 31 දින දක්වා වූ මාස 06 ක කාල සීමාවක් සඳහා රු. 23,975,022 ක වටිනාකමකට තරඟකාරී මිල ගණන් කැඳවීමෙන් තොරව අදාළ සමාගම වෙතම නැවත වරක් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. තවද, ආරක්ෂක සමාගමේ සේවකයන්ගේ දෛනික පැමිණීම, පිටවීම හා සේවා මුර සඳහා යොදවනු ලබන සේවකයන් ප්‍රමාණය ආදිය සත්‍ය වශයෙන්ම තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.	2025 අප්‍රේල් 01 දින සිට රෝහල සඳහා ආරක්ෂක සේවාවක් සපයා ගැනිම සඳහා රෝහල විසින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර නව කොන්ත්‍රාත්කරුවකු පත්කරගෙන ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.
(උ)	අනුරාධපුර ශික්ෂණ රෝහල විසින් අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 2023 /2024 වර්ෂයට අදාළව පිරිසිදු කිරීමේ සේවාව වසර 20 කට අධික කාලයක් සිදු කළ පෞද්ගලික ආයතනය වෙතම මිල ගණන් කැඳවීමෙන් තොරව ලබා දී තිබුණි. තවද, ප්‍රසම්පාදන තීරණ හා කොන්දේසිවලට අදාළව පිරිසිදු කිරීම් සඳහා භාවිතා කරනු ලබන රසායන ද්‍රව්‍ය නියමිත ප්‍රමිතියෙන් තිබිය යුතු බවට	රෝහලේ ආසාදන පාලන ඒකකය විසින් කරන ලද අහඹු පරීක්ෂා වලදී සපයා ඇති ඇතැම් පිරිසිදු කිරිමේ රසායනික ද්‍රව්‍යවල ප්‍රමිතිය සම්බන්ධයෙන් ගැටළුකරි තත්ත්වයක් නිරීක්ෂණය කර තිබූ අතර සැපයුම් සිදු කිරිමට පෙර ප්‍රමිතිය	-එම-

	ගිවිසුම්ගත වී තිබුණ ද 2024 ඔක්තෝබර් 22 දින රෝහල් පරිපාලනය විසින් සිදුකරන ලද පරීක්ෂාවේ දී පිරිසිදු කරන රසායන ද්‍රව්‍ය නියමිත ප්‍රමිතියෙන් නොතිබුණු බව අනාවරණය වී තිබුණි. 2024 සැප්තැම්බර් 15 දිනෙන් කොන්ත්‍රාත් කාලය අවසන් වී තිබුණු නමුත් මෙම ආයතනය අඛණ්ඩව පිරිසිදු කිරීමේ සේවාවේ නියුක්ත වී තිබුණි.	පිළිබඳව විශේෂයෙන් සලකා බලා සැපයුම් සිදු කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටින ලද බව, අමාත්‍යාංශය විසින් තෝරා ගන්නා ලද නව කොන්ත්‍රාත්කරුට අදාළ තොරතුරු මේවන විට රෝහල වෙත යොමුකර ඇති බව.	
(ඌ)	නාගොඩ ශික්ෂණ රෝහල වෙත මාළු හැර අනෙකුත් අමු ආහාර සැපයිම සඳහා එළඹ තිබූ රු. මිලියන 147.76 ක ගිවිසුම් මුදලකට පෞද්ගලික සැපයුම්කරු වෙත අමු ආහාර සැපයීම වෙනුවෙන් ගෙවීම් හා සපයන ලද ආහාර සම්බන්ධ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	වර්ෂ කිහිපයක සිට දිගින් දිගටම එකම සැපයුම්කරුවකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබීම හා එම සැපයුම්කරු වෙතටම ලංසු ප්‍රදානය කර තිබීම හේතුවෙන් තරඟකාරී ලංසු මිල ගණන් අතුරින් වඩාත් සාධාරණ හා වාසිදායක සැපයුම්කරුවකු තෝරා ගැනීමේ අවස්ථාව රෝහල වෙත මගහැරී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	තරඟකාරිත්වය වැඩිකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.
(ii)	සැපයුම්කරු සමග එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව හම රහිත කුකුල් මස් සපයන බවට එකඟ වී තිබුණද දිගින් දිගටම කිලෝග්‍රෑම් එකක් සඳහා රු.1,580 ක ගිවිසගෙන තිබුණු ඉහල මිලකට හම සහිත කුකුල් මස් සපයා තිබුණු බව පැමිණිලි වාර්තා පොතේ සටහන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තා සහ සැපයුම්කරු මස් සපයන අවස්ථාවේදී සිදුකළ භෞතික පරීක්ෂාවේදීද තහවුරු විය. හම රහිත කුකුල් මස් කිලෝග්‍රෑම් එකක් මෙම කාල පරිච්ඡේදය තුළ රු. 1,000 කට ආසන්න මිලකට වෙළඳ පොලෙන් මිලදී ගත හැකිව තිබියදී රු.1,580 ක් වැනි ඉහල මිලක් හම සහිත කුකුල් මස් කිලෝ එකක් සඳහා ගෙවීම් කිරීම හේතුවෙන් මිලදී ගෙන තිබුණු සෑම මස් කිලෝග්‍රෑම් එකක් වෙනුවෙන් රු.500 කට අධික මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	කොන්ත්‍රාත්කරු විසින් 2024 ඔක්තෝබර් 31 දින සිට 2024 දෙසැම්බර් 15 දින දක්වා සම සහිත කුකුල්මස් සැපයීම සිදුකර ඇති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව සපයන ලද කුකුල් මස් කිලෝ 397.280 ක ප්‍රමාණයේ සම ප්‍රමාණය කිලෝ 59.592 කි. (කිලෝ 01ක සම ප්‍රමාණය ග්‍රෑම් 150 වන බව මුලුතැන්ගෙයි අරක්කැමි වාර්තා කර ඇත). ඒ අනුව සැපයුම්කරු වෙත වැඩිපුර ගෙවා ඇති රුපියල් 94,155.36 ක මුදල මාර්තු මස වවුචරයෙන් අය කරගැනීමට කටයුතු කරන බව.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අයකරගතයුතු සියලු මුදල් කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	අමු ආහාර සැපයුම්කරු හම සහිතව සපයන කුකුල් මස් හම ඉවත් කර කැලි කැපීමේදී එක් කැබැල්ලක තිබිය යුතු බර ප්‍රමාණය අඩුවන බවට වන චෝදනාවෙන් මිදීමට සහ අධිශීතකරණ කරන ලද හම සහිත මස්	කොන්ත්‍රාත්කරු දැනුවත් කිරීමෙන් පසු (2024 දෙසැම්බර් 16 සිට) වර්තමානයේ නිසි පරිදි හම රහිත කුකුල් මස් සපයන බව.	ලංසු කොන්දේසිවලට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	කැපීමට වැඩි කාලයක් ගතවීමෙන් ආහාර පිසීමට සිදුවන ප්‍රමාදය වැලැක්වීමට අරක්කැමි විසින් හම සහිතව මස් පිසීමට කටයුතු කර තිබුණි. මෙම තත්ත්වය රෝගීන්ට සංකූලතා ඇතිවිය හැකි ඉතාමත්ම අහිතකර තත්ත්වයක් බව මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තා මගින්ද පෙන්වා දී තිබුණි.		
(iv)	එසේම අමු ආහාර සැපයුම්කරු විසින් සපයා තිබුණු තේ කුඩු බාල තත්ත්වයේ පවතින බව තත්ත්ව පරීක්ෂණ වාර්තා මඟින්ද තහවුරු වී තිබුණු අතර සපයා තිබුණු එළවළු ද මඩ සහිත අපිරිසිදු තත්ත්වයේ පවතින බව පැමිණිලි වාර්තා පොතේ සටහන් මගින් සනාථ වී තිබුණද මේ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව සපයා තිබුණු අමු ආහාර ද්‍රව්‍ය සඳහා ගෙවීම් කර තිබුණි.	ගිවිසුමේ තේ කොළවල ප්‍රමිතිය පිළිබඳ නිසි ලෙස සඳහන් නොවීම මතභේදයට තුඩු දෙන්නක් බව, එහෙත් තේ කුඩු සාම්පල් පරීක්ෂාවෙන් පසු කොන්ත්‍රාත්කරුට අවවාද කර විධිමත්ව ඇසුරුම් කරන ලද ලේබල් සහිත තේකුඩු ගෙන්වා ගන්නා ලද බව, එම තේකුඩු ද තත්ත්වය පිළිබඳ පරීක්ෂා කිරීමට කටයුතු කර ඇති බව, සැපයුම්කරු විසින් සපයන අමු ආහාර ද්‍රව්‍ය ඇතැම් දිනවල ගුණාත්මක බවෙන් ඉතා පහළ මට්ටමක පැවැති බව පිළිගන්නා අතර, එසේ ගුණාත්මක බවෙන් පහළ මට්ටමක ඇති අමු ආහාර ද්‍රව්‍ය භාර නොගෙන ආපසු හරවා යවා ගුණාත්මක ආහාර ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට කටයුතු කරන බව.	ප්‍රමිතියක් සහිත තත්ත්වයෙන් ඉහළ ආහාර ලබාගැනීමට වගකිව යුතු නිලධාරින් කටයුතු කළ යුතුය.
(එ)	නාගොඩ ශික්ෂණ රෝහලේ පිරිසිදු කිරීමේ සේවාව සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	පිරිසිදු කිරීමේ සේවා කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව තෝරාගත් ලංසුකරුගේ සේවා ඉටුකිරීම අසතුටුදායක බව සෞඛ්‍ය ලේකම්ට පෙනීගිය හොත් හෝ කොන්ත්‍රාත්කරු ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කර ඇත්නම් කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධන බැඳුම්කර හිමිකම අහිමිකිරීමටද කොන්ත්‍රාත්තුව අවසන්කර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීමට සෞඛ්‍ය ලේකම්ට බලතල පැවරී ඇත. එසේ වුවද 2023 වර්ෂයේ පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍යවල තත්ත්ව පරීක්ෂාවේදී කාර්මික තාක්ෂණික ආයතනයේ (ITI) සාම්පල්	පිළිතුරු ඉදිරිපත් කළ කර නැත.	කොන්ත්‍රාත්කරු ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කර ඇති විට ගිවිසුම් ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව කටයුතු කළ යුතුය.

	පරීක්ෂණ වාර්තා අසමත්ව තිබියදී මෙන්ම රෝහල් අධ්‍යක්ෂ විසින් 2024 ජනවාරි 08 දිනැති ලිපිය මගින්, පිරිසිදු කිරීමේ සේවාව සපයන ආයතනය විසින් යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය තත්ත්වයෙන් බාල බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) වෙත දැනුම් දී තිබියදී එලෙස කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට හෝ කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීමට කටයුතු කිරීමකින් තොරව 2023/2024 වර්ෂය සඳහාද පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්තුව එම පෞද්ගලික ආයතනයටම ලබාදී තිබුණි.		
(ii)	ලංසු කොන්දේසි ප්‍රකාරව පිරිසිදු කිරිමේ සේවාව සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය නිසි ප්‍රමිතියකින් යුක්ත බවට කාර්මික තාක්ෂණ ආයතනයේ තත්ත්ව පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය එම වාර්තා ඉදිරිපත් කර නොතිබූ බවට තාක්ෂණික ඇගයීම් කමිටුව නිරීක්ෂණය කර තිබියදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව එම වාර්තා ඉදිරිපත් කිරීමට යටත්ව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සුදුසු බවට නිර්දේශ කර තිබුණි. කෙසේ වෙනත් 2023/2024 වර්ෂයට අදාළ තත්ත්ව පරීක්ෂණ වාර්තා 2024 වර්ෂය අවසානය දක්වා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබූ අතර සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්ද ඒ සම්බන්ධව අවධානය යොමුකර නොතිබුණි.	-එම-	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.
(iii)	කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව රෝහලේ පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සඳහා දිනකට කම්කරුවන් 140 ක් සහ වැඩ පරීක්ෂකයන් 06 දෙනෙකු සේවයේ යෙදවිය යුතු වුවද 2023 ඔක්තෝබර් සිට 2024 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ සෑම මසකම සේවයේ යෙදවිය යුතු කම්කරුවන් ප්‍රමාණය 207 සිට 40 දක්වා වූ පරාසයකින් අඩුවෙන් සේවයේ යොදවා තිබුණි. මේ අනුව දිනකට පැය 09 ක සේවාමුර වෙනුවෙන් කම්කරුවන් 140 දෙනෙකු සේවයේ යෙදවිය යුතු වුවත් සේවයේ යොදවා තිබූ කම්කරුවන් සංඛ්‍යාව 127 ක් පමණක් විය.	සේවකයින් අඩු වීම පිළිබඳ දිගින් දිගටම කොන්ත්‍රාත්කරු හා වැඩපරීක්ෂකවරුන් දැනුවත් කිරීම තුළින් සේවක අඩුව යම්තාක් දුරට අවමකර ගැනීමට හැකි වූ අතර අඩුවෙන් යොදවන ලද සේවකයින් වෙනුවෙන් එක් අයෙකුට රු. 450 බැගින් දඩ මුදල් අය කිරීමට ද කටයුතු කරන ලද බව.	කොන්ත්‍රාත් ගිවිසුම පරිදි සේවාවන් ලබාගැනීමට වගකිව යුතු නිලධාරින් කටයුතු කළ යුතුය.

(iv)	පිරිසිදු කිරීමේ සේවා සැපයුම් පුද්ගලික ආයතනයේ සේවයේ නියුතු සේවකයන් වෙනුවෙන් සේවා යෝජක ආයතනය විසින් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට හා සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල පිළිවෙලින් සියයට 12 සහ සියයට 03 යන දායක දෙකෙහි එකතුව සියයට 15 ක් ලෙස රු.1,207,478 ක මුදලක් සේවකයින්ගේ වැටුපෙන් අඩුකර රෝහල විසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබියදී කම්කරු නීතිරීති හා අදාළ අනපනත් උල්ලංඝනය කරමින් නැවතත් එම දායක මුදල් සේවක වැටුපෙන් අඩුකර කොන්ත්‍රාත්කරු විසින් රඳවා ගෙන තිබුණි.	සේවා යෝජක විසින් සේවකයන් වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ගෙවිය යුතු සියයට 3 ක දායකය හා සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු සියයට 12 ක දායකය සෑම මසකම කොන්ත්‍රාත්කරු විසින් රඳවාගෙන සේවකයින්ගෙන් අඩු කිරීම සිදු නොකරන ලෙසත් දැනුම් දීමට කටයුතු කරන අතර ඉදිරියේ දී තවදුරටත් එසේ කම්කරු නීති උල්ලංඝනය කිරීමක් සිදු වන්නේ නම් කොන්ත්‍රාත් ආයතනය අසාදු ලේඛනගත කිරීම සඳහා පියවර ගන්නා බව .	කම්කරු නීතිරීති, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් හා සේවක අර්ථසාධක අරමුදල් පනත්වලට අනුව දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

4.6 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සෞඛ්‍ය අමාත්‍යාංශය සතු අංක 32-2344 දරන වාහනයේ එන්ජිම ක්‍රියාවිරහිත වී ඇති බව 2020 ජනවාරි 24 දින රියදුරු විසින් අධ්‍යක්ෂ (ප්‍රවාහන) වෙත දන්වා තිබුණු අතර ඒ අනුව ඔහු විසින් මෙම වාහනය ඇස්තමේන්තුවක් ලබාගැනීම සඳහා 2020 ජනවාරි 27 දින නියෝජිත ආයතනයට යොමුකර තිබුණි. වසරකට වැඩිකාලයක් ගතවීමෙන් පසුව 2021 මාර්තු 06 දින මෙම වාහනය අමාත්‍යාංශයට රැගෙන ඒම සඳහා වැඩමූලික වෙත භාරදෙන ලෙස නියෝජිත ආයතනයට දන්වා තිබුණි. නැවත මෙම වාහනය පණ ගැන්වීමට නොහැකි බව වාහනයේ රියදුරු විසින් 2021මැයි 13 දින අධ්‍යක්ෂ (ප්‍රවාහන) වෙත දැනුම් දී තිබුණි. 2021 මාර්තු 10 දින වැඩමූලික හා ඉන්ජිනේරු විසින් වාහනය පරික්ෂා කර වාර්තාවක් ලබාදී තිබුණු අතර අධ්‍යක්ෂ (ප්‍රවාහන) විසින් 2021 මැයි 17 දින මෙම අලුත්වැඩියාව සඳහා වාහනය ගලවා බලා ඇස්තමේන්තුවක් ලබාදෙන ලෙස ආයතනයකට දන්වා තිබුණි. එම ආයතනයෙන්ද ලැබුණු ඇස්තමේන්තුවක් ගොනුවේ ඇතුළත් නොවූ අතර නැවත මෙම වාහනය පරීක්ෂණ ධාවනයේ යොදවා 2021 සැප්තැම්බර් 03 දින වැඩමූලික විසින් වාර්තාවක් ලබාදී තිබුණි.2021 සැප්තැම්බර් 08 දින මිල කැඳවීම් කර වැඩ මූලික විසින් ලබාදී තිබුණු නිර්දේශය අනුව අවම මිල ඉදිරිපත් කරන ලද	**Covid-**19 කාලය තුළ අමතර කොටස් මිල ගණන් තීරණය කිරීමට නියෝජිත ආයතනය අපොහොසත්වීම හේතුවෙන් ඇස්තමේන්තුවක් ලබාදීම ප්‍රමාදවූ අතර, මෙම රථය වසර 10 ට වඩා පැරණි රථයක්වීම නිසා අනුමත ආයතන මඟින් මිල ගණන් කැඳවීම සඳහා නැවත රැගෙනවිත් ඇති බව, ඉන් පසු යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය මත රථය ගලවා බලා ඇස්තමේන්තුවක් ලබාගැනීමට ජැකොමෝ ඔටෝ ගැස් කන්වර්ශන් වෙත යොමු කිරීමට කටයුතු කර ඇති අතර, එම ආයතනයෙන් ඇස්තමේන්තුවක් නොලද බැවින් ප්‍රවාහන වැඩමූලික විසින් රථය පරීක්ෂණ ධාවනයේ යොදවා වාර්තාවක් ලබාදී ඇති බව, එන්ජිම අලුත්වැඩියාවෙන් පසු රථය භාරදී තිබුණද රථයේ පිටත දිරාපත්ව පැවතීම හේතුවෙන් ධාවනය කර නොමැති අතර,	ස්වාධීන විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	ආයතනයට රු.394,703 කට පවරා තිබුණි. අලුත්වැඩියාවට වාහනය භාරදී මාස 13 කට පමණ පසුව බිල්පත්‍රය 2023 ජනවාරි 23 දින ඉදිරිපත් කර තිබුණු අතර එය 2023 මාර්තු 29 දින ගෙවීමට ඉදිරිපත් කර තිබුණි. මෙම වාහනයේ අලුත්වැඩියාවෙන් පසුව කිලෝ මීටර් 85,000 ක් ධාවනය සඳහා වගකීමක් ලබාදී තිබුණද වාහනය අලුත්වැඩියාවෙන් පසුව ධාවනය කළ බවට කිසිදු සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.	මෙම රථය ප්‍රාථමික සත්කාර ව්‍යාපෘතිය යටතේ වාහන අලුත්වැඩියා කිරීම සඳහා යෝජිත වාහන ලේඛනයට ඇතුළත් කර තිබූ බැවින්, පින්තාරු කිරීම සඳහා මුල්ලේරියාව අංගනයේ තාවකාලිකව නවතා තබා ඇති බව, 2022 ජූලි 22 දින මිළ ගණන් කැඳවා ඇති අතර, අලුත්වැඩියාව සඳහා 2022 දෙසැම්බර් 05 දින ආයතනය වෙත ප්‍රදානය කර ඇති බව.	
(ආ)	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සතු අංක PB-7902 දරන වාහනය සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 14 දින වැඩමූලික විසින් ලබාදී තිබුණු නිර්දේශයට අනුව 2021 දෙසැම්බර් 27 දින ආයතන 14 කින් මිල ගණන් කැඳවා තිබුණි. ආයතන 5 කින් ලැබී තිබුණු මිල ගණන් වලින් රු. 652,460 ක අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනයට අලුත්වැඩියාවේ විෂය පථය වෙනස් කර රු. 382,460 ක මුදලකට අදාළ අලුත්වැඩියාව ඉටු කිරිම සඳහා ප්‍රවාහන වැඩ මූලික 2022 පෙබරවාරි 02 දින නිර්දේශය ලබාදී තිබුණි. ඒ අනුව 2022 ජුනි 08 දින අදාළ ආයතනයට වාහනය යොමුකර තිබුණි. මෙම වාහනය බත්තරමුල්ල ප්‍රදේශයේ පාරක් අයිනේ දීර්ඝ කාලයක සිට නතර කර තිබෙන බවට විගණනයට ලැබුණු තොරතුරක් මත 2023 ජනවාරි 10 දින අමාත්‍යාංශයේ විමර්ශන අංශයේ හා ප්‍රවාහන අංශයේ නිලධාරීන් සමඟ පරීක්ෂා කරන ලදි. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විමර්ශන විසින් 2023 ජනවාරි 12 දින මේ පිළිබඳව සොයාබලා අවශ්‍ය කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ(ප්‍රවාහන) වෙත දන්වා තිබුණද 2025 ජනවාරි 02 දින මෙම වාහනයට අදාළ ලිපිගොනුව විගණනයට ඉදිරිපත් කරන තුරු කිසිදු ක්‍රියාමාර්ගයක් වගකිව යුතු නිලධාරින් විසින් ගෙන නොතිබුණු අතර මෙම වාහනය මුල්ලේරියාව වාහන අංගනයට රැගෙන ගොස් කිසිදු ඵලදායි කාර්යයකට නොයොදවා අංගනය තුළ ගාල් කර තිබුණි.	රියදුරු මහතා විසින් 2021 දෙසැම්බර් 13 සිදුකරන ලද ඉල්ලීම ප්‍රවාහන වැඩමූලික විසින් නිර්දේශ කර ඒ අනුව මිළ ගණන් කැඳවා අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් අලුත්වැඩියාවේ විෂය පථය වෙනස් කිරීමකින් තොරව **ECU** පද්ධතිය අළුතින් යෙදීම වෙනුවට අලුත්වැඩියා කිරීමට එකඟතාවය ලබාගෙන රු. 382,460.00 ක මුදලකට රථය අලුත්වැඩියා කිරීම සඳහා 2022 ජුනි 08 දින අදාළ ආයතනය වෙත යොමුකර ඇති බව,ජෙ.ස.ලේ. (හදිසි වැටලීම්) විසින් 2023 ජනවාරි 12 දිනැතිව අධ්‍යක්ෂ (ප්‍රවාහන) වෙත යොමු කළ ලිපියට අනුව, අලුත්වැඩියා කර නොමැති වුවත් රථය ආපසු රැගෙනවිත් මුල්ලේරියාව අංගනයේ ගාල්කර ඇති බව.මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයේදී ප්‍රවාහන වැඩමූලික නිලධාරියා වෙත අවවාද කිරීමේ ලිපියක් නිකුත් කර ඇති අතර, මෙම රථය අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන බැවින් ඉදිරියේදී සිදුකිරීමට නියමිත වෙන්දේසිය සඳහා යොමුකර ඇති බව.	වාහන අලුත්වැඩියා කටයුතු රජයට උපරිම වාසි වන ලෙසත් වත්කම් ආරක්ෂාකාරී වන ලෙසත් ඉටුකිරීමට වගකිව යුතු නිලධාරින් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඇ)	පොළොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකයේ පවතින රුධිර කාන්දුකරණය සඳහා භාවිතා කරන Hemodialysis යන්ත්‍ර 04 ක් 2025 පෙබරවාරි 13 වන විගණන දින වන විට අක්‍රීය මට්ටමේ පවතින බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.	යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන බැවින් භාවිතයෙන් ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස අදාළ දේශීය නියෝජිත ආයතනය විසින් දැනුම් දී ඇති බව, මේ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයට උපදෙස් ලබා දී ඇති බව.	යන්ත්‍ර පරීක්ෂා කර කඩිනමින් සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ඕස්ට්‍රේලියානු ණය ආධාර යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ සහ රත්නපුර ශික්ෂණ රෝහලේ ස්ථාපිත කර තිබුණු සායනික අපද්‍රව්‍ය කළමනාකරණ යන්ත්‍ර (මෙටාමයිසර් යන්ත්‍රය) පිළිවෙලින් 2024 අප්‍රේල් 22 සහ අප්‍රේල් 23 දින සිට අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි. ඒ හේතුවෙන් ගොඩගැසෙන ආසාදිත හා තියුණු අපද්‍රව්‍ය නිසා රෝහල් පරිශ්‍රය තුළ ගැටලු මතු වී තිබුණි.	ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ සායන අපද්‍රව්‍ය ඉන්සිනරේටර් මෙම මෙටාමයිසර් යන්ත්‍රවල සේවා නඩත්තු කටයුතු සිදු කරන ලද පුද්ගලික සමාගම සෞඛ්‍ය අමාත්‍යාංශය හා පැවැති ගිවිසුම අවසන් වී ඇති බවත් නඩත්තු හා සේවා කටයුතු වලින් ඉවත් වී ඇති බවත් දන්වා ඇති බව, එබැවින් මෙම යන්ත්‍රය සම්බන්ධව ඉදිරි කටයුතු තීරණය කිරීමට ඉංජිනේරු සභාපතිත්වයෙන් යුතුව සෞඛ්‍ය ලේකම් විසින් කමිටුවක් පත් කර ඇති බවත් එම කමිටු නිර්දේශය අනුව ගත යුතු ක්‍රියාමාර්ග ඉදිරියේ දී දැනුම් දෙන බවත් දන්වා ඇති බව.	යන්ත්‍රය පරීක්ෂා කර කඩිනමින් සුදුසු පියවර ගත යුතුය.
(ඉ)	2017 ජුනි 30 දින රත්නපුර ශික්ෂණ රෝහල වෙත භාරදී තිබුණු ලේ බැංකුව පවතින ගොඩනැගිල්ලේ ස්ලැබ් එක තුළින් 2019 වර්ෂයේ සිට ජලය කාන්දු වන බව ලේ බැංකුවේ නිලධාරීන් විසින් රෝහල් අධ්‍යක්ෂ වෙත දැනුම් දී තිබුණද, 2024 නොවැම්බර් 28 දින වන විටත් එම තත්ත්වය එලෙසින්ම පැවතුණි.	CECB ආයතනයෙන් ඇස්තමේන්තුවක් සකස් කර ඇස්තමේන්තුවේ ඇතුළත් වැඩ විෂයන් අනුමත කර ගැනීමට 2025 මාර්තු 12 දිනැති ලිපිය මඟින් ගොඩනැගිලි හා ඉංජිනේරු අංශ වෙත යොමු කර ඇති අතර ප්‍රතිපාදන සහ අනුමැතිය ලද විගස අදාළ කාර්යය ඉටු කරන බව.	රජයේ වත්කම් නිසි පරිදි අලුත්වැඩියා කර ආරක්ෂාකාරීව පවත්වාගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	උතුරු කොළඹ ශික්ෂණ රෝහල සඳහා වෙන් වූ රෝහලේ සිට කිලෝමීටර 2.5 ක් පමණ දුරින් ඇලපිටිවල නිවාස සංකීර්ණයේ උපලේඛන ගත නිවාසයක් ද පොදු සේවා නිවාස 25 ක්ද පැවතුණි. මෙම ඇලපිටිවල නිවාස සංකීර්ණයේ නිවාස විවාහක වෛද්‍යවරුන් සඳහා පමණක් වෙන්කර තිබුණු අතර 2025 ජනවාරි මස 15 හා 16 යන	නිවාස අලුත්වැඩියා කිරීම සඳහා පරීක්ෂා කිරීමට කමිටුවක් පත්කර ඇති අතර එම වාර්තාව අනුව ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය මඟින්	වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

	දිනවල සිදු කළ භෞතික පරීක්ෂාවේදී මෙම නිවාස වලින් 19 ක් කිසිවෙකු පදිංචි නොවී පැවතුනි. ඉන් නිවාස 18 ක් වසර 4 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පවතින බව විගණනයට අනාවරණය විය. මෙම නිවාස හා අවට පරිසරය නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් දැනට භාවිත නිවාස හා භාවිත නොවන නිවාස වල්බිහිවෙමින් පැවතුණි.	ඇස්තමේන්තු කැඳවා ඉදිරි කටයුතු කරමින් පවතින බව, ලැබෙන ප්‍රතිපාදන අනුව රජයේ නිවාසද අලුත්වැඩියා කටයුතු කරන බව.	
(උ)	උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ ඇලපිටිවල නිවාස සංකීර්ණයේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට වෙන් කර තිබූ Fගොඩනැගිල්ල පිටු පස කොටසේ මෙම ගොඩනැගිල්ලේ ගලි වලවල් ඉදි කර තිබුණු අතර එම බිම් කොටසේ බාහිර පාර්ශවයක් විසින් කෙසෙල් වගා කර තිබුණි. මෙම ඉඩම වටා ආරක්ෂිත වැටක් හෝ මායිම් හෝ සකස් කර නොමැති අතර මෙම ඉඩමේ රෝහලේ හිමිකාරීත්වය හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිමිකාරත්වය පරීක්ෂා කර වැට මායිම් සකස් කර රජයේ දේපළ ආරක්ෂාවට පියවර ගෙන නොතිබුණි.	F ගොඩනැගිල්ල පිහිටා ඇති භූමියේ භූමි සැළැස්ම සොයා බලා එසේත් නොමැති නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ රෝහලේ හිමිකාරිත්වය තහවුරු කර ගැනීමෙන් පසු වැට මායිම් සකස් කර රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීමට අවශ්‍ය වන පියවර ගැනීමට කටයුතු යොදා ඇති බව.	ඉඩම් අයිතිය තහවුරු කර ගැනීමටත් ආරක්ෂාකාරීව පවත්වාගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඌ)	පොළොන්නරුව ශික්ෂණ රෝහලේ බන්තු රේඛන අංශය මගින් 2024 වර්ෂයේදී අම්පාර, ත්‍රිකුණාමලය, මාතලේ, දඹුල්ල, මඩකළපුව, මොණරාගල, බදුල්ල ආදී ප්‍රදේශවල රෝගීන් සේවය ලබා ගන්නා නමුත් ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති වීම, ව්‍යායාම **ECG** යන්ත්‍ර 03 ම සහ පැය 24 රුධිර පීඩන යන්ත්‍ර 03 ම අක්‍රිය ව පවතින අතර අදාළ යන්ත්‍ර සැපයුම් සමාගම් වැසී ගොස් ඇති බැවින් අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයක පැවතිම හේතුවෙන් රෝගී සත්කාර සේවාවන්ට බාධාවක් වී තිබුණි.	ව්‍යායාම **ECG** යන්ත්‍ර 03 හා පැය 24 රුධිර පිඩන යන්ත්‍ර 03 අදාළ මව් සමාගම් වැසී ගොස් ඇති බැවින්, එම ආයතනයන්ට අනුබද්ධ ආයතනයනක් වෙතින් මිල ඇස්තමේන්තු ලබා ගත් නමුත්, මෙම ආයතන එකිනෙකට සම්බන්ධ නොමැති බැවින්, මෙම යන්ත්‍ර සඳහා නියෝජ්‍යත්ව සහතිකය (NMR සහතිකය) ලබාදීමට නොහැකි වී ඇති බව, ඒ අනුව ඉදිරියේදි මීට අදාළව ලිපි ලබාදෙන බවත්, අලුත්වැඩියා කටයුතු කඩිනමින් ඉටු කර දෙන බවත්, දන්වා ඇති බව.	රෝගී සත්කාර සේවා බාධාවකින් තොරව පවත්වා ගැනීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කරගැනීමට, යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු කඩිනමින් අවසන් කර කාර්යක්ෂමව උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.
(එ)	කුරුණෑගල ශික්ෂණ රෝහල පවත්වාගෙන යන භූමිය කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නමින් පවතින අතර කුරුණෑගල රෝහල නමින් නිදහස් කරගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම නිරවුල් කිරීම සඳහා 2024 ජුලි 12 දිනැති ප්‍රාදේශීය ලේකම්ගේ 4/5/1/60 දිනැති ලිපිය මගින් රෝහල් ඉඩමේ පදිංචිව සිටින අනවසරකරුවන් පිළිබඳ වාර්තාවක් ඉල්ලා තිබුණද 2024 ඔක්තෝබර් මස විගණිත අවස්ථාව දක්වා එම වාර්තා ලබාදීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණු අතර අනවසර	අනවසර පදිංචිකරුවන් පිළිබඳ විස්තර ලබාදීම සඳහා රෝහල් ඉඩමේ මැනුම් කටයුතු අවසන් කර වාර්තාවක් ලබාදිය යුත අතර එම වාර්තාව මෙතෙක් ලැබී නොමැති හෙයින් විස්තර ලබාදීම ප්‍රමාදව ඇති බව, වාර්තාව ලද විගස අවශ්‍ය තොරතුරු ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දී ඉදිරි කටයුතු සිදු	අදාළ වාර්තාව කඩිනමින් ලබාගෙන දේපළ අයිතිය නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය.

	පදිංචිකරුවන් හඳුනාගැනීමටද ක්‍රියාකර නොතිබුණි.	කරන බව.	
(ඒ)	වෛද්‍ය සැපයුම් අංශය විසින් 2021 සිට 2022 දක්වා කාලපරිච්ඡේදය තුළ මහනුවර ජාතික රෝහල වෙත ලැබී තිබුණු වටිනාකම ආසන්න වශයෙන් රු. මිලියන 14.57 ක් වූ උපකරණ තොගයක් ලද දින සිට භාවිතා කිරීමෙන් තොරව ඌණ උපයෝජිතව 2024 අගෝස්තු 29 දින වන විටද ගබඩාවේ රඳවා තිබුණි.	අයිතමයන් වලින් Bi pap Machine, High flow Oxygen Therapy, Portable OT Lamp හා Vital Signs Monitor උපකරණ භාවිතයට ගැනීමේදී අවශ්‍ය කරන **Accessories** මිලදී ගැනීමට දේශීය නියෝජිතයන්ගේ හෝ විවෘත වෙළඳපොලෙහි නොමැති බව, (NMRA සහතික නොමැත). Micro Hemoteri Centrifuge – **03** හා Plus Oxy meter Finger Tip – Dental Light Curing machin 123 වෙනත් අංශ හා රෝහල්වලට නිකුත් කර ඇති බව.	-එම-
(ඔ)	නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේ ඉදිකිරීම් අර්ධ වශයෙන් නිමවා ඇති ඉතා පැරණි වර්ග අඩි 3600 ක පමණ විශාලත්වයෙන් යුතු, ගිලා බැසීමට හෝ කඩා වැටීමේ අවදානමක් පවතින ගොඩනැගිල්ලක්, රෝහල් පවිත්‍රතා සේවකයන් භාවිතා කරමින් පවතින අතර එම ගොඩනැගිල්ල කඩිනමින් විධිමත්ව ඉවත් කර එම පරිශ්‍රය වඩාත් ඵලදායී කාර්යයකට යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පවිත්‍රතා අංශය එම ස්ථානයෙන් ඉවත් කර ඇති බව, අපහරණ ගබඩාව සඳහා සුදුසු ස්ථානයක් ලද පසු කඩා ඉවත් කිරීමට සැළසුම් කර ඇති බව.	වත්කම් කඩිනමින් වඩාත් ඵලදායී කාර්යයකට යොදවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඕ)	නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලට අයත් හෙක්ටයාර් 0.4401 ක භූමි ප්‍රමාණයක්, පවුල් 07 ක පදිංචිකරුවන් 12 දෙනෙකු විසින් වසර 15 කට ආසන්න කාලයක සිට අනවසරයෙන් භුක්ති විඳිමින් පවතින නමුත් ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇති අතර අදාළ අංශ මඟින් ඉදිරි කටයුතු මෙහෙයවනු ලබන බව.	අනවසරයෙන් භුක්ති විඳින්නන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන දේපළ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය.
(ක)	නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල පිහිටි ඉඩම රෝහලට පවරා ගැනීමට හා හෙක්ටයාර් 4.6824 ක නව රෝහල් ඉඩම හා ගොඩනැගිලි, තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අදාළ තක්සේරුව සිදු කර දෙන මෙන් දන්වා ඇති අතර අදාළ වාර්තාව ලද විගස ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව.	ඉඩම් හා ගොඩනැගිලි අයිතිය රෝහලට ලබාගැනීමට හා තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඛ)	නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල සතු ඉඩමෙන් පර්චස් 15 ක භූමි ප්‍රමාණයක්, ප්‍රජා ශාලාවක් ඉදි කිරීම සඳහා නුවරඑළිය මහනගර සභාව වෙත පවරා දී තිබුණද එම ඉඩම වාහන ගාල් කිරීම සඳහා	නැවත රෝහල වෙත අදාළ ඉඩම පවරා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති බව.	වගකිවයුතු නිලධාරීන් සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කළ යුතුය.

	යොදාගෙන තිබුණු අතර ඉඩම ලබාදුන් කාර්යයට යොදා නොගැනීම හේතුවෙන් ඉඩම නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.		
(ග)	රජයේ අරමුදල් යොදවා සංවර්ධන කටයුතු සිදු කිරීමට පූර්වයෙන් අදාළ භූමිය විධිමත් පරිදි මැණුම් කර අයිතිය නීත්‍යානුකූල පරිදි පවරා ගැනීම සඳහා හිමිකම් සහතිකයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, රුපියල් මිලියන ගණනක දේශීය හා විදේශීය අරමුදල් යොදවා සංවර්ධනය කර තිබුණු අනුරාධපුර ශික්ෂණ රෝහල පිහිටි භූමියේ හිමිකම රෝහල වෙත හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.රෝහල් භූමියේ හිමිකම නීත්‍යානුකූල ලෙස පවරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් රෝහල් භූමියේ ආරක්ෂාව සනාථ කිරීමට නොහැකි වී තිබුණි. එසේම රෝහල් භූමියෙන් කොටසක් අනවසර පදිංචිකරුවන් 12 දෙනෙකු විසින් අල්ලාගෙන තිබුණු අතර ඊට අදාළ නඩු තීන්දුවකින් සන්තකය ආපසු පවරා ගැනීමට අධිකරණ නියෝගයක් ලබා දී තිබුණ ද, විගණිත දින වූ 2024 දෙසැම්බර් වන විටත් එම ඉඩම් නැවත රෝහලේ භාරයට ලබා ගැනීමට රෝහල් අධිකාරිය කටයුතු කර නොතිබුණි.	මිනින්දෝරු දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේ මැනුම් කටයුතු ආරම්භ කළත් අතරමඟදී එය නවතා දමන ලද බව, 2025 මාර්තු 17 වන දින සිට නැවතත් අප රෝහලේ මැනුම් කටයුතු ආරම්භ කර ඇති අතර එම කටයුතු අවසන් වීමෙන් අනතුරුව විධිමත්ව රෝහල් භූමියෙහි අයිතිය සෞඛ්‍ය ලේකම් වෙතට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකරනු ලබන බව, අනවසර පදිංචිකරුවන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන, ඉඩමෙහි අයිතිය නිරවුල්ව පවරා ඒ සඳහාද පැවරුම් සහතිකය ලබාදෙන බව.	ඉඩම් අයිතිය රෝහලට ලබාගැනීමට හා අනවසරයෙන් භුක්ති විදින්නන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන දේපල නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය.
(ඝ)	අනුරාධපුර ශික්ෂණ රෝහලේ අපද්‍රව්‍ය පිලිස්සීම සඳහා භාවිතා කිරීම පිණිස 2014 වර්ෂයේ දී ස්ථාපිත කර තිබුණු දාහක යන්ත්‍රය 2022 වර්ෂයේ සිට අක්‍රිය වී තිබුණු අතර එය නැවත අලුත්වැඩියා කිරීම සඳහා 2022 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී බදු රහිතව රු. 392,895 කට ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැති ලබා දී තිබුණද, විගණිත දිනය වූ 2024 දෙසැම්බර් 11 දින වන විටත් එකී යන්ත්‍රය අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම හෝ සිදුකර නොතිබූ අතර, යන්ත්‍රය විනාශ වීමට ඉඩහැර තිබුණි.	රෝහලේ උද්ගතවී ඇති දැඩි කසළ ගැටළුව හේතුවෙන් මෙම පැරණි යන්ත්‍රය නැවත අලුත්වැඩියා කර භාවිතයට ගතහැකිද යන්න පිළිබඳව කරුණු අධ්‍යනය කරමින් පවතින අතර අලුත්වැඩියා කළහැකි වුවහොත් අපහරණය නොකොට ඉදිරි කසල කළමනාකරණ කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු සැලසුම් කර ඇති බව.	යන්ත්‍ර නිෂ්කාර්යව රඳවා නොගෙන ඵලදායි ලෙස භාවිතයට ගැනීමට හෝ සුදුසු වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය.
(ච)	අනුරාධපුරය ශික්ෂණ රෝහල සතු Metamizer යන්ත්‍රය හා Incinerator යන්ත්‍ර සක්‍රිය තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හා නව Incinerator යන්ත්‍රය අක්‍රිය තත්ත්වයට පත්වීම නිසා සායනික අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් 2023 වර්ෂයේ දී, 2024 පළමු මාස දෙක හා 2024 අගෝස්තු හා ඔක්තෝබර් යන කාලවලදී පිළිවෙලින් බාහිර පාර්ශවයක් වෙත රු.මිලියන 39.95, රු.මිලියන 24.14, රු.මිලියන 49.09 ක් ලෙස එකතුව රු.මිලියන 113.18 ක් ගෙවා තිබුණි. මෙම උපකරණ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම	කැබලි කරන ලද කසල බැහැර කිරීම සඳහා සුදුසු භූමියක් නම් කර නොදීම හේතුවෙන් කැබලි කරන ලද කසල විශාල තොගයක් රෝහල් පල්දෝරු පද්ධතිය ආශ්‍රිතව එක්රැස් වී ඇති බැවින් මෙටාමයිසර් යන්ත්‍රය වසර කිහිපයක සිට කසල කළමනාකරණ කටයුතු සඳහා භාවිතයට නොගන්නා අතර එම යන්ත්‍රය අපහරනය කිරීම සඳහා	රජයට අවාසිදායක නොවන ලෙස තීරණ ගැනීමට වගකිව යුතු නිළධාරීන් කටයුතු කළ යුතුය.

	මගින් බාහිර පාර්ශවයකට ගෙවනු ලබන මුදල අවම කරගැනීමේ හැකියාව සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. තවද කෑගල්ල ශික්ෂණ රෝහලට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ පිරිවැය එ.ජ. ඩොලර් 701,335.83 ක් පමණ වූ Metamizer යන්ත්‍රයක් සපයා තිබුණද, එය අක්‍රීය වීම හා ඉවත් කරන අවශේෂ ද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවේදයක් නොමැති වීම මත එම යන්ත්‍රය 2024 අප්‍රේල් 25 දින සිට මුළුමනින්ම භාවිතයට ගැනීමෙන් තොරව භාවිතයෙන් ඉවත් කොට තිබුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇති බව, පැරණි දාහක යන්ත්‍රය රෝහලේ ධාරිතාව සඳහා ප්‍රමාණවත් නොවීම, අධික නඩත්තු පිරිවැය හා නිරන්තර අලුත්වැඩියා කිරීම් වලට භාජනය කිරීමට සිදුවීම හා අමාත්‍යාංශය වෙතින් නව කසළ දහන යන්ත්‍රයක් ලබාදීමට නියමිත බව දැන්වීම, හේතුවෙන් භාවිතයට ගැනිම අත්හිටවූ අතර ඒ වෙනුවට සැපයුම්කරුවකු තෝරාගෙන සායනික කසළ බැහැර කිරීමට කටයුතු කළ බව.	
(ඡ)	කොළඹ ජාතික රෝහල වෙත එ. ජ. ඩොලර් 1,350,000 කට මිලදීගෙන තිබුණු PET-CT Scanner යන්ත්‍රය 2016 ජූනි 10 දින අපස්මාර ඒකකයෙහි ස්ථාපිත කර වසර 03ක වගකීම් කාලය තුළ දින 13ක් හා 2019 සිට 2023 දක්වා වූ වර්ෂයන්හි දින 20 ත් දින 28 ත් අතර ඉතා අඩු දින සංඛ්‍යාවකට පරීක්ෂණ සීමා වී තිබුණි. අධික විකිරණශීලී FDG නැමැති ද්‍රව්‍ය රෝගියාට එන්නත් කර සිදු කරනු ලබන PET-CT Scan පරීක්ෂණය සඳහා අඛණ්ඩ විදුලි සැපයීමක් යන්ත්‍රයට අවශ්‍ය වන බැවින් මෙම PET-CT Scanner යන්ත්‍රයට අදාළ UPS (Uninterruptable Power Supply) උපකරණයේ ඇති බැටරිවල ආයු කාලය අවසන් වී ඇති බවට 2023 නොවැම්බර් 02 දින අදාළ අංශයේ විකිරණ ශිල්පියා විසින් රෝහල් කළමනාකරණය දැනුවත් කර තිබුණ ද අවශ්‍යතාවය සම්පූර්ණ කර දී නොතිබුණි.	එම අවස්ථාවේදී යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපකරණ කිහිපයක් නොමැති වීම හේතුවෙන් පරීක්ෂණ ආරම්භ කිරීම නොහැකි වී ඇති බව, විකිරණ ශිල්පීන්ගේ පවතින හිඟය නිසා ප්‍රමාණවත් පරීක්ෂණ සංඛ්‍යාවක් සිදු කිරීමට නොහැකි වී ඇති බව, ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් UPS බැටරි මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව.	යන්ත්‍ර ස්ථාපනය කිරීමට පෙර යන්ත්‍රය ක්‍රියාකාරීත්වයට අවශ්‍ය අනෙකුත් පහසුකම් හා උපාංග සපයා ගැනීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය.
(ජ)	ශ්‍රී ලංකා ජාතික රෝහලේ අපස්මාර ඒකකයට ලද TECHIFINE(DC 12-100) UPS බැටරි 96 න් බැටරි 32 ක් පමණක් 2023 ඔක්තෝබර් 17 දින UPS උපකරණයේ ස්ථාපිත කර වර්ෂයකට ආසන්න කාලයක් MRI Scanner යන්ත්‍රයේ පරිපථයට සම්බන්ධ නොකර පැවති අතර ඉතිරි බැටරි 64 න් බැටරි 40 ක් රිජ්වේ ආර්යා ළමා රෝහල වෙත ලබා දී තිබුණු අතර බැටරි 24ක භාවිතය පිළිබඳ කිසිදු සටහනක් විගණනයට ඉදිරිපත් නොවීය. UPS උපකරණයට සඳහා වර්ග දෙකක බැටරි එකට සම්බන්ධ කිරීම බැටරි සපයන ලද ආයතනය විසින් නිර්දේශ නොකලද බැටරි 64 වෙනුවට 2023 ජූලි මස නිෂ්පාදිත හා පොලිතින් ආවරණ (මුද්‍රා) රහිතව ඉන්දියානු රු.16,763 ක් වූ OPTI 100 (12v /100 Ah) බැටරි 64, ක් ලබා දී තිබූ අතර විගණන අවස්ථාව වන විට එය	පිළිතුරු ඉදිරිපත් කර නැත.	ස්වාධීන විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

භාවිතයෙන් තොරව මාස 14 ක් පමණ කාලයක් ගතවී ඇති බැවින් බැටරි ගබඩා කිරීමේ උෂ්ණත්වය හා කාලය අනුව UPS බැටරිවල ධාරිතාවයට සිදුවී ඇති හානිය පිළිබඳව හා වර්ග දෙකක බැටරි එකට සම්බන්ධ කිරීම පිළිබඳව ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ වගකිව යුතු නිලධාරීන්ගේ නිර්දේශය ලබා ගැනීමක් සිදු කර නොතිබුණි.

4.7 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ වටිනාකම රු.මිලියන 31.98 ක් වුවත් රෝහල් හා ආයතන විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයන්වලට අනුව එම වටිනාකම රු. මිලියන160.64 ක් විය. ඒ අනුව රු.මිලියන 128.66 ක වෙනසක් නිරීක්ෂණය විය.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු අතර නිවැරදි තොරතුරු පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(ආ) වසංගත රෝග විද්‍යා අංශය හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් පහත සඳහන් එන්නත් කල් ඉකුත්වීම් ලේඛනගත කර නොමැති බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.		
(i) කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර හා සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ තෙවන අතිරේක මූල්‍යකරණ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මඟින් 2021 දෙසැම්බර් සහ 2022 ජනවාරි මාසවල රු.මිලියන 16,102ක පිරිවැයකට කොවිඩ් 19 රෝගය සඳහා ෆයිසර් එන්නත් මාත්‍රා මිලියන 14ක් මිලදී ගෙන තිබුණි. මෙම එන්නත් වලින් කල් ඉකුතු වූ එන්නත් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කරන මෙන් ඉල්ලීම් කළද එම තොරතුරු 2025 මාර්තු 14 දින දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මධ්‍යම එන්නත් ගබඩාවේ තොග ලේඛනයට අනුව මෙම ව්‍යාපෘතිය යටතේ හා වෙනත් ක්‍රම යටතේ ලැබුණු ෆයිසර් එන්නත් මාත්‍රා මිලියන 20.7 ක් එකට තොග ලේඛනයට ඇතුළත් කර තිබුණු අතර ඉන් එන්නත් මාත්‍රා මිලියන 7.5ක් මධ්‍යම එන්නත් ගබඩාව තුළම කල් ඉකුත් වී තිබුණි. මධ්‍යම එන්නත් ගබඩාවෙන් නිකුත් කරන ලද එන්නත් වලින් කොපමණ එන්නත් ප්‍රමාණයක් එකී ආයතන තුළදී කල් ඉකුත් වී තිබේද යන්න පිළිබඳ තොරතුරු මධ්‍යම එන්නත් ගබඩාව සතු නොවීය.	-එම-	විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 42 (අ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් ඉල්ලා ඇති තොරතුරු හා අනෙකුත් සාක්ෂි ලබා නොදෙන සෑම තැනැත්තෙකුම වරදක් සිදුකරන ලෙස සලකා කටයුතු කළ යුතුය.

(ii)	කොවිඩ් 19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතිය මඟින් ප්‍රතිපූර්ණය කරන ලද එ.ජ.ඩොලර් මිලියන 105 ක් හා ඉතිරි මුදල අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මඟින් වැයකර ඒකකයක් එ. ජ. ඩොලර් 7 බැගින් Sino pharm එන්නත් මාත්‍රා මිලියන 16.86 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් එන්නත් මාත්‍රා මිලියන 1.78 ක ප්‍රමාණයක් මධ්‍යම එන්නත් ගබඩාව තුළ කල් ඉකුත්ව තිබුණි. එසේම මධ්‍යම එන්නත් ගබඩාවෙන් නිකුත් කරන ලද එන්නත් වලින් කොපමණ ප්‍රමාණයක් එකී ආයතන තුළ දී කල් ඉකුත්වී ද යන්න පිළිබඳව තොරතුරු මධ්‍යම එන්නත් ගබඩාව තුළ නොතිබුණි.	-එම-	-එම-
(ඇ)	වෛද්‍ය සැපයීම් අංශයට අයත් ඖෂධ ගබඩාවල 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ සිදුවී ඇති බවට හඳුනාගෙන තිබුණු ඖෂධ හානි හා පාඩු සිද්ධීන් 285කට අදාළව තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට ඇති රු.මිලියන 452.27 ක් වූ පාඩු මූල්‍ය ප්‍රකාශවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.	-එම-	අදාළ සියළු තොරතුරු ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශ නිවැරදිව පිළියෙල කළ යුතුය.

4.8 අනාර්ථික ගනුදෙනු.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේදි රුපියල් මිලියන 34.2 ක් වැයකර අමාත්‍යාංශය විසින් මිලදිගෙන 2022 දෙසැම්බර් 16 දින සිට 2023 ජුනි 28 දින දක්වා කාලය තුළදි රෝහල් වෙත ලබාදෙන ලද Automated Immunoassay/ Hormone analyzer (Mindray Clia 2000i) උපකරණ 10 යොදාගෙන පරීක්ෂණයන් සිදුකිරීම ආරම්භ කිරීම සැලකිය යුතු ලෙස ප්‍රමාද වී ඇති බව හෝ 2025 ජනවාරි 23 දිනය දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. මේ අනුව මෙම මිලදි ගැනීම, අවශ්‍යතාවය සහ පාවිච්චි කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් සම්පත් සපයාගැනීමේ හැකියාව පිළිබඳව අධ්‍යයනයකින් තොරව සිදුකර ඇති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය තුළ උපකරණ 04 ක් වෙනුවෙන් වැයකරන ලද රු. මිලියන 13.68 ක මුදල සම්පූර්ණයෙන්ම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. මෙම උපකරණය මඟින් පරීක්ෂණ වර්ග 49 ක් සිදුකිරීමේ හැකියාව පැවතියද ඉන් පරීක්ෂණ වර්ග 08 ක් පමණක් රෝහල් විසින් සිදුකර තිබුණු අතර සත්‍ය	ඇනලයිසරය භාවිතයෙන් සිදුකළ හැකි විශේෂ පරීක්ෂණ අතර වඩාත් සුලබව කිරීමට සිදුවන පරීක්ෂණ 05 විගණිත දිනය වන විටත් සිදුකරමින් පැවතුණ බව, ඉතිරි පරීක්ෂණ සිදුකරන්නේ නම් ඒ සඳහා විශේෂිතවූ තත්ත්ව පාලන QC හා Calibrators ද ප්‍රතික්‍රියක ද (Reagent) අවශ්‍ය වන බව, එම QC හා Calibrators හා ප්‍රතික්‍රියකවල මිළ ගණන් ඉතා අධික වන බැවින් සුලබව සිදුකරණ පරීක්ෂණ වර්ග 05 ක් පමණක් සිදුකරන බව, Reagent pack එකක් මඟින් Test 100ක සංඛ්‍යාවක් ඉටුකළ හැකි වුවද , එතරම් Test ප්‍රමාණයක් සිදුකිරීමට නොලැබෙන හෙයින්	මිලදී ගැනීම සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	අවශ්‍යතාවය හඳුනාගෙන එම පරීක්ෂණ පමණක් සිදුකිරීමේ ධාරිතාවය සහිත උපකරණ මිලදි ගත්තේ නම් මීට වඩා අඩු ඒකක මිලක් යටතේ උපකරණ මිලදි ගැනීමට හැකියාව පැවති බව විගණනයේදි නිරීක්ෂණය විය. මෙම උපකරණය සම්බන්ධයෙන් මාතලේ රෝහලට අදාළව සිදුකරන ලද වැඩිදුර පරීක්ෂාවේදි යන්ත්‍රය ඌණ උපයෝජිතව පැවතුණද එය ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (Consumables) හා ප්‍රතික්‍රියක මිලදීගැනීම වෙනුවෙන් වාර්ෂිකව රුපියන් මිලියන 12 ඉක්මවූ පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.	අමතරව Calibrators, QC හා Reagent සඳහා විශාල වියදමක් දරා එම පරීක්ෂණ සඳහා යොමුවීම පිරිවැය ඵලදායි නොවන බව.	
(ආ)	මහමෝදර ශික්ෂණ රෝහල සඳහා 2009 වර්ෂයේදී ආධාර වශයෙන් ලැබී තිබුණු Hydroclave අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය රෝහලට ලද දින සිට භාවිතා කර නොතිබියදී ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල සඳහාද එම සමාගමෙන්ම එකී සන්නාමය යටතේම සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයක් (උපකරණයක්) 2023 දෙසැම්බර් 28 දින මිලට ගෙන තිබුණි. නමුත් මෙකී යන්ත්‍රය භාවිතා කළද ආසාධිත අපද්‍රව්‍ය ප්‍රමාණයේ වෙනසක් නොවීම, තෙත් බවක් ඇතිවීම සහ දුගඳ හැමීම, Shredder එකක් භාවිතා කරගත හැකි වුවද එය ප්‍රායෝගික නොවන හා වියදම් අධික වීම, Hydroclave උපකරණය නිසි පරිදි ක්‍රියාත්මක වන බවට ක්ෂුද්‍ර ජීවී විශේෂඥ වෛද්‍යතුමියගෙන් තහවුරුවක් ලබා නොගැනීම යනාදිය හේතුවෙන් රෝහල ආරම්භ කර දින 05 ක පමණ කාලයක් භාවිතයෙන් පසුව 2024 මාර්තු 12 න් පසුව අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා භාවිතයට ගත නොහැකිවී තිබුණු අතර ඒ සඳහා වැය කළ මුදල් නිශ්කාර්ය වී තිබුණි. ඒ අනුව පෞද්ගලික සැපයුම්කරුවෙකුට රෝහලේ සායනික අපද්‍රව්‍ය රැගෙනයාමට පැවරීම හේතුවෙන් 2024 මැයි සිට 2024 දෙසැම්බර් අග දක්වා එකතුව රු.මිලියන 8.14 ක් ගෙවා තිබුණි.	මෙම අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය ලබාදීමට පෙර රෝහල් බලධාරීන් වෙතින් හෝ මෙම විෂය සම්බන්ධ විශේෂඥ දැනුම ඇති නිලධාරීන් වෙතින් පූර්ව විමසීමක් හෝ නිර්දේශ ලබාගැනීමක් සිදුකර නොමැති බව, මෙම යන්ත්‍රය නව රෝහල විවෘත කිරීමෙන් පසුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කළද, ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ ගැටලු සහගත තත්වයන් පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කරන ලද බව, අනතුරුව අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටලුවට පිළියමක් වශයෙන් ඒ වනවිටත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගිවිසුම් ගත ආයතනයක් වන සිසිලිහනාරෝ ආයතනය වෙත සායනික අපද්‍රව්‍ය ලබාදීම සිදුකරන අතර, අප රෝහලද එකී ගිවිසුමේ සේවාලාභී ආයතනයක් ලෙස ඇතුළත් වී ඇති බැවින් අදාළ ගිවිසුම් ප්‍රකාරව එම සේවාව වෙනුවෙන් බිල්පත් නිරවුල් කරන බව.	ප්‍රසම්පාදනයේදී රජයට අලාභයක් සිදුනොවන ආකාරයට ගිවිසුම්ගත විය යුතු අතර සිදුවී ඇති පාඩුවට වගකිව යුත්තන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කෑගල්ල ශික්ෂණ රෝහලෙහි දෛනිකව එකතු වන සායනික අපද්‍රව්‍ය ඇතුළු සාමාන්‍ය පරිසරයට සෘජුව බැහැර කළ නොහැකි විනාශ කළ යුතු කිලෝග්‍රෑම් 365 කට ආසන්න අපද්‍රව්‍ය දහනය කිරීම සඳහා රු.මිලියන17 කට ආසන්න වියදමක් දරා දාහකයක් (incinerator) ඉදිකොට 2024 ජූනි 7 දින වන විට ක්‍රියාකාරීත්වයද පරීක්ෂා කර තිබුණද රෝහලේ කාර්ය මණ්ඩලය වෙත විධිමත් පුහුණුවක් ලබා දී නොතිබීම හා විධිමත්ව රෝහල වෙත භාරදී/	ඉන්සිනරේටර් යන්ත්‍රය ක්‍රියාකාරී මට්ටමින් රෝහල වෙත භාර දී නොමැති බව, එබැවින් අමාත්‍යාංශයේ අනුමැතිය මත සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා බාහිර ආයතනයක් වෙත යවනු ලබන බව, ඉන්සිනරේටර් යන්ත්‍රය ක්‍රියාකාරී මට්ටමින් රෝහල	විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	භාරගෙන නොතිබීම හේතුවෙන් අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් එකකට රු. 185 ක්(වැට් රහිත) වියදමක් දරා පුද්ගලික සමාගමක් මඟින් ඉවත් කිරීමට සිදුව තිබුණු අතර ඒ සඳහා ආසන්න වශයෙන් වසරකට රු. මිලියන 24කට වැඩි නිෂ්කාර්ය වියදමක් දැරීමට සිදුව තිබුණි.	වෙත ලද පසු බාහිර ආයතනය වෙත යැවීම අවසන් කළ හැකි බව.	
(ඇ)	කෑගල්ල ශික්ෂණ රෝහල විසින් 2019, 2020 හා 2021 යන වර්ෂවල මිලදී ගන්නා රු. 34,485,827 ක් වටිනා යන්ත්‍ර 04 මිලදී ගැනීමේදී අවශ්‍යතාවය සහ යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව විධිමත් ශක්‍යතා අධ්‍යනයක් කිරීමෙන් තොරව මිලදී ගැනීම හේතුවෙන් ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ මෙම යන්ත්‍ර අවශ්‍ය වෙනත් රෝහලකට ලබා දීමට කටයුතු කිරීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.	Urine Analyzer- මේ වන විට අවශ්‍ය ප්‍රතිජීවක ඉල්ලුම් කර පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති බව,අනෙකුත් යන්ත්‍ර අවශ්‍ය රෝහල් සොයාබලා එම ආයතනවලට විධිමත් ආකාරයෙන් භාර දීමට කටයුතු කරමින් පවතින බව.	-එම-

4.9 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණන විමසුම පිළිබඳ විස්තරය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණකාධිපතිට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, 2025 අප්‍රේල් 20 දින වන විටත් පිළිතුරු නොලත් මුළු විගණන විමසුම් සංඛ්‍යාව 117 ක් වූ අතර, පිළිතුරු ඉදිරිපත් නොකළ වසරකට වැඩි කාලයක් ගතවී ඇති විගණන විමසුම් සංඛ්‍යාව 27 ක් විය.	විගණන විමසුම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අදාළ අනෙකුත් රෝහල් හා ආයතන වෙත යොමුකර පැහැදිලි කිරීම් ලබාගත යුතු බැවින් එලෙස පිළිතුරු ගෙන්වා ගැනීමේදී යම් කාල පමාවක් සිදුවන අතර එම හේතුවෙන් 2025 අප්‍රේල් 20 දිනට වසරකට වඩා වැඩි කාලයක් ගත වී ඇති විගණන විමසුම් සංඛ්‍යාව 05ක් ලෙස පවතින බව සහ හැකි සෑම අවස්ථාවකදීම නියමිත කාලය තුළ පිළිතුරු ලබා දීම සඳහා කටයුතු කරන බව.	විගණන විමසුම්වල දක්වා ඇති නිශ්චිත කාලසීමාව තුළ පිළිතුරු සැපයීමට කටයුතු කළ යුතුය.

4.10 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රත්නපුර ශික්ෂණ රෝහලේ අමු ආහාර සැපයීම හා රෝගීන්ට හා කණිෂ්ඨ සේවකයින්ට පිසූ ආහාර ලබාදීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		

(i)	2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා අමු ආහාර සැපයීම පිළිබඳව පරීක්ෂා කිරීමේදී රෝගීන්ට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර වේලක් ලබාදීම සඳහා සැපයිය යුතු මාළු, කරවල, බිත්තර, කිරිපිටි, දොඩම් සහ අලිගැටපේර බොහෝ දිනයන්හීදී සැපයීම පැහැර හැර තිබුණි.	මෙම කාල සීමාව තුළ බිත්තර හා කිරිපිටිවල වෙළඳපොලෙහි හිඟයක් පැවැති බැවින් ගිවිසුම් ප්‍රකාරව ඒ සඳහා සුදුසු ආදේශකයන් සපයා ඇති බව.අලිගැටපේර/පෙලි/සමපෝෂ ගිවිසුමේ සඳහන් කරන පරිදි ඇණවුම් කරන අවස්ථාවේ දී මාසික සීමාව ඉක්මවා තිබූ බැවින් ලබා ගෙන නොමැති බව,මාළු හා කරවල සැපයීම ඇතැම් අවස්ථාවල ගැටළු පවතින බව.	රෝගීන්ට අනුමත පෝෂ්‍යදායී ආහාර ලබාදීමට කටයුතු කළ යුතු අතර නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.
(ii)	අමු ආහාර සඳහා මිල ගණන් කැඳවීමේදී හා උපරිම මිල තීරණය කිරීමේදී පවතින වෙළඳපළ මිල විචලතාවය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණු බවත්, අමු ආහාර අයිතම 16ක් සඳහා වෙළඳපළ මිලට වඩා වැඩි මිලක් ගෙවීම නිසා 2024 වර්ෂය තුළ රජයට සිදු වී ඇති අලාභය රු.9,462,819 ක් වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	ප්‍රසම්පාදන යේදී රජයට අලාභයක් සිදුනොවන ආකාරයට ගිවිසුම්ගත විය යුතු අතර සිදුවී ඇති පාඩුවට වගකිවයුත්තන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	2024 සැප්තැම්බර් හා ඔක්තෝබර් තුළ පමණක් ආහාර ඇණවුම් කර ලබා නොගත් සේවක සංඛ්‍යාව පිළිවෙලින් උදේ 644 ක්, දිවා 2236 ක් සහ රාත්‍රී 2032 ක් විය. මේ අනුව විශාල ප්‍රමාණයන්ගෙන් ආහාර ඉතිරිවීම් පැවති අතර, එම ඉතිරි වීම් ප්‍රමාණයන් පොත්වලට ගෙන නොතිබුණි.	ඉදිරියේදී මේ ආකාරයට සිදු නොවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස හා අධීක්ෂණ කටයුතු සිදු කරන ලෙසත් ගිණුම් කටයුතු නිවැරදිව සිදු කරන ලෙසද දැනුවත් කර ඇති බව.	විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 ජූලි 30 දින අත්සන් කර තිබුණු රත්නපුර ශික්ෂණ රෝහලේ පිරිසිදු කිරීමේ සේවා සැපයීම සඳහා වූ සංශෝධිත ගිවිසුමේ, ගිවිසුම් කොන්දේසි අංක 10 ට අනුව සෑම අංශයකම වැඩ කටයුතු සතුටුදායක අන්දමින් ඉටු කර තිබෙන බවට අදාළ නිලධාරීන්ගේ සහතික කිරීමෙන් පසුව ගෙවීම් සිදුකළ යුතු වුවද, 2024 ජනවාරි, පෙබරවාරි සහ මාර්තුවලට අදාළව පිරිසිදු කිරීමේ ප්‍රගතිය පිළිබඳව විස්තර ලබා නොගෙන එම කාලය සඳහා රු.මිලියන 34.77 ක මුදලක් කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවා තිබුණි.	මෙම බිල්පත් 2024 ජනවාරි, පෙබරවාරි, මාර්තු මාස වලට අදාළ පෙර බිල්පත් වන අතර එකී කාලයන් තුළ පැවැති ලිපි ද්‍රව්‍ය හිඟකම නිසා මාස තුනකට වරක් ප්‍රගතිය ලබා ගෙන තිබුණු බව, ඒ අනුව දෛනිකව හඳුනා ගන්නා ගැටළු වාර්තා නොවීම නිසා එම මාස තුනට අදාළව ලබා ගත් ප්‍රගති වාර්තා පදනම්ව වවුචර් පරීක්ෂා කර ගෙවීම් කළ බව.	සේවාව සතුටුදායක ලෙස ඉටුකිරීම සනාථ කර ගැනීමෙන් පසු ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කුලියාපිටිය ශික්ෂණ රෝහලේ වකුගඩු රෝගීන්ගේ රුධිර කාන්දුකරණය (Dialysis) සිදු කරන මැෂින් 05 ක් පමණක් පවතින අතර මෙමඟින් රුධිරය කාන්දුකරණය (Dialysis) කරන	රෝහල තුළ පසුගිය වසර 05 තුළ රෝගී සත්කාර සේවා සඳහා භාවිතා කළ හැකි වාට්ටුවක් හෝ ඒකකයක් විධිමත් පහසුකම්	අත්‍යවශ්‍ය පහසුකම් වැඩිදියුණු කර රෝගී සත්කාර සේවා ප්‍රමාණවත් පරිදි ලබාදීමට

	රෝගීන් 42 ක් 2025 පෙබරවාරි විගණන දිනය වනවිට රෝහලෙන් ප්‍රතිකාර ලබා ගන්නා අතර රෝහල් ගතව වෙනත් වාට්ටුවක සිටින දැඩි අවධානමක් සහිත රෝගීන්ද හදිසි ප්‍රතිකාර සඳහා මෙම අංශයට යොමු කරයි. රුධිර කාන්දුකරණය (Dialysis) කිරීමේ අවශ්‍යතාවය පවතින තවත් රෝගීන් 42 ක් පොරොත්තු ලේඛනගතව සිටී. පොරොත්තු ලේඛනගතව සිටින රෝගීන් අතරින් තිදෙනෙකු මිය ගොස් ඇති බවට වාර්තා වී තිබුණි. වාර්තාගත වූ රෝගීන් අතරින් රෝහල් බල ප්‍රදේශයේ සිටින රෝගීන් 16 දෙනෙකු වෙනත් රෝහල්වලින් රුධිර කාන්දුකරණය (Dialysis) සිදු කරනු ලබයි. බල ප්‍රදේශයේ රෝගීන්ගේ ජීවිත අවධානම අවම කිරීම සඳහා කාන්දුකරණ (Dialysis) යන්ත්‍ර ප්‍රමාණය වැඩි කිරීම දැඩි අවශ්‍යතාවයක් පවතින අතර ඒ සඳහා රෝහල් පරිශ්‍රයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීමේ ගැටළුවක් පවතින බවද විගණන අවස්ථාව වන විට නිරීක්ෂණය වූ අතර ශික්ෂණ රෝහලක් ලෙස උසස් කිරීමත් සමඟ රෝගීන් ප්‍රමාණය වැඩි වුවද, අදාළ අත්‍යවශ්‍ය පහසුකම් වැඩිවීමක් සිදු වී නොතිබුණි.	සහිතව ඉදි වී නොමැති බව, එම නිසා රුධිර කාන්දු පෙරණ ඒකකය පවතින පස් මහල් ගොඩනැගිල්ල පුළුල් කිරීමට මූලික අඩිතාලම සකසා ඇති බව, අවට වාට්ටු හා ඒකකවල ඉඩ පරිශ්‍ර රුධිර කාන්දු පෙරණ ඒකක සඳහා යොදා ගැනීමට ප්‍රායෝගික ගැටළු පවතින බව, අවට රෝහල්වල රුධිර කාන්දු පෙරණය සඳහා අවස්ථාව ලබාදී ඇති රෝගීන් ආර්ථික, සමාජීය හේතූන් මත දුර බැහැර රෝහල් වෙත රුධිර කාන්දු පෙරණය සඳහා නියමිත වේලාවට සහභාගී නොවන අවස්ථා නිරීක්ෂණය වූ බව, එම නිසා රෝහල තුළ රුධිර කාන්දු පෙරණ සේවාව අවශ්‍ය රෝගීන්ට ප්‍රතිකාර කළ හැකි පරිදි යටිතල පහසුකම් හා රෝගී සත්කාර සේවා හැකි ඉක්මනින් පුළුල් කළ යුතු බව.	කටයුතු කළ යුතුය.
(ඈ)	මහනුවර ජාතික රෝහලේ පටකවේද රසායනාගාරයේ පිළිකා රෝගය හඳුනාගැනීම සඳහා කරනු ලබන විශේෂිත පරීක්ෂණයක් වන Immune His to Chemistry (IHC) පරීක්ෂණය සිදු කරනු ලබන විශ්ලේෂක යන්ත්‍ර සඳහා අවශ්‍ය ප්‍රතික්‍රියක (Regents) සහ ප්‍රතිදේහක (Antibodies) වර්ග 53 ක් හා Biospy පරීක්ෂණ සිදු කිරීම සඳහා යොදා ගන්නා IHC Markers වර්ග 39 ක් 2023 නොවැම්බර් 17 දින වන විටත් කල් ඉකුත් වීමේ කාල සීමාව ඉක්මවා මාස 01 ත් අවුරුදු 14 ත් අතර කාලයක් ගත වී ඇතත් ඒවා පරීක්ෂණ සඳහා භාවිතා කර තිබුණි.	මහනුවර ජාතික රෝහලේ පටකවේද රසායනාගාරයේ Biopsy සාම්පල් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා Automated Slide Stainer යන්ත්‍රය අලුත්වැඩියා නිම කර ක්‍රියාත්මක තත්වයේ පවතින බව, 2024.12.11වන දින මෙම යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු නිම කිරිමෙන් පසු අඛණ්ඩව භාවිතයට ගන්නා බව.	කල් ඉකුත් නොවන පරිදි නිවැරදි ප්‍රමාණ වලින් පරීක්ෂණ ද්‍රව්‍ය ඇණවුම් කර ගබඩා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මහනුවර ජාතික රෝහලේ විකිරණ විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනෙකු විසින් ලබාදුන් තොරතුරු අනුව 2024 මාර්තු 06 දින වන විට CT පරීක්ෂණ පොරොත්තු ලේඛනය තුළ රැඳී සිටින රෝගින් 1738 ක් විය. එම රෝගීන්ගේ පොරොත්තු කාලය 2026 මාර්තු 12 දින දක්වා පැවතුණි. කෙසේ නමුත් රෝගියෙකුට තම CT පරීක්ෂණය කර ගැනීම සඳහා වසර දෙකකට ආසන්න කාලයක් පොරොත්තු ලේඛනවල රැඳී සිටීමට සිදුවී තිබුණි.	රෝහල සතුව පවතින මානව හා භෞතික සම්පත්වල හිඟකම හේතුවෙන් මෙම තත්ත්වය උදා වී ඇති අතර අමතර රාජකාරී සඳහා නිදර්ශක දීමනා අනුමත කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, දත්ත ගබඩාකිරීමේ පහසුකම්, ආදීය මඟින් මෙම තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	අත්‍යවශ්‍ය මානව හා භෞතික සම්පත් වැඩිදියුණු කර රෝගි සත්කාරක සේවා ප්‍රමාණවත් පරිදි ලබාදීමට කටයුතු කළ යුතුය.

(ඊ)	මහනුවර ජාතික රෝහලේ Ultrasound Scan පරීක්ෂණ වර්ග 08 ක් සිදුකිරීම සඳහා 2024 මාර්තු 06 දින වන විට වෛද්‍යවරුන් තිදෙනෙකුට අදාළව රෝගීන් 10,551 දෙනෙකු සඳහා පොරොත්තු ලේඛන 14 ක් පවත්වාගෙන ගොස් තිබුණි. ඒ අනුව එම පරීක්ෂණ සිදුකිරීම සඳහා රෝගීන්ට මාස 02 යි දින 21 සිට මාස 09 යි දින 20 ත් අතර කාලයක් පොරොත්තු ලේඛනගතව සිටීමට සිදුව තිබුණි.	මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා නව වෛද්‍ය උපකරණ මෙන්ම අවශ්‍ය අනෙකුත් මානව හා භෞතික සම්පත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බව, තවද දිනකට 300 ක් පමණ පිළිකා රෝගීන් ලියාපදිංචි වී ප්‍රතිකාර ලබාගන්නා අතර ඔවුන්ගේ ප්‍රතිකාර ක්‍රියාවලිය තුළ විකිරණ හා කීමෝතෙරපි ප්‍රතිකාර වලට ප්‍රථම හා පසු Ultrasound Scan පරීක්ෂණ සිදු කළ යුතුව ඇත. තවද අධිසංවේදී අවයව සඳහා CT පරීක්ෂණ සිදු කළ නොහැකි අවස්ථාවල Ultrasound Scan සිදුකළ යුතු බව.	විද්‍යාත්මක පදනමක් සහිත පරීක්ෂාවක් සිදු කර රෝගීන්ට වඩාත් හොඳ සේවාවක් සැපයීමට හැකි ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය විසින් සිදු කරනු ලබන වෛද්‍ය සැපයීම්, සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳ 2018 මාර්තු 14 දිනැති විගණකාධිපති විශේෂ විගණන වාර්තාවේ 8.30 නිර්දේශය අනුව වෛද්‍ය සැපයීම් අදාළ උෂ්ණත්ව පරාසයන් තුළ ගබඩා නොකිරීම හේතුවෙන් ඒවායේ ගුණාත්මකභාවය පහත වැටීමක් සිදුවන බැවින් ඖෂධ මිලදී ගැනීමේදී සාම්පල් හා ලබාගන්නා නියැදි සාම්පල් එම තොගය රෝහල් වෙත නිකුත් කර භාවිතයෙන් අවසන් වන තුරු ගබඩා කර තැබීමට කටයුතු කළ යුතු බවට නිර්දේශ කර තිබුණි. නමුත් වසර හතකට ආසන්න කාලයක් ගතවී ඇතත් එකී සාම්පල් ගබඩාව සකස් කර ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය කටයුතු සිදුකර නොමැති අතර එම සාම්පල් ගබඩාව සකස් කිරීම සඳහා වෙන් කර ඇති වායුසමනය කළ ගබඩාව විගණිත දිනය දක්වාම කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබූ බව කරන ලද භෞතික ගබඩා පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	මේ වන විට වෛද්‍ය සැපයීම් අදාළ උෂ්ණත්ව පරාසයන් තුළ ගබඩා කිරීමට අවශ්‍ය කටයුතු සම්පූර්ණ කර මධ්‍යම වායුසමන පද්ධතිය ක්‍රියාත්මක වන බව, ටෙන්ඩර් නියැදි සාම්පල ලබා ගැනීම වෛද්‍ය සැපයීම් අංශය සිදු නොකරන අතර, වෛද්‍ය සැපයුම් - වෛද්‍ය සැපයීම් අංශය වෙත ලබා දීමේදී සාම්පල ලබා ගන්නා අදාළ සාම්පල ගබඩාවෙහි වැඩ 2024 මැයි 31 අවසන් කිරීමට උත්සහ කළ අතර එහි තාක්ෂණික ගැටළු නිසා CEEB ආයතනයට වැඩ විෂය අවසන් කරගත නොහැකි වූ බව, මේ වන විට අදාළ කටයුතු අවසන් අදියරෙහි ඇති බව.	සාම්පල් ගබඩාවේ නවීකරණ කටයුතු කඩිනමින් අවසන් කර අදාළ කාර්ය සඳහා භාවිතා කළ යුතුය.
(ඌ)	2024 වර්ෂයේ විදේශීය ආයතනයන්ගෙන් වෛද්‍ය සැපයීම් අංශයට ලද පරිත්‍යාග වරායෙන් නිෂ්කාශනය කිරීම සඳහා අවස්ථා 38 කදී රු.මිලියන 321.38 කට අධික ප්‍රමාද ගාස්තු හා ගුදම් ගාස්තු ගෙවා ඇති බවත්, ඉන් අවස්ථා 07 කදී ශීත බහාලුම් සඳහා විදුලි පිරිවැය රු. මිලියන 65.33 ක්ද ඇතුළුව රු.මිලියන 115.45 ක් ප්‍රමාද ගාස්තු හා ගුදම් ගාස්තු ලෙස ගෙවා තිබුණු බවත් විගණනයේදී	මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කරන ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත දන්වා ඇති බව, ඒ අනුව ලැබෙන වාර්තාව මත අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව.	ස්වාධීන පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	නිරීක්ෂණය විය. විදේශ ආයතනවලින් ශ්‍රී ලංකාවේ රෝහල් හා සෞඛ්‍ය ආයතන වෙත ලැබෙන පරිත්‍යාග නිසිලෙස සම්බන්ධීකරණය නොකිරීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශයේ වාප්පු අංශයට ලිපිලේඛන ලැබීම ප්‍රමාද වීම හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතීන් ලැබීම ප්‍රමාද වීම බලපා ඇති බවත්, ඒ සඳහා දින 26 ත් 306 ත් අතර කාලයක් ගත කර ඇති බවත්, ඒ හේතුවෙන් අවස්ථා 08 කදී පරිත්‍යාග නිෂ්කාශනයන්ට රු.මිලියන 10 ට වැඩි ප්‍රමාද ගාස්තු හා වරාය ගුදම් ගාස්තු ගෙවා තිබුණි. ඇතැම් අවස්ථාවලදී පූර්ව දැනුම්දීම් වෛද්‍ය සැපයීම් වාප්පු අංශයට නොලැබීමෙන් නිෂ්කාශන ක්‍රියාවලිය ආරම්භ කිරීම ප්‍රමාද වීම මත වරාය විසින් අදාළ තොග වෙන්දේසි කිරීම සඳහා වෙන්දේසි නිවේදන නිකුත් කර ඇති බවත් ලොරි, කැබ්රථ හා වෛද්‍ය උපකරණ නිෂ්කාශනයේදී දරන ලද ප්‍රමාද ගාස්තු වෛද්‍ය සැපයීම් අංශයේ ඖෂධ මිලදී ගැනීම සඳහා වූ වැය විෂයෙන් වැයකර ඇති බවද නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.		
(එ)	වෛද්‍ය සැපයීම් අංශය විසින් නියමිත පරිදි රෝහල් වෙත වෛද්‍ය සැපයීම් නිකුත් කිරීම කළමනාකරණය නොකිරීම හේතුවෙන් 2024 වර්ෂයේදී කුරුණෑගල ශික්ෂණ රෝහල හා කෑගල්ල මහ රෝහල විසින් රු. 10,782,466 ක් වටිනා ඖෂධ හා රු. 3,184,000 ක් වටිනා ශල්‍ය අයිතම දේශීය මිලදී ගැනීම් යටතේ මිලදී ගෙන තිබුණු අතර වෛද්‍ය සැපයීම් අංශයෙන් කුරුණෑගල ශික්ෂණ රෝහලෙහි ඖෂධ ගබඩාව වෙත ලද ඖෂධවලින් රු. 50,445,026 කට වැඩි වටිනාකමකින් යුතු ඖෂධ වර්ග 26 ක් ඖෂධ ගබඩා ගොඩනැගිල්ලේ බිම් මහලේ හා පළමු මහලේ කොරිඩෝවල 2025 පෙබරවාරි 27 දින වනවිටත් ගබඩා කර තිබුණි. මෙලෙස, කොරිඩෝවල ගබඩා කර ඇති කාලය දින 02 සිට වර්ෂ 01 මාස 07 ක් පමණ වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	-එම-
(ඒ)	2024 වර්ෂයේදී අවස්ථා 55 කදී කෑගල්ල මහ රෝහල විසින් වෛද්‍ය සැපයීම් අංශයට යොමු කර තිබුණු රු.2,680,284 ක් වටිනා ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය දේශීය මිලදී ගැනීම් යටතේ මිලදී ගැනීමටත්, මීගමුව දිස්ත්‍රික් මහ රෝහල විසින් අවස්ථා 10කදී රු.308,725ක් වටිනා රසායන ද්‍රව්‍ය අයිතම 09ක් මිලදී ගැනීමට අනුමැතිය ලබා දීමට වෛද්‍ය සැපයීම් අංශය විසින් දින 04 සිට දින 46 දක්වා කාලයක් ගෙන තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	-එම-

(ඔ)	රෝහල් පද්ධතිය තුළ ස්ථාපිතව පවතින මධ්‍යගත වායු සමීකරණ පද්ධති ශල්‍යාගාර කටයුතු සුරක්ෂිතව ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වේ. ඒ තුළින් ශල්‍යාගාරය තුළ ශල්‍ය කටයුතු සිදු කිරීමේදී එකතු වන අහිතකර විෂබීජ වලින් සමන්විත වායූන් ඉවත්වීම නිරන්තරයෙන් සිදුවේ. ඒ අනුව මධ්‍යගත වායු සමීකරණ පද්ධති රෝහල් වලට අත්‍යවශ්‍ය සාධකයක් වුවද මහනුවර ජාතික රෝහලෙහි පවතින මධ්‍යගත වායු සමීකරණ පද්ධති 08 න් රු මිලියන 50 කට අධික වටිනාකමක් සහිත පද්ධති 04 ක් මාස 04 ත් වර්ෂ 25 ත් අතර කාලයක් අක්‍රීය වී තිබුණි.	අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බව විදුලි බල මණ්ඩලයේ හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉංජිනේරු නිර්දේශය වූ බැවින් ඒ සඳහා නව මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කර ගැනීමට දැනට වසර ගණනාවක සිට කටයුතු කරමින් පවතින බව, ඒ අනුව මේ වන විට DU අංශයේ නව chiller යන්ත්‍රයක් සපයා සවි කිරීමේ ප්‍රසම්පාදන කටයුතු අවසන් අදියරේ පවතින බව.	වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ඕ)	විශේෂිත ළදරු ප්‍රතිකාර ඒකක සඳහා Ventilator යන්ත්‍ර අත්‍යවශ්‍ය උපකරණයක් වන අතර එය ක්‍රියාත්මක කිරීමට Compressor යන්ත්‍ර ඉතාම අත්‍යවශ්‍ය වේ. ගම්පොළ මූලික (ශික්ෂණ) රෝහලේ විශේෂිත ළදරු ප්‍රතිකාර ඒකකයේ මාසයක් තුළ ළදරුවන් 200 කට ආසන්න ප්‍රමාණයක් ප්‍රතිකාර ලබන අතර එම අංශය සඳහා අවශ්‍ය වෛද්‍ය වායු සැපයීම සඳහා භාවිතා කරන Compressor යන්ත්‍ර දෙක 2018 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව පැවතුණි. ඉන් එක් යන්ත්‍රයක් අලුත්වැඩියා කළ නොහැකි බව ජීව වෛද්‍ය ඉංජිනේරු විසින් දක්වා තිබුණු අතර අනෙක් යන්ත්‍රයද 2023 දෙසැම්බර් 18 දින සිටද ක්‍රියාවිරහිත වී තිබුණි.	දැනට Ventilator යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා වෛද්‍ය වායු සිලින්ඩර් ගැටළුවක් නොමැතිව භාවිතා කරන බව, එම නිසා නොමේරූ ළදරුවන් සඳහා ප්‍රතිකාර කටයුතු අඩාල වීමකින් තොරව ක්‍රියාත්මක වන බව, වෛද්‍ය වායු පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා විවෘත මිල ගණන් කැඳවා ලද මිල ගණන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කර ඇති බව.	වෛද්‍ය වායු පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ක)	සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සඳහා ව්‍යවස්ථාපිත බලය ලබාදීමත්, එහි වගකීම් නිශ්චය කිරීමත්, ප්‍රාදේශීය රෝහල් මණ්ඩල හා රෝහල් කමිටු පත්කිරීමත්, මහජන සෞඛ්‍යයට අදාළව පළාත් පාලන ආයතන විසින් වඩාත් ඵලදායි පරිපාලනයක් ඇති කිරීමත්, අරමුණු කරගෙන සම්මත කරන ලද 1952 අංක 12 දරන සෞඛ්‍ය සේවා පනත වර්තමාන වෙනස්කම්වලට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීමට වගකිව යුතු පාර්ශවයන් කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය හා 1987 අංක 42 දරන පළාත් සභා පනත සම්මත කිරීමත් සමඟ මෙම පනත සංශෝධනය කළ යුතුව තිබුණද 2024 වර්ෂය දක්වා ඒ සඳහා කටයුතු කර නොතිබුණි. පනතේ 2(1) හා 2(2) වගන්ති මගින් දක්වා ඇති සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා එහි අංශ වර්තමානයේ ක්‍රියාත්මක වන ආකාරය, පළාත් සභා ක්‍රියාත්මක විමත් සමඟ ස්ථාපිත පළාත් සෞඛ්‍ය	අදාළ රෝහල් කමිටු පත් කිරීමෙන් අනතුරුව ගැසට් නිවේදනයක් මගින් එම කමිටු ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන බව, පනතේ 14 වගන්තිය අනුව රෝහල් කමිටු වෙතින් වාර්ෂික වාර්තා ගෙන්වා ගැනීමටද එසේ වාර්ෂික වාර්තා යොමු නොකරන රෝහල් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමටද කටයුතු කරන බව.	වර්තමාන වෙනස්කම්වලට ගැලපෙන ආකාරයට පනත සංශෝධනය කිරීමට වගකිව යුතු පාර්ශවයන් කටයුතු කළ යුතුය.

	සේවා දෙපාර්තමේන්තු වලට මෙම වගන්ති බලපාන ආකාරය හා මධ්‍යම රජයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව දැනට ක්‍රියාත්මක නොවන බැවින් මෙම වගන්ති බලාත්මක වන ආකාරය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනමෙන් ඉල්ලීම් කර මාස 21 කට ආසන්න කාලයක් ගත වුවද නිශ්චිත පිළිතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. පනතේ 4(1) වගන්තියේ දැක්වෙන ජාතික සෞඛ්‍ය සභාව 2006 වර්ෂයෙන් පසුව රැස්වී නොතිබුණි. පනතේ 9(1) හා 11(1) වගන්ති යටතේ විෂය භාර අමාත්‍යතුමා විසින් රෝහල් මණ්ඩල (Hospital Board) හා රෝහල් කමිටු (Hospital Committees) පත්කර ගැසට් පත්‍රයේ පළ කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි. අමාත්‍යාංශය විසින් රෝහල් මණ්ඩල කිසිදු රෝහලකට අදාළව පත්කර නොමැති බවත් රෝහල් 37 ක් සඳහා පමණක් රෝහල් කමිටු පත්කර තිබුණි.පනතේ 10(5) වගන්තිය අනුව රෝහල් කමිටු රැස්වීම් වාර්තාවල පිටපත් හා පනතේ 14 වගන්තිය අනුව වාර්ෂික වාර්තා අමාත්‍යාංශය වෙත ලබාදිය යුතු වුවද රෝහල් කමිටු පත්කරන ලද රෝහල් 37 කින් රෝහල් 8 විසින් පමණක් කමිටු වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබුණු අතර කිසිදු රෝහලක් විසින් කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.		
(ඩ)	සෞඛ්‍ය අමාත්‍යාංශය සතු අංක PA-6192 දරන වාහනය 2014 ජනවාරි 02 දින පොලොන්නරුව මුදුන්ගම ප්‍රදේශයේදී අනතුරකට ලක්වී තිබුණි. අනතුර සිදුවී වසර 10 කට වැඩි කාලයක් ගත වීමෙන් පසුව 2024 ජුලි 05 දින මෙම අනතුරට අදාළව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණය සඳහා කමිටුවක් පත්කර තිබුණි.අනතුර සම්බන්ධයෙන් රක්ෂණ වන්දි මුදල් ලබාගැනීම සඳහා අයදුම් කර තිබුණු නමුත් අනතුර සිදුවන විට වාහනය ධාවනය කළ රියදුරු ලෙස රක්ෂණ අයදුම් පත්‍රයේ දක්වා තිබුණු රියදුරු විසින් සත්‍ය ලෙසම අනතුර සිදුවන අවස්ථාවේ රථය ධාවනය කර නොමැති බව රක්ෂණ සමාගම සිදුකරන ලද විමර්ශනයේදී තහවුරු වූ බැවින් රක්ෂණ හිමිකම් ලබා නොදෙන බව සෞඛ්‍ය ලේකම් වෙත 2014 මාර්තු 20 දින ලිඛිතව දන්වා තිබුණි. ඒ සඳහා උපදෙස් ප්‍රධාන නීති නිලධාරීගෙන් ඉල්ලා තිබුණු නමුත් උපදෙස් ලබා දුන් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. මෙම තත්ත්වය තුළ මෙම අනතුර සිදුවී වසර 11 කට ආසන්න කාලයක් ගතවුවද 2024 දෙසැම්බර් වනවිටත් මෙම රථය අලුත්වැඩියා නොකර මුල්ලේරියාව ගරාජයක් තුළ ගාල් කර තිබුණි. අනතුර සිදුවී වසර දෙකකට	මුදල් රෙගුලාසි 104 **(I)** ප්‍රකාරව පරීක්ෂණයක් ආරම්භ කළ යුතු වුවත්, එලෙස පරීක්ෂණයක් ආරම්භ කලේද යන්න පිළිබඳව තොරතුරු ප්‍රවාහන අංශය සතුව නොමැති බව, මේ වනවිට කමිටුවක් පත් කර මු.රෙ. 104 **(I)** පරීක්ෂණයක් ආරම්භ කළ බව, 2014 වර්ෂයේදී ඉහත අංක දරන වාහනය අනතුරට ලක්වීම පිළිබඳව තොරතුරු වාර්තා වී නොමැති බවට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන) ගේ අංක CF/DPM/පොදු/2019 හා 2024 පෙබරවාරි 13 දිනැති ලිපිය මඟින් දන්වා ඇති බව, විගණන නිරීක්ෂණයට අනුව විමර්ශනයක් සිදුකිරීම සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (හදිසි වැටලීම්) වෙත ලිපියක් යොමුකර ඇති බව, රථය අලුත්වැඩියා කිරීම	මුදල් රෙගුලාසි 102(ඇ) , 104(1) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අවශ්‍ය නීති උපදෙස් ලබා නොදීම,ගොනුව අස්ථානගත වීම සහ රථය අලුත්වැඩියා නොකිරීම පිළිබඳව විමර්ශනය කර විනය ක්‍රියා මාර්ග ගැනීමට නීතිපති විසින් ලබාදුන් උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

	පමණ පසුව 2016 මාර්තු 28 දින නීතිපති තුමාගේ උපදෙස් ලබාගැනීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කර තිබුණි. නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2018 සැප්තැම්බර් 07 දින, ආයතන දෙකම රාජ්‍ය ආයතන දෙකක් බැවින් 2018 මැයි 22 දිනැති අමාත්‍යමණ්ඩල තීරණ අංක 75(i)(c) අනුව කටයුතු කරන මෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා තිබුණි. 2024 දෙසැම්බර් දක්වා නීතිපති තුමා ලබාදුන් උපදෙස් අනුවද කටයුතු කර නොතිබුණි. එවකට විෂයභාර අමාත්‍යතුමාගේ කාර්යමණ්ඩලය වෙත අනුයුක්ත කරන ලද මෙම වාහනයේ ලිපිගොනුව අමාත්‍ය කාර්යාලයට ගෙන්වාගෙන එය අස්ථානගත කර තිබුණි. මෙම ලිපිගොනුව අස්ථානගත වීම සම්බන්ධයෙන්ද විධිමත් විමර්ශනයක් සිදුකර නොතිබුණි. අධ්‍යක්ෂ (ප්‍රවාහන) විසින් 2020 නොවැම්බර් 18 දිනද ප්‍රධාන නීති නිලධාරියගෙන් රජයේ මුදල් වැයකර මෙම රථය අලුත්වැඩියා කර ගැනිමේ හැකියාව විමසා තිබුණද ඊටද පිළිතුරක් ලබාදී නොතිබුණි.	සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් නීති අංශයෙන් නොලැබීම හේතුවෙන් අලුත්වැඩියා කිරීමට නොහැකි වී ඇති බව,මෙම රථයේ අනතුරට අදාළ අලාභය අයකර ගැනීම සඳහා සාකච්ඡාවක් පැවැත්වීමට තීරණ ගතහැකි නිලධාරියකු නම් කර එවන ලෙස අංක **LO/**13/2014 හා 2021 අප්‍රේල් 09 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත දන්වා ඇති අතර, එම සාකච්ඡාවේදී ලබාගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රවාහන අංශය දැනුවත් කර නොමැති බව.	
(ග)	සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වාහන 414 කට අයත් ලිපිගොනු 473 ක් 2022 වර්ෂයේදි අපහරණය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
	(i) 2019 අප්‍රේල් 22 දින විගණකාධිපති විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාහන කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන වාර්තාව මගින් අමාත්‍යාංශය සතු වාහන කළමනාකරණය සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන දුර්වලතා රාශියක් පෙන්වා දී තිබුණි. මෙම විශේෂ විගණන වාර්තාව මගින් අමාත්‍යාංශය සතු වාහන විශාල ප්‍රමාණයක් අස්ථානගත වීම හෝ තොරතුරු සොයා ගැනිමට නොහැකි තත්ත්වය පෙන්වා දී තිබුණි. 2022 වර්ෂයේදි වාහන ලිපිගොනු අපහරණය කරන අවස්ථාව වන විටත් එකී විශේෂ විගණන වාර්තාව මගින් තොරතුරු සොයාගත නොහැකි හෝ අස්ථාන ගතවී ඇති බවට හඳුනා ගන්නා ලද වාහන සම්බන්ධයෙන් පරීක්ෂා කර එකී වාහන පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු සොයාගෙන නොතිබුණි. මෙසේ අපහරණය කරන ලද වාහන ලිපිගොනුවලින් වාහන 17 ක් යථෝක්ත විශේෂ විගණන වාර්තාව මගින් අස්ථාන ගතවූ හෝ තොරතුරු නොමැති වාහන ලෙස දක්වා තිබියදි එකී වාහනවලට අදාළ ලිපිගොනු අපහරණය කර තිබුණි.	වාහන අලුත්වැඩියා ගොනු පරීක්ෂා කිරීම තුළින් එවකට වාහනය පැවති අංශය පිළිබඳ තොරතුරක් සොයා ගැනීමට හැකියාවක් පැවතිය හැකි බවට නිරීක්ෂණය වුවත්, වාහනය අපහරණය කලේද, වෙනත් ආයතනයකට ලබාදුන්නේද යන්න පිළිබඳව තොරතුරු සොයාගත නොහැකි බව.	විශේෂ විගණන වාර්තාව මඟින් අස්ථාන ගතවූ හෝ තොරතුරු නොමැති වාහන ලෙස හඳුනාගන්නා ලද වාහනවලට අදාළ ලිපි ගොනු අපහරණය කිරීම පිළිබඳව පරීක්ෂාවක් කළ යුතුය.

	(ii) විශේෂ විගණන වාර්තාව මගින් පෙන්වාදෙන ලද නිරීක්ෂණ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගෙන තිබුණු ක්‍රියාමාර්ගයන් හා ලබාදී තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය පරික්ෂා කර නිකුත් කරන ලද විගණන විමසුම් මගින් අස්ථානගතවූ හෝ තොරතුරු නොමැති වාහන ලෙස හදුනා ගන්නා ලද වාහන 196 කට අදාළ ලිපිගොනුද 2022 වර්ෂයේදි අපහරණය කර තිබුණි.	වසර ගණනක් අක්‍රියව දිරාපත් වෙමින් පැවති වාහන අලුත්වැඩියා ගොනු අපහරණය කර ඇති අතර, එම ගොනු පරීක්ෂාව තුළින් වාහනය අපහරණය කලේද, වෙනත් ආයතනයකට ලබාදුන්නේද යන්න පිළිබඳව තොරතුරු සොයාගත නොහැකි බව.	-එම-
(ස)	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2001 මැයි 03 දිනැති අංක එම්එච්/එෆ්එස්/28/2001 දරන ලිපිය මගින් වහාම ක්‍රියාත්මක වන පරිදි රාජකාරි වැඩ තහනම් කරන ලද කළුතර මහ රෝහලේ සේවය කරන ලද අධිකරණ වෛද්‍ය නිලධාරී හට වැඩ තහනම් කළ කාලය වෙනුවෙන් අඩ වැටුප් ගෙවන ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2001 ජූලි 03 දින දන්වා තිබුණි. වැඩ තහනමට ලක්කර 2002 මාර්තු 09 දින චෝදනා පත්‍රය භාරදී තිබියදි මෙම වෛද්‍යවරයා විධිමත් අනුමැතියක් රහිතව විදේශ ගතවී තිබුණි. මේ අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 මාර්තු 10 දිනැති ලිපිය අනුව මොහු 2002 ජූනි 01 දින සිට සේවය අතහැර ගියා සේ සලකා ක්‍රියාකරන බව ලිඛිතව දන්වා තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ පරිපාලන (වෛද්‍ය සේවා II) අංශයේ පවත්වාගෙන යන ලද මොහුගේ පුද්ගලික ලිපිගොණුව විගණනයට ඉදිරිපත් නොකෙරුණි. කළුතර ශික්ෂණ රෝහල විසින් විගණනයට ඉදිරිපත් කරන ලද යථෝක්ත වෛද්‍ය නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂාවේ දී ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 8.1 වගන්තිය ප්‍රකාරව පත්වීම් ලිපියක් නිකුත් කළ යුතු නමුත් මෙම වෛද්‍යවරයාට විධිමත් පත්වීමේ ලිපියක් නිකුත් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. 2000 නොවැම්බර් 27 දින වාහන ණය වශයෙන් රු.415,100 ක් යථෝක්ත වෛද්‍යවරයා වෙත ලබා දී තිබුණද එම ණය මුදල අයකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. යථෝක්ත වෛද්‍ය නිලධාරියා වැඩ තහනමකට ලක් වී අවුරුදු 20 මාස 07 කට වැඩි කාලයක් ගත වී තිබූ නමුත් 2021 දෙසැම්බර් 31 දිනට රු.337,000 ක් වූ ආපදා ණය ශේෂයක් පැවතුණි. එසේම විගණනයට ඉදිරිපත් කළ ලිපිගොණුවේ පත්වීම ස්ථිර කිරිමට අදාල ලිපියක් ඇතුළත්ව නොතිබිණි. වෛද්‍යවරයා සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශන මගින් ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ප්‍රගතිය හා වෛද්‍ය නිලධාරින් 38 කගේ පුද්ගලික	වසරක සීමාවාසික පත්වීමෙන් පසු අදාළ වෛද්‍ය නිලධාරියා ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකු ලෙස පත් කරනු ලබන බව, ප්‍රාථමික ශ්රේණියට පත්වීමෙන් පසු වසර දෙකක සේවා කාලයෙන් පසු අදාළ වෛද්‍ය නිලධාරියා II වන ශ්‍රේණියට උසස් කරනු ලබන බව, ප්‍රාථමික ශ්‍රේණියට පත්වී වසර තුනක සේවා කාලයෙන් පසු අදාළ වෛද්‍ය නිලධාරියාගේ පත්වීම ස්ථිර කරනු ලබන බව, වාහන ණය ලබා ගැනීම හා එය අය කර ගැනිම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරන බව, මූලික විමර්ශන වාර්තාව මඟින් ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ප්‍රගතිය හා ඉල්ලා ඇති පෞද්ගලික ලිපි ගොනු 38ට අදාළ තොරතුරු ලබා දෙන ලෙස අදාළ අංශ දැනුවත් කර ඇති අතර අදාළ තොරුතුරු පසුව ඉදිරිපත් කරන බව.	පුද්ගලික ලිපිගොනුව අස්ථානගතවීම සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් කඩිනමින් හදුනාගෙන විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර ආයතන සංග්‍රහයේ අදාළ වගන්තින් ප්‍රකාරව කටයුතු කළ යුතුය. ලබාදී ඇති ණය මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර විගණනය විසින් ඉල්ලා ඇති තොරතුරු ලබාදීමට කටයුතු කළ යුතුය.

	ලිපිගොනු අස්ථාන ගතවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරන බව දන්වා තිබුණද එහි ප්‍රගතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.		
(ච)	අමාත්‍යාංශය සතු අංක **NB-**2699 දරන වාහනය අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	මෙම වාහනයේ ගියර් දැමීමට අපහසු බව රියදුරු විසින් දින රහිත ලිපියක් මගින් දැනුම්දී තිබුණු අතර 2024 මාර්තු 19 දින ප්‍රවාහන නිලධාරි විසින් ලබාදී තිබුණු නිර්දේශයට අනුව 2024 අප්‍රේල් 05 දින නියෝජිත ආයතනයෙන් ඇස්තමේන්තු කැඳවා තිබුණි. නියෝජිත ආයතනය විසින් 2024 අප්‍රේල් 29 දින රු. 204,895 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර එම මුදලට අදාළ අලුත්වැඩියාව ඉටු කිරීම සඳහා 2024 ජුනි 05 දින නියෝජිත ආයතනයට වාහනය යොමුකර තිබුණි. නියෝජිත ආයතනය විසින් 2024 ජුනි 11 දින රු.198,523 ක බිල්පත්‍රයක් මෙම අලුත්වැඩියාව වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු අතර එය ගෙවා තිබුණි. නැවත 2024 අගෝස්තු 29 දින මෙම වාහනය අධිවේගී මාර්ගයේ ගමන් කරමින් තිබියදී ගියර් හිරවීම මත වාහනය නතර වී තිබුණි.	වාහනයේ ගියර් දැමීමට අපහසු බැවින් පරීක්ෂා කර අලුත්වැඩියා කර දෙන ලෙසට රියදුරු විසින් කරන ලද ඉල්ලීමට අදාළව නියෝජිත ආයතනයට යොමුකර ඇස්තමේන්තුවක් ලබාගෙන ඇති අතර, වාහනයේ ක්ලච් පද්ධතියේ දෝෂයක් සම්බන්ධයෙන් රු: 204,895.20 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බව, එම අලුත්වැඩියාව සිදුකර නියෝජිත ආයතනයෙන් ඉදිරිපත් කරන ලද රු.198,523.20 ක බිල්පත 2024 ජූලි 03 දින ගෙවීම් සිදුකළ බව.	පූර්ණ විමර්ශනයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	පසුව වාහනය නියෝජිත ආයතනයට යොමුකර තිබුණු අතර නියෝජිත ආයතනය විසින් රු.985,789 ක ඇස්තමේන්තුවක් 2024 අගෝස්තු 29 දින ලබාදී තිබුණි. අවශ්‍ය අමතර කොටස් නියෝජිත ආයතනය සතුව නොමැති බව ප්‍රකාශකළ බව දක්වමින් 2024 සැප්තැම්බර් 13 දින වෙනත් ආයතනයකින් මිල ගණන් ඉල්ලුම් කර තිබුණි. මේ අනුව රු.488,100 ක ඇස්තමේන්තුවක් ලබාදී තිබුණු අතර එම මුදලට වාහනය අලුත්වැඩියා කර තිබුණි. මේ අනුව එකම දෝෂය වෙනුවෙන් අවස්ථා දෙකකදී එකිනෙකට වෙනස් වූ අලුත්වැඩියාවන් දෙකක් සිදුකර තිබුණු අතර මෙම වාහනයේ නියෝජිත ආයතනයෙන් ලබගැනීමට යෝජිත වාර්තාව විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම මෙම වාර්තාව ලබාගැනීම සඳහා යොමුකරන ලද ලිපිය සමඟ මෙම වාහනයේ අලුත්වැඩියාවෙන්	මේ සම්බන්ධයෙන් දිගින් දිගටම ඔවුන් වෙතින් විමසීම් කළ අතර, එම ආයතනයේ සේවයේ නියුතු පුද්ගලයින්ගෙන් තොරතුරු ලබාගත යුතුව ඇති බැවින්, කඩිනමින් එම වාර්තාව ලබාදීමට කටයුතු කරන බව වාචිකව දැනුම් දුන් බව.	එකම දෝෂය වෙනුවෙන් අවස්ථා දෙකකදී එකිනෙකට වෙනස් වූ අලුත්වැඩියාවන් සිදුකිරීම සම්බන්ධයෙන් නියෝජිත ආයතනයෙන් ලබගැනීමට යෝජිත වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය.

	පසුව නැවත භාරදී ඇති ගියර් පද්ධතියෙන් ඉවත් කරන ලද පැරණි අමතර කොටස් පරීක්ෂාව සඳහා නියෝජිත ආයතනයට භාරදුන් බවක්ද තහවුරු නොවුණි.		
	(iii) වාහනයේ රේඩියේටරය නැවත යෙදීම වෙනුවෙන් නියෝජිත ආයතනය විසින් 2024 ජුනි 14 දින ලබාදෙන ලද රු. 359,765 ක ඇස්තමේන්තුවට අදාළ අලුත්වැඩියාව ටොයෝටා නියම අමතර කොටස් යොදා සිදුකිරීමට යෝජිතව තිබියදී ටොයෝටා නියම අමතර කොටස් වෙනුවට දේශීය අමතර කොටස් යොදා අලුත්වැඩියා කිරීමට ලැබුණු විධිමත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම මෙහි දැක්වෙන ඇතැම් ටොයෝටා නියම අමතර කොටස් මිලට වඩා දේශීය අමතර කොටස් මිල වැඩිවීමට හේතුන්ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	නියම අමතර කොටස් මිලට වඩා දේශීය අමතර කොටස් මිල වැඩිවීම සම්බන්ධව පැහැදිලි කිරීමක් නියෝජිත ආයතනයෙන් ලිඛිතව විමසා ඇති බව.	අලුත්වැඩියාවට අදාළ විධිමත් අනුමැතිය හා ටොයෝටා නියම අමතර කොටස් මිලට වඩා දේශීය අමතර කොටස් මිල වැඩිවීමට හේතුන්ද විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඡ)	පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහල 2022 වර්ෂයේදී ශික්ෂණ රෝහලක් බවට පත් කිරීමට අනුමත කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනැති සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක HM/CF01/FR135/2025 දරන ලිපිය මඟින් ශික්ෂණ රෝහලකට අදාළ මූල්‍ය බලතල පවරා දී තිබුණ ද, විගණිත දින වූ 2025 පෙබරවාරි 19 දින වන විටත් ශික්ෂණ රෝහලක් බවට පත් කිරීමේ ගැසට් නිවේදනය නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ශික්ෂණ රෝහලට අදාළ කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් කිරීමට අදාළ ගැසට් පත්‍රය, මෙතෙක් නිකුත් කර නොමැති බව, පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහල ශික්ෂණ රෝහලක් බවට පත්කිරීමට අවශ්‍ය සායනික සේවා වැඩිදියුණු කිරීම් බොහොමයක් මේ වන විටත් සිදු කොට ඇති බව.	ශික්ෂණ රෝහලක් බවට පත් කිරීමේ ගැසට් නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.
(ජ)	පොළොන්නරුව ශික්ෂණ රෝහලේ හෘද කැතීටකරන සේවාව පැය 24 පුරාම ක්‍රියාත්මක කළ ද, ප්‍රමුඛතා ලේඛනයේ හා Routine වල 2025 පෙබරවාරි 10 දින වන විට පිළිවෙලින් රෝගීන් 192 දෙනෙකු 2025 ජුනි මස දක්වා ද, රෝගීන් 1,517 ක් 2026 වර්ෂය අග දක්වා පොරොත්තු ලේඛනවල සිටින බැවින් මෙම අංශයේ ධාරිතාව වැඩි කර පොරොත්තු ලේඛනවල රැඳී සිටින කාලය අවම කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	මූල්‍ය පහසුකම් සොයාගැනීමට නොහැකිවීම මත ඉදිකිරීම් සිදුවී නොමැති බව, 2025-2026 වසර නව සංවර්ධන ව්‍යාපෘතීන් යටතේ රෝහලේ හෘද රෝග අංශයේ ධාරිතාවය ඉහළ නැංවීම කෙරෙහි රෝහල් පරිපාලනය අවධානය යොමු කොට ඇති බව.	හෘද රෝග ප්‍රතිකාර අංශයේ ධාරිතාව වැඩි කරගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ට)	දෛනිකව සායනික අපද්‍රව්‍ය 200kg පමණ එකතු වුවද ඒවා විධිමත්ව බැහැර කිරීමේ ක්‍රමවේදයක් කුලියාපිටිය ශික්ෂණ රෝහල තුළ ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් රෝහල් පරිශ්‍රයේ ගොඩ	දැනට මෙම රෝහලේ ආසාදිත කසල භාරගනු ලබන්නේ හලාවත මහ රෝහල පමණක් වන අතර එහි ප්‍රමාණය මසකට	අපද්‍රව්‍ය අපහරණය කිරීම විධිමත්ව කළමනාකරණය කළ යුතුය.

	ගසා තිබුණි. එමෙන්ම 2024 අප්‍රේල් 25 වන දින සිට මෙටාමයිසර් යන්ත්‍රයේ කටයුතුද නැවතීම හේතුවෙන් ගොඩගැසුනු ඉතා විශාල ඉවතලන සායනික ද්‍රව්‍ය නිසා රෝහල් පරිශ්‍රයට දැඩි පාරිසරික හා සෞඛ්‍ය තර්ජනයක් ඇති වීම හේතුවෙන් 2024 දෙසැම්බර් මාසයේදී රු.9,203,950 ක් ගෙවා පුද්ගලික සමාගමක් වෙත ගෙවා අපද්‍රව්‍ය ඉවත් කරවාගෙන තිබුණි. පෞද්ගලික අංශය විසින් බර ප්‍රමාණය මත මිල තීරණය කරන අතර වැසි සහිත කාලගුණ තත්ත්වයන්හිදී ජලය එක් රැස්වීමෙන් එහි බර ප්‍රමාණයන් වැඩිවීම පිරිවැය වැඩිවීමටද හේතු වී තිබුණි. තවද සායනික අපද්‍රව්‍ය හැරුණු විට භාවිතයෙන් බැහැර කළ වීදුරු, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ආදියද, විශාල ප්‍රමාණයක් රෝහල් පරිශ්‍රයේ ගොඩ ගසා තිබුණි. මේ අනුව අප ද්‍රව්‍ය බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් රෝහල තුළ ස්ථාපිත නොවීම හේතුවෙන් ඉතා අධික පිරිවැයක් දැරීමට මෙන්ම පාරිසරික හා සෞඛ්‍යමය හානි ගැටළු වලට ද මුහුණ දීමට සිදු වී තිබුණි.	4000**Kg** කට සීමාකොට ඇති බව, එම යන්ත්‍රය වරින් වර අක්‍රිය වන නිසා ඇතැම් විට මාස පහක පමණ කාලයක් කසල භාර ගැනීම සිදු නොකරන බව, රෝහල තුළ එකතු වී තිබුණු සායනික අපද්‍රව්‍ය හා අලුතින් එකතු වන සායනික අපද්‍රව්‍ය වර්ෂාවට හසුවීම නිසා ඇති වන සෞඛ්‍ය තර්ජනය වලක්වා ගැනීමට ආවරණයක් සහිත ගබඩාවක් ඉදිකිරීමට කටයුතු යොදා ඇති බව, සායනික අපද්‍රව්‍ය හැකි ඉක්මනින් ඉවත් කළ යුතු බැවින් ලබා ගත යුතු අවස්ථා උපයෝගී කරගෙන සායනික අපද්‍රව්‍ය ඉවත් කිරීමට පියවර ගෙන ඇති බව, මෙයට අමතරව පිළිකාකාරකයන් වන සයලින් හා ෆෝමලින් ඒවා අඩංගු කොට තිබූ බෝතල්ද සමඟ ටෙන්ඩර් ක්‍රියාවලියකින් පසු පුද්ගලික ආයතනයක් වෙත භාරදුන් බව.	
(ඨ)	ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල හා රෝහලේ ආරක්ෂක නිලධාරී කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ආරක්ෂක නිලධාරීන්ගේ රාත්‍රී පැමිණීමේ ලේඛනවල ඇතුළත් කර තිබුණු තොරතුරු එකිනෙකට වෙනස් බව නිරීක්ෂණය වූ අතර රාත්‍රී සේවා මුරවල ආරක්ෂක නිලධාරීන්ගේ පැමිණීමේ නිරවද්‍යතාවය තහවුරු කිරීමකින් හා නිසි අධීක්ෂණයකින් තොරව ගෙවීම් කටයුතු සිදුකරන බව නිරීක්ෂණය විය. ඒ අනුව 2024 ජූලි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා විගණන නියැදි පරීක්ෂා කාලය තුළදී අවිධිමත් පැමිණීමේ හා පිටවීමේ ලේඛන තොරතුරු මත එකතුව රු.මිලියන 2.859 ක් අවිධිමත්ව ගෙවා තිබුණි.	විගණනයෙන් පෙන්වා දුන් පරිදි මෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා අභ්‍යන්තර ක්‍රමවේදයක් ලෙස රෝහල් ඕවර්සියර් විසින් ඉදිරිපත් කරනු ලබන රාත්‍රී සේවා මුර වාර්තාවේ කොටසක් ලෙස රාත්‍රී සේවා මුර සඳහා ආරක්ෂක නිලධාරීන් යෙදවීම සම්බන්ධවද තහවුරුවක් ලබාගෙන ඉදිරියේදී බිල්පත් ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදී ඇති බව, විගණන විමසුම පරිදි යම් අයකිරීමක් වේ නම් එම අදාළ මුදල ඉදිරි බිල්පත් මඟින් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව.	පැමිණීමේ නිරවද්‍යතාවය තහවුරු කිරීමකින් හා නිසි අධීක්ෂණයකින් ගෙවීම් කටයුතු සිදුකළ යුතු අතර වැඩිපුර ගෙවා ඇති මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඩ)	ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල, 2024 ජනවාරි 01 දින සිට කොන්ත්‍රාත්කරු විසින් නොගෙවූ රු.මිලියන 2.94 ක හිඟ බිල්පත් අයකර ගැනීමට හෝ කොන්ත්‍රාත්කරුට ගෙවීමේ දී අඩුකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. තවද ඒ ඒ මාසයේ විදුලි ගාස්තුව පමණක් ගෙවීම නිසා 2025	2023 දෙසැම්බර් 31 දිනට විදුලි ගිණුම් ශේෂයක් පැවති බැවින් විදුලි බිල්පත් ගෙවීමේදී අධිභාර මුදල් ගෙවීම සම්බන්ධව ගැටළුකාරී තත්ත්වයක් වූ අතර තවද මාසික විදුලි ගාස්තු තුළ	හිඟ හා අධිභාර ගාස්තු අයකර ගැනීමට හෝ කොන්ත්‍රාත්කරුට ගෙවීමේ දී අඩුකර ගැනීමට හෝ කටයුතු කළ යුතු අතර අධිභාර

	ජනවාරි 31 දිනට හිඟ හා අධිභාර ගාස්තුව එකතුව රු.මිලියන 27.23 ක් විදුලි බල මණ්ඩලයට තවදුරටත් ගෙවිය යුතුව තිබුණි.	මෙම අධිභාර මුදල් ඇතුළත් වීම සම්බන්ධව නිවැරදි තහවුරුවක් ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් ලබා ගන්නා තෙක් මාසික විදුලි බිල්පත් පමණක් ගෙවීම සිදුකරන ලද අතර, 2025 අප්‍රේල් 22 දින පැවති විගණන විමසුම් සාකච්ඡාව පරිදි 2025 මාර්තු මස සිට අධිභාර මුදල් සමඟ බිල්පත් ගෙවීමට කටයුතු කරන ලද බව, තවද මේ සම්බන්ධව 2025 අප්‍රේල් 25 දින නැවත ලංකා විදුලි බල මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමට සහ අදාළ ගිණුම් වාර්තා ලබා ගැනීමට කටයුතු කළ බව.	අයනොකරන පරිදි නියමිත කාලය තුළ බිල්පත් ගෙවීමට වැඩපිළිවෙලක් සකස් කර ගත යුතුය.
(ණ)	2022 ජනවාරි සිට අගෝස්තු දක්වා මහමෝදර ශික්ෂණ රෝහලට අදාළව සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් නිකුත් කරන ලද බිල්පතේ මනුකරණයේ දී සිදුවී තිබුණු තාක්ෂණික දෝෂයක් නිසා මනු කියවීම වැරදි ලෙස සටහන් වී තිබුණි. එම දෝෂයන් නිවැරදි කර නව බිල්පත් සකස් කර රු.මිලියන 3.62 ක්වූ හිඟ මුදලක් එම සමාගමට ගෙවිය යුතු ව තිබුණ ද විගණිත දිනය දක්වා එම ගාස්තු ගෙවා නොතිබුණි. තවද මහමෝදර හෙද විදුහල වෙනුවෙන් 2015 නොවැම්බර් සිට 2021 ඔක්තෝබර් දක්වා කාලයට අදාළව විදුලි ගාස්තු ගණනය කිරීම රාජ්‍ය ප්‍රභවය යටතේ එනම් (GV කාණ්ඩයට) අනුකූලව සිදු නොකිරීම නිසා එකතුව රු.මිලයන 2.96 ක් වැඩියෙන් සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගමට ගෙවා තිබුණු අතර එම වැඩිපුර ගෙවූ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	විගණන විමසුම පරිදි නිවැරදි අය ක්‍රමය යටතේ විදුලි ගාස්තු ගණනය නොකිරීම හේතුවෙන් රු.3,235,697 ක මුදල නැවත අයකර රාජ්‍ය ආදායමට බැර කළ යුතු බව, මෙහිදී අය විය යුතු මුදල සම්බන්ධව ලංකා විදුලි පෞද්ගලික සමාගම වෙත ලිපි මඟින් හා වාචිකව කීප වරක් දැනුවත් කළද මේ සම්බන්ධව ප්‍රතිචාරයක් ලැබී නොමැති බව, තවද වැඩිපුර ගෙවීමක් සිදුව නොමැති බවත් මීට පෙර ඒ සම්බන්ධව අයදුම්පතක් යොමුකර ඇත්නම් අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලෙසද LECO ආයතනය දන්වා එවා ඇති බව, නමුත් ඊට අදාළ නිශ්චිත තොරතුරු සොයා ගැනීමට නොහැකි වූ බව, එම නිසා නව අයදුම්පතක් යොමු කිරීම මඟින් මෙම ගැටළුව කඩිනමින් නිරාකරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලද බව, ඉහත කරුණු අනුව ගෙවිය යුතු රු. 3,624,263 ක මුදල ගෙවා නොමැති බව, රෝහලේ විදුලි සැපයුම් 02 ට අදාළ වටිනාකම් හිලව් කර ඉතිරි මුදල් ගෙවීමට LECO ආයතනය වෙත ඉල්ලීමක් කර ඇති බව.	වැඩිපුර ගෙවූ ගාස්තු අයකර ගැනීමටත් හිඟ මුදල් ගෙවීමටත් කටයුතු කළ යුතුය.

(ත)	නිදර්ශක දීමනා ගෙවීමේදී පරීක්ෂණ සංඛ්‍යාව අදාළ කර ගත යුතු වුවත් ඒ වෙනුවට පරීක්ෂණවල අන්තර්ගත සංයුක්තයන් වෙනුවෙන් වෙන වෙනම දීමනා ගණනය කිරීමෙන් වෛද්‍ය පර්යේෂණ කාර්මික විද්‍යාඥයින් සඳහා රු. 258,502 ක් හා රසායනාගාර පරීක්ෂණ සහයකයින් සඳහා රු.57,500 ක් මහනුවර ජාතික රෝහල විසින් 2023 අගෝස්තු මාසයේ වැඩිපුර ගෙවා තිබුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2001 ඔක්තෝබර් 30 දිනැතිව නිකුත් කර ඇති අංක 02-117-2001 දරන පොදු චක්‍රලේඛය මඟින් නියම කර ඇති විධිවිධාන වලට අනුව නිදර්ශන දීමනා සඳහා ගෙවීම් කර ඇති බැවින් විමසුමේ සඳහන් පරිදි වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය නොවන බව.	මීට පෙර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා විගණකාධිපති විසින් ලබාදී ඇති නිර්දේශය අනුව නව චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ථ)	පේරාදෙණිය ශික්ෂණ රෝහල් භූමියේ පවතින මහල් 03 කින් සමන්විත වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ පුහුණු පාසල පේරාදෙණිය රෝහලේ සේවාවන් පුළුල් කිරීම සඳහා 2024 මාර්තු 11 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක ETR/D/MLT/09/2023 දරන ලිපිය අනුව රෝහල වෙත පවරාගෙන තිබුණි. නමුත් එම ආයතනය පවරා ගන්නා අවස්ථාව වන විට එම ආයතනයේ සේවය කරමින් සිටි පස්දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලය හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ, රසායනාගාර උපකරණ, රසායන ද්‍රව්‍ය හා පුස්තකාල පොත් වැනි මානව හා භෞතික සම්පත් උපයෝජනය පිළිබඳව සැලසුම් සහගතව අවශ්‍ය තීරණ නොගැනීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට එම සම්පත් ඌණ උපයෝජිතව පැවතුණි.	රසායනාගාර කාර්මික විද්‍යාඥ පේරාදෙණිය ශික්ෂණ රෝහලේ රසායනාගාරය වෙත අනුයුක්ත කිරීමට කටයුතු කර ඇති බව, පුස්තකාල පොත් විශ්ව විද්‍යාල හෝ රජයේ පාසැල් වෙත ලබා දීමට අනුමැතිය ලබා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී තිබුන අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ හා භාණ්ඩ සමීක්ෂණ ප්‍රධාන ගණකාධිකාරී විසින් ආයතනයේ භාණ්ඩ, උපකරණ හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය විධිමත් පරිදි අදාළ ආයතන වෙත ලබා දීමට අනුමැතිය ලබා දී ඇති බව.	පුහුණු පාසලේ මානව හා භෞතික සම්පත් ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය.
(ද)	නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල තුළ විවාහක රජයේ නිවාස 65 ක් ඇති අතර ඒවා උපලේඛනගත හෝ උපලේඛනගත නොවන ලෙස බෙදා වෙන්කර නොතිබුණු අතර කුලී අය කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුගමනය කර නොතිබුණි. එසේම පහසුකම් සැපයීමට රු. 990,000 කට කුලී පදනමට ලබාගත් නිවසක් සඳහා කුලී නියමිත පරිදි අය නොකිරීමෙන් රජයට රු.679,968 ක අලාභයක් වී තිබුණි.	උපලේඛන නිවාස පිළිබඳව තොරතුරු දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් විමසූ මුත් එම තොරතුරු නොමැති බව දන්වා ඇති බව, ඒඅනුව නැවත උපලේඛන ගත කිරීමට කටයුතු කරමින් සිටින බව, කුළී පදනමට ලබා ගත් නිවස ලබා ගැනීමට පෙර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) වෙතින් අනුමැතිය ලබා ගෙන ඇති බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කුලී අය කිරීමට කටයුතු කළ යුතු අතර හිඟ කුලි මුදල් අයකරගෙන විගණනයට ඒ බව තහවුරු කළ යුතුය.
(ධ)	ඕස්ට්‍රේලියානු ණය ආධාර යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ පිරිවැය එ.ජ. ඩොලර් 701,335.83 ක් පමණ වූ **Metamizer** යන්ත්‍රයක් 2017 ජුනි16 දින හලාවත මහ රෝහල වෙත ලබාදී තිබුණි. එහෙත් රෝහලේ සායනික අපද්‍රව්‍ය අපහරණය, 2021 වර්ෂයේ දී ලබා දී තිබුණු	සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ බයෝමෙඩ් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම මේ සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් නොගත් අතර 2023-2024 වර්ෂ වලදී දිගින් දිගටම මෙම රෝහල සඳහා මෙටමයිසර් යන්ත්‍ර යේ අවශ්‍යතාවයක් නොමැති බවත්	වත්කම් නිසි පරිදි කළමනාකරනය කිරීමට කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගත් නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු

	incinerator යන්ත්‍රය මඟින් සිදු කෙරෙන බැවින් මෙම යන්ත්‍රයේ අවශ්‍යතාවයක් නොමැති බවත් රෝගීන්ට නේවාසික පහසුකම් වෙනුවෙන් ඉඩ සලසා ගැනීමට රෝහල් භූමියෙන් ඉවත් කරදෙන ලෙසත් රෝහල විසින් අමාත්‍යාංශ ලේකම් වෙත දිගින් දිගටම ඉල්ලීම් කර තිබුණද විගණන දිනය වූ 2025 මාර්තු 12 දින වන විටත් යන්ත්‍රය නිෂ්කාර්යව රෝහල් භූමියේ පැවතුණි.	රෝගීන්ට නේවාසික පහසුකම් වෙනුවෙන් ඉඩ සලසා ගැනිමට මෙම යන්ත්‍රය රෝහල් භූමියෙන් ඉවත් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව.	කළ යුතුය.
(න)	අනුරාධපුර රෝහලේ ස්ථාපිත කර ඇති පල්දෝරු පද්ධතිය වසර 03 කට වැඩි කාලයක සිට අක්‍රියව පවතින අතර රෝහලේ බැහැර කරනු ලබන මලද්‍රව්‍ය/අප ජලය සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයකට පරිසරයට බැහැර කිරීමකින් තොරව අනුරාධපුර නගරයට පානීය ජලය සපයන මල්වතු ඔයට සම්බන්ධ වැව් හා ඇල මාර්ගවලට ක්‍රමයෙන් බැහැර කරනු ලබන අතර මධ්‍යම පරිසර අධිකාරිය විසින් අවස්ථා කීපයකදීම අවවාද ලිපි නිකුත් කර තිබුණද ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගයන් මේ දක්වාම ගෙන නොතිබුණි.	මෙම පද්ධතියේ ධාරිතාව මේ වන විට ප්‍රමාණවත් නොවන අතර නවීන තාක්ෂණයෙන් යුත් නව පද්ධතියක් ස්ථාපනය කරන තෙක් පවතින පද්ධතියේ අඩුපාඩු හඳුනාගනිමින් එම අඩුපාඩු කඩිනමින් යථා තත්ත්වයට පත් කිරිම සම්බන්ධයෙන් අවස්ථා කීපයකදිම අනුරාධපුර මහනගර සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය සමඟද සාකච්ඡා ගනනාවක් පවත්වන ලද අතර දැනට අප විසින් මෙම පද්ධතිය අලුත්වැඩියා කිරිමට පියවර ගණනාවක් ගෙන ඇති අතර එම කටයුතු අවසන් වීමෙන් අනතුරුව එහි ප්‍රගතිය ඉදිරියේදි ඔබ වෙත වාර්තා කරන බව.	අපද්‍රව්‍ය අපහරණය කිරීම විධිමත්ව කළමනාකරණය කළ යුතුය.
(ප)	ඕස්ට්‍රේලියානු ණය ආධාර යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ අපද්‍රව්‍ය කොටස්වලට කැබලි කිරීමට අනුරාධපුරය ශික්ෂණ රෝහල් භූමිය තුළ ස්ථාපිත කර තිබූ metamaizer යන්ත්‍රය 2022 වර්ෂයේ සිට අක්‍රියව ක්‍රමයෙන් දිරාපත් වෙමින් පවතින අතර එම යන්ත්‍රය මඟින් පූර්ව වශයෙන් කැබලි කරන ලද අපද්‍රව්‍ය හා සායනික අපද්‍රව්‍ය කොටස් රෝහල් භූමියේ, රෝහල් භූමිය මායිම්ව පවතින ඇල මාර්ගය ආශ්‍රිතව වසර 02 කට වඩා වැඩි කාලයක සිට අනාරක්ෂිතව ගොඩගසා ඇති බව නිරීක්ෂණය විය. එකී අපද්‍රව්‍ය ඇල මාර්ගවලට සම්බන්ධ වීම වැළැක්වීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මෙටාමයිසර් යන්ත්‍රය මඟින් කැබලි කරන ලද කසළ බැහැර කිරිම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද ස්ථානයක් නම් කර නොදිම හේතුවෙන් කැබලි කරන ලද කසළ රෝහලේ පල්දෝරු පද්ධතිය ආශ්‍රිතව එක්රැස්වී පවතින අතර එම සායනික කසල බැහැර කිරිම සඳහා මිල ගනන් කැඳවීමට කටයුතු කර ඇති බව, මේ වන විට ලංසු ඇගයිමේ කමිටුවේ පවතින අතර එම කටයුතු අවසන් කළ වහාම පල්දෝරු පද්ධතිය ආශ්‍රිතව ගොඩගැසි ඇති කැබලි කරන ලද කසල විධිමත් පරිදි බැහැර කිරිමට කටයුතු කරන බව.	-එම-

(ඵ)	1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තියට අදාළ නියමයන් පනවමින් නිකුත් කර ඇති 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අනුරාධපුර ශික්ෂණ රෝහල ද මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු වුවත්, පරිසර බලපත්‍රය ලබා දීම සඳහා සලකා බැලිය යුතු නියමයන් රෝහල ක්‍රියාත්මක නොකිරීම නිසා 2017 වර්ෂයේ සිට පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා දී නොතිබුණි.	අපජල පිරිපහදු පද්ධතිය, සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම හා සායනික නොවන අපද්‍රව්‍ය බැහැර කිරීම යන අංශයන්හි පවතින අඩුපාඩු හේතුවෙන් රෝහල වෙත මේ දක්වා මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් ලබාගතයුතු පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට නොහැකි වී ඇති අතර මේවන විටත් එම අඩුපාඩු මගහරවා ගැනීමට රෝහල විසින් පිළියම් ගනනාවක් අනුගමනය කරමින් පවතින අතර එම කටයුතු අවසන් වීමෙන් අනතුරුව පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන බව.	පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(බ)	අංක LW-1558 දරන ගිලන්රථය 2021 ජූනි 22 දින අනතුරුට පත්ව රු.2,698,925 කට ආසන්න අලාභයක් සිදුව අලුත්වැඩියා කිරීමකින් තොරව කෑගල්ල ශික්ෂණ රෝහලේ වසර 3 ½ කට වැඩි කාලයක් නිෂ්කාර්යයව පවතින අතර, අනතුර සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂාවක් සිදු නොකිරීම අලුත්වැඩියා සිදු නොකිරීමට හේතුවක්වී තිබුණි. ගිලන්රථය අනතුරට පත්වන අවස්ථාව වන විට කිසිදු රක්ෂණාවරණයක් රහිතව ධාවනයේ යෙදවීම හේතුවෙන් අලාභය ආවරණය කර ගැනීමට නොහැකිව ඇති අතර, වෙනත් වගකිව යුතු පාර්ශවයක් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට මේ සම්බන්ධ මූලික විමර්ශනය අවසන්කර අලාභයට වගකිවයුත්තන් හඳුනා ගෙන ඒ සම්බන්ධ වාර්තාව අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කරමින් පවතින බව.	විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් අලාභය අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(භ)	වසංගත රෝග විද්‍යා අංශය වෙනුවෙන් 2024 වර්ෂයේදී ශීත ලොරි රථ 10 ක් හා කැබ් රථ 21 ක් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල වෙතින් ලබා දී තිබුණි. ඒ් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
	(i) 2024 පෙබරවාරි 20 දින මෙම ලොරි රථ 10 වරායට ගෙනැවිත් තිබුණද මාස තුනකට ආසන්න කාලයක් නිෂ්කාශන කටයුතුවලට ගතවීම මත රු.මිලියන 66.38 ක් වූ රේගු හා නිෂ්කාශන ගාස්තුවලට අමතරව රු.මිලියන 36.19 ක ගුදම් ගාස්තුවක් ගෙවීමට සිදුව තිබුණු අතර නිෂ්කාශනයෙන් පසුව ලියාපදිංචිය සිදු කරන තෙක් 2024	පිළිතුරු ඉදිරිපත් කර නැත.	විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට කටයුතු කළ

	ජූනි 28 දින සිට මාස 08 කට ආසන්න කාලයක් වෛද්‍ය සැපයීම් අංශ ගබඩා පරිශ්‍රයේ රථ වාහන අංගනය තුළ කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව ගාල් කර තිබුණි.		යුතුය.
(ii)	පිරිවැය රු.මිලියන 102.57 ක දරා නිෂ්කාශනය සිදු කළ මෙම ශීත කළ ලොරි රථ දහයේ පැති ආවරණ වැට සවි කිරීම හා වාහන ලියාපදිංචි කටයුතු කඩිනමින් සිදු කිරීමට අමාත්‍යාංශ නිලධාරීන් කටයුතු නොකිරීමත්, වර්ෂයකට ආසන්න කාලයක් වරායේ සහ වෛද්‍ය සැපයීම් අංශයේ වාහන අංගනයේ මෙම ලොරි රථ නවතා තැබීමත් හේතුවෙන් ලොරි රථවල යාන්ත්‍රික දෝෂ ඇතිවීමේ අවධානමක් පැවතිය හැකි බවත්, මෙම ලොරි රථවල බැටරි ක්‍රියාවිරහිත වීමේ අවධානමක් ඇති බවත්, එමඟින් අමතර පිරිවැයක් දැරීමට සිදුවිය හැකි බවත්, වෛද්‍ය සැපයීම් අංශය තුළ මෙලෙස ලොරි රථ නවතා තැබීම හේතුවෙන් ඖෂධ රැගෙන පැමිණෙන කන්ටේනර් රථ හා ලොරි රථ වෛද්‍ය සැපයීම් අංශයට ඇතුළු කිරීමේදී බාධාකාරී තත්ත්වයක් ඇති වී තිබුණි.	-එම-	-එම-
(iii)	එන්නත් ප්‍රවාහන ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහාත්, ක්ෂේත්‍රයේ ප්‍රතිශක්තිකරණ සායනවලට එන්නත් ඵලදායිව ප්‍රවාහනය කිරීම කාර්යක්ෂම කිරීම සඳහාත් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මඟින් ඩබල් කැබ් රථ 21 ක් ලබා දී තිබුණු අතර රු.මිලියන 144.91 ක් රේගු හා නිෂ්කාශන ගාස්තු ලෙසත්, දින 51 ක කාලයක් වරායේ රඳවා ගැනීම නිසා රු.මිලියන 5.85 ක් ගුදම් ගාස්තු ලෙසත් රක්ෂණ ගාස්තු ලෙස රු.මිලියන 1.03 ක් ගෙවා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම වරාය ගුදම් ගාස්තු හා රක්ෂණ ගාස්තු වෛද්‍ය සැපයීම් අංශයේ ඖෂධ මිලදී ගැනීමේ වැය විෂයෙන් ගෙවා ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබාදුන් ප්‍රතිපාදන අවසන් වීම මත රු.මිලියන 7.52 ක නිෂ්කාශන ගාස්තුවක් තවදුරටත් ගෙවීමට ඇති බවද විගණනයේදී නිරීක්ෂණය විය.	-එම-	-එම-
(iv)	නිෂ්කාශනය කළ මෙම ඩබල් කැබ් රථ 21 න් 07 ක් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලින් ඉල්ලුම් කළ අවස්ථාවේ ප්‍රමුඛතාවය ලෙස හඳුනාගත් ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ	රේඛීය අමාත්‍යාංශය යටතට නව රෝහල් පවරා ගැනීම හේතුවෙන් අදාළ රෝහල්වල ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු	-එම-

	කාර්යාල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලින් බැහැරව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙනත් අංශ 07 කට බෙදා දී මූලික අරමුණු වලින් බැහැරව කටයුතු කර ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.	කිරීම සඳහා අමාත්‍යාංශයේ පැවති වාහන ලබාදීම සිදුකළ අතර, සේවා අවශ්‍යතාවය මත මෙම කැබ් රථ නිලධාරීන් වෙත ලබාදුන් බව.	
(ම)	2024 වර්ෂය තුළදී වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත් වීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	රජයේ රෝහල් සඳහා නිකුත් කළ වෛද්‍ය සැපයීම් අතරින් රු.මිලියන 4,213.35 ක් වටිනා ඖෂධ ශල්‍ය හා රසායනාගාර ද්‍රව්‍ය 2024 වර්ෂයේදී තත්ත්වයෙන් අසමත්වීම මත භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර තවත් රු.මිලියන 1,367.94 ක් වටිනා ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම් මත තාවකාලිකව භාවිතය අත්හිටුවා ඇති බව නිරීක්ෂණය විය. තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් අතුරින් බොහෝමයක දෘෂ්‍ය අංශු පැවතීම, බ්‍රිතාන්‍ය ඖෂධවේදී පිරිවිතරයන්ට අනුකූල නොවීම (does not confirm to BP specification), එක්සත් ජනපද ඖෂධවේදී පිරිවිතරයන්ට අනුකූල නොවීම (doesn't not confirm to USP specification), ලේබල් කිරීමේ මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම, වර්ණය වෙනස් වීම්, පෙති කැඩීයාම්, වීදුරු කැබලි පැවතීම්, අහිතකර ප්‍රතික්‍රියාවන් ඇතිවීම් ආදී කරුණු හඳුනාගෙන තිබු අතර ඒ හේතුවෙන් භාවිතය ඉවත්කර හෝ භාවිතය අත්හිටුවා තිබිණි.	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	වෛද්‍ය සැපයීම් මිලදී ගන්නා අවස්ථාවේදීම පරික්ෂාවට ලක්කිරිමටත්, වරින් වර අහඹු නියැදි පරික්ෂාවන් සිදුකිරීමටත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු අතර භාවිතයෙන් ඉවත් කරන ලද වෛද්‍ය සැපයීම් වෙනුවෙන් ගෙවන ලද සම්පූර්ණ මුදල් අයකරගෙන විගණනයට ඒ බව තහවුරු කළ යුතුය.
(ii)	එලෙස තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කළ වෛද්‍ය සැපයීම් අතර බැක්ටීරියා ආසාදන, සමේ රෝග, මානසික රෝග, දියවැඩියා, අක්මා රෝග සඳහා භාවිතා කරන ඖෂධ හා ප්‍රතිජීවක ඖෂධ ලෙස භාවිත කරන ඖෂධ ද තිබුණි.	-එම-	-එම-
(iii)	තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් වෙනුවෙන් 2023 වර්ෂයේ දී තත්ත්වයෙන් අසමත් චක්‍රලේඛ නිකුත් කරන ලද අයිතම සඳහා 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙන් අයවිය යුතු රු.මිලියන 127.06 ක් 2025 මාර්තු 31 දින දක්වා අයකර නොතිබුණු අතර රාජ්‍ය	-එම-	අයකරගත යුතු සියලු මුදල් අයකර ගැනීමටත් වෙනත් බාහිර පාර්ශවයන්ගෙන් අයවිය යුතු වටිනාකම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත්

	ඖෂධ නීතිගත සංස්ථාව ඇතුළුව වෙනත් බාහිර පාර්ශවයන්ගෙන් අයවිය යුතු වටිනාකම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.		කිරීමටත් කටයුතු කළ යුතුය.
(ය)	අක්ෂි රෝගීන් සඳහා සිදු කරන කැටරැක් ශල්‍ය කර්මයෙන් පසු භාවිතා කරන Prednisolone Acetate Eye Drop ඖෂධය වෛද්‍ය සැපයීම් අංශයේ අංක 2021/SPC/N/R/P/00043 දරන ඇණවුම මඟින් ඇණවුම් කර තිබුණු අතර 2023 වර්ෂයේදී වටිනාකම රු.3,631,093 ක් වූ බෝතල් 50,000 ක තොගය ලැබී මාස 1 ½ කට පමණ පසු ඖෂධය තත්ත්වයෙන් අසමත් බව අනාවරණය වී තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය විසින් රෝහල් වෙත මෙම ඖෂධය නිකුත් කිරීමට පෙර ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බවද, කොළඹ ජාතික අක්ෂි රෝහල හා නුවරඑළිය දිස්ත්‍රික් රෝහල්වල රෝගීන් අක්ෂි ආසාත්මිකතාවයන්ට ලක් වී ඇති බව 2024 මැයි 10 දිනැති විගණකාධිපතිගේ අංක SPR/2024/03 දරන විශේෂ විගණන වාර්තාව මඟින්ද නිරීක්ෂණය කරන ලදි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
	(i) නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේ ඉහත ඖෂධය භාවිතයෙන් පෙනීම අහිමි වූ රෝගීන්ට ගෙවන වන්දි ප්‍රමාණය තීරණය කිරීමට පත්කළ කමිටුවේ තාක්ෂණික කමිටු වාර්තාව අනුව නුවරඑළිය රෝහලේදී මෙම ඖෂධය හේතුවෙන් අවදානමට ලක්වූ රෝගීන් 17 දෙනෙකුගෙන් රෝගීන් 12 දෙනෙකු ස්ථිරවම එක් ඇසක පෙනීම අහිමි වීම හේතුවෙන් (Permanent visual loss) නීත්‍යානුකූලව අන්ධභාවයට පත්වී ඇති බවත් (Legally blind) තවත් රෝගීන් තිදෙනෙකුගේ සියයට 70කට වඩා පෙනීම අහිමි වී ඇති බවත් (70% permanent blindness, 75% permanent loss of vision) විගණනයේදී නිරීක්ෂණය විය. එසේම එම ඖෂධය භාවිතයෙන් අගතියට පත් වූ අනෙකුත් රෝහල්වල රෝගීන් සම්බන්ධව විමර්ශන සිදුකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	ඖෂධය භාවිතයෙන් අගතියට පත් වූ අනෙකුත් රෝහල්වල රෝගීන් සම්බන්ධව විමර්ශනයක් සිදුකර වාර්තාවක් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
	(ii) නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේ අක්ෂි වාට්ටුවේ සිදුවූ සිදුවීම පිළිබඳව විමර්ශනය කිරීමට 2023 ජුනි 13 දින පත්කරන ලද කමිටුවේ නිර්දේශ අනුව මෙම බරපතල	-එම-	විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන්

	තත්ත්වයෙන් අසමත්වීමෙන් රෝගීන්ට දැඩි හානියක් සිදුව ඇති බවත්, නිෂ්පාදක අසාධු ලේඛනගත කළයුතු බවත්, බලපෑමට ලක්වූවන්ට සමාගම හරහා වන්දි ලබා ගැනීමටත්, තත්ත්වයෙන් අඩු ඖෂධ සපයන සමාගම්වලින් වන්දි ලබා ගැනීමට ප්‍රතිපාදන ප්‍රසම්පාදන ලියවිලි තුළ ඇතුළත් කිරීමටත්, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය හරහා අහඹු තත්ත්ව පරීක්ෂාවන් වැඩි කිරීමටත් යෝජනා කර තිබුණි. එසේම 2024 පෙබරවාරි 12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, මෙම සිදුවීමෙන් වින්දිතයන් බවට පත්වූවන්ට ලබාදිය යුතු වන්දි ප්‍රමාණය තීරණය කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත්කර එකී වින්දිතයන් සඳහා කරුණා සහගත දීමනාවක් හෝ සම්පූර්ණ වන්දිය හෝ නොපමාව ගෙවීමටත්, ඖෂධ රෝහල් වෙත මුදාහැරීමට පෙර එහි ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමටත්, ඖෂධ පරීක්ෂා කිරීම සඳහා රසායනාගාර උපරිම ප්‍රශස්ථ මට්ටමින් යොදවා ගැනීමටත්, ප්‍රමිතියෙන් තොර ඖෂධ සපයන සැපයුම්කරුවන්ට එරෙහිව ගිවිසුම්ගත ප්‍රතිකර්මයන්ට අමතරව පොදු නීතියේ ප්‍රතිපාදන අනුව හානිපූරණය සඳහා වන්දි ලබා ගැනීමට කටයුතු කිරිමට යෝග්‍ය පියවර ගැනීමට සෞඛ්‍ය ලේකම්ට නියම කර තිබුණි. නමුත් මෙම සිදුවීම සිදුවී 2025 අප්‍රේල් 10 දින වන විට වර්ෂ 02 කට ආසන්න කාලයක් ගතවී ඇතත් අදාළ රෝගීන්ට වන්දි ලබාදීමට අපොහොසත් වී තිබුණු බවත්, ඖෂධය හේතුවෙන් බලපෑමට ලක්වූවන්ට සමාගම හරහා වන්දි ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොමැති බවත්, තත්ත්වයෙන් අසමත් ඖෂධ සපයන සමාගම්වලින් වන්දි ලබා ගැනීමට අදාළ ප්‍රතිපාදන ප්‍රසම්පාදන ලියවිලි තුළ ඇතුළත් කිරීමට මෙතෙක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව කටයුතු කර නොමැති බවත්, මෙවැනි සැපයුම්කරුවන් අසාධුලේඛනගත කිරීමට ක්‍රියාමාර්ගයන් ගෙන නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.		විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් අදාළ රෝගීන්ට වන්දි ලබාදීමටත් කටයුතු කළ යුතුය.
(ර)	වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ විසින් 2023 ඔක්තෝබර් 09 හා 18 දිනවල නිකුත් කරන ලද අංක MSD/Q/P/2023/56 හා MSD/Q/Special/2023/4 දරන චක්‍රලේඛ මඟින් Human Immunoglobulin හා Rituximab ඇතුළු ඖෂධ තත්ත්වයෙන් අසමත්	-එම-	සැපයුම්කාර සමාගමෙන් අයකරගත යුතු මුදල් අයකර ගැනීමට පියවර නොගැනීම සම්බන්ධයෙන් විධිමත්

	වීම මත භාවිතයෙන් ඉවත් කර තිබුණි. රට තුළ මහත් ආන්දෝලනයකට ලක් වූ ඉහත ඖෂධ 02 මිලදී ගැනීමේ ක්‍රියාවලිය, බෙදාහැරීම හා තත්ත්වයෙන් අසමත් වීම හා ඖෂධය නිෂ්පාදනය කිරීමට රුධිර ප්ලස්මා ලබා ගැනීම පිළිබඳව කරුණු ඇතුළත් “2022/2023 වර්ෂවල ඖෂධ අවශ්‍යතාවය, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම හා නියාමනය” පිළිබඳ 2024 මැයි 10 දිනැති අංක SPR/2024/03 දරන විගණකාධිපති විශේෂ විගණන වාර්තාව මගින්ද කරුණු අනාවරණය කරන ලදි. නමුත් මෙම ඖෂධ 02 ක තත්ත්වයෙන් අසමත්ව 2025 අප්‍රේල් 10 විගණිත දින වන විට වර්ෂ 1 ½ කට ආසන්න කාලයක් ගතව ඇතත් 2023 ජනවාරි 13 සැපයුම්කරු වෙත නිකුත් කරන ලද අංක ICL/EOI/P1/174/2022 දරන ගැණුම් ඇණවුමේ 9 ඡේදය ප්‍රකාරව මේ වන තෙක් අදාළ සැපයුම්කාර සමාගමෙන් රු.මිලියන 180.37 ක් වූ එම ඖෂධ මිලදී ගැනීමට අදාළ පිරිවැය හා සියයට 25 ක් වූ පරිපාලන වියදම් අයකර ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන නොතිබුණි.		පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් අයකරගත යුතු සියලු මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ල)	2022 හා 2023 වර්ෂයන්හිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල වෙත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙතින් එ.ජ.ඩොලර් 2,500,000 ක් හා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් රු.මිලියන 100.00 ක් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අතර ඖෂධ මිලදී ගැනීම සඳහා එම අරමුදල් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලබා දී තිබුණි.මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	රටේ පැවති මූල්‍ය හා ආර්ථික අර්බුදය හමුවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් එ.ජ.ඩොලර් මිලියන 02ක මුදලක් රිජ්වේ ආර්යා ළමා රෝහල හා කාසල් විදියේ කාන්තා රෝහල සඳහා ප්‍රදානයක් ලෙස ලබා දීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුව විසින් එකඟතාවය පළකර තිබුණු නමුත් 2022 ජුලි 08 දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් එ.ජ.ඩො. 2,000,000 ක මුදලක් සෞඛ්‍ය සංවර්ධන අරමුදල වෙත ලබා දී තිබුණු අතර, සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් ඉන් එ.ජ.ඩොලර් 1,999,998 ක මුදලක් Meropenem injection 1g හා 500mg ඖෂධ ප්‍රසම්පාදන ය කිරීම සඳහා 2022 සැප්තැම්බර් 16 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ගෙවා තිබුණි. මෙම එ.ජ. ඩොලර් මිලියන 02ක ප්‍රදානය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් රිජ්වේ	-එම-	වගකිව යුතු නිලධාරීන් නිසි අවබෝධයකින් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	ආර්යා ළමා රෝහල සහ කාසල් වීදිය කාන්තා රෝහල සඳහා ප්‍රදානය කරන බව දක්වා තිබුණද පසුව එම අරමුදල් ඖෂධ මිලදී ගැනීම සඳහා යෙදවීමට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් නොවුණි.		
(ii)	ඉහත සඳහන් ඖෂධ 02 සඳහා 2022 සැප්තැම්බර් 16 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත අරමුදල් ලැබී තිබියදීත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් එම ඖෂධ දෙකෙහි ඉන්වොයිසි වටිනාකම සහ සේවා ගාස්තු හා වෙනත් වියදම්ද ඇතුළුව මුළු වටිනාකම වූ රු.මිලියන 817.11ක බිල්පත් නිරවුල් කිරීම සඳහා 2022 නොවැම්බර් 28 දින වෛද්‍ය සැපයීම් අංශය වෙත එවා තිබුණු අතර එම මුදල වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට පියවා තිබුණි.	-එම-	-එම-
(iii)	ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සෞඛ්‍ය සංවර්ධන අරමුදල වෙත ලබා දෙන ලද එ.ජ.ඩොලර් මිලියන 2.5 න් ඉතිරි එ.ජ.ඩොලර් 500,000 උපයෝගී කර පිළිකා රෝග සඳහා භාවිතා කරන තෝරාගත් ඖෂධ 19ක් ප්‍රසම්පාදන ය කර සැපයීම සඳහා 2023 පෙබරවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ එ.ජ.ඩොලර් 500,000ක් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබා දී තිබියදීත්, ඉන් ඖෂධ 17ක් ප්‍රසම්පාදන ය කර සැපයීම වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් නැවතත් වෛද්‍ය සැපයීම් අංශය වෙත සාවද්‍ය ලෙස රු.මිලියන 154.57 ක් වූ ඉන්වොයිසි වටිනාකම සහ රු.මිලියන 11.12 ක් වූ සියයට 10 ක සේවා ගාස්තු හා වෙනත් වියදම්ද ඇතුළුව රු.මිලියන 165.69ක් වටිනා හරපත් හා බිල්පත් නිරවුල් කිරීමේ ලේඛන ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2023 අප්‍රේල් 20 දින සිට 2024 අගෝස්තු 06 දින දක්වා කාලය තුළ බිල්පත් නිරවුල් කිරීමේ ලේඛන ලැයිස්තු 09ක් මඟින් ඉහත මුදල ඉල්ලුම් කර තිබුණි.	-එම-	-එම-
(iv)	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂ විසින් එවකට සිටි වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකට පිටපත් සහිතව සෞඛ්‍ය ලේකම් ඇමතු 2023 ඔක්තෝබර් 30 දිනැති ලිපිය ප්‍රකාරව අදාළ	-එම-	-එම-

	මුදල් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ලබා දෙන බව දන්වා තිබුණද ඒ පිළිබඳව අවධානය යොමු නොකොට විගණිත අවස්ථාව වන විට නිරවුල් කිරීමේ ලේඛන 05කට අදාළ ඖෂධ වර්ග 10 ක් සඳහා වූ රු.මිලියන 117.72 ක බිල්පත් 2023 අගෝස්තු 08 සහ නොවැම්බර් 13 යන දෙදින තුළ වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ගෙවා තිබුණි.		
(v)	ඉහත ඖෂධ 19 අතුරින් ඖෂධ අයිතම 02 ක් ප්‍රසම්පාදන ය කර සැපයීම වෙනුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් එ.ජ. ඩොලර් 12,150 ක මුදලක් 2023 පෙබරවාරි 03 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබා දී තිබුණද විගණිත දිනය වූ 2025 ජනවාරි 02 දින වන විට වර්ෂ 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණද එම ඖෂධ තොග වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා වෙත ලැබී නොමැති බව පරිගණක දත්ත පද්ධතිය අනුව නිරීක්ෂණය විය.	-එම-	-එම-
(vi)	වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබී තිබුණු ඉතිරි ඖෂධ 06ට අදාළ රු.45,055,479 ක් වූ ගෙවීම් නිරවුල් කිරීමටද විගණිත අවස්ථාව වන විට වවුචර් සුදානම් කර තිබුණු අතර මෙම ගෙවීම් සඳහාද 2024 අගෝස්තු 30 හා සැප්තැම්බර් 10 යන දිනවලදී සැපයුම් අංශයේ නිලධාරීන් විසින් ගෙවීම් වවුචර් පිළියෙල කිරීම හා හරි වැරදි බැලීම සිදුකර තිබුණ අතර, ප්‍රධාන ගණකාධිකාරී (සැපයුම්) සහ අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) විසින් එම ගෙවීම් නිර්දේශ කර තිබුණි. එම නිර්දේශ මත වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ගෙවීම් අනුමත කර තිබුණි. ඒ අනුව මෙම ගෙවීම් සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් නිසි අවබෝධයකින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
(vii)	විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2023 ජනවාරි 23 දින ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල වෙත ලබා දී තිබුණු රු. මිලියන 100ක මුදල 2023 අගෝස්තු 17 රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබාදී තිබුණි. මෙම ප්‍රදානය උපයෝජනය කරගෙන පිළිකා රෝගීන් සඳහා අත්‍යාවශ්‍ය ඖෂධ අයිතම 42ක් හැකි ඉක්මනින් සපයන ලෙස 2023 පෙබරවාරි 06 දිනැති වෛද්‍ය	-එම-	නිලධාරීන් නො සැලකිලිමත්ව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම හේතුවෙන් මූල්‍ය විෂමාචාරයක් සිදුවීමේ අවධානම විමර්ශනය

	සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති වෙත දන්වා තිබුණු අතර ඇණවුම්වලින් තෝරාගත් ඖෂධ වර්ග 15ක් සඳහා 2023 පෙබරවාරි 15 දින ඖෂධ නිෂ්පාදන සැපයීම් හා නියාමන අංශය මඟින් හදිසි මිලදී ගැනීම් යටතේ මිල ගණන් කැඳවීම සිදුකර තිබුණි. මිල ගණන් කැඳවීම 2023 පෙබරවාරි 15 දින ප.ව. 13.15ට ආරම්භ කර තිබුණ අතර මිල විවෘත කිරීම 2023 පෙබරවාරි 17 දින පෙ.ව. 10.00 ට සිදුකර තිබුණු අතර මිල ඉදිරිපත් කිරීමට දින 02කටත් වඩා අඩු කාලයක් ලබා දී තිබීම හේතුවෙන් වැඩි සැපයුම්කරුවන් ප්‍රමාණයකට ඉදිරිපත් වීමට ඇති අවස්ථාව මගහැරී ඇති බව නිරීක්ෂණය විය.		කර විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(viii)	ඉහත පරිදි දින 02කට අඩු කාලයක් තුළ හදිසියේ මිල කැඳවීම සිදුකර තිබුණද, ප්‍රසම්පාදන තීරණය ලබා ගැනීම සඳහා මාසයකට ආසන්න කාලයක්ද, තෝරාගත් සැපයුම්කරුවන් වෙත මිලදී ගැනුම් ඇණවුම් (ඉන්ඩෙන්ටු) නිකුත් කිරීමට දින 30 – 41ත් අතර කාලයක්ද ඉන්ඩෙන්ටුව නිකුත්කළ දින සිට ඖෂධ තොග ලැබීමට දින 80ත් 191ත් අතර කාලයක් ගතකර තිබීමෙන් ‘‘හදිසි අවශ්‍යතාවය’’ යන්න සැපයුම්කරුවන්ට මිල ඉදිරිපත් කිරීම සඳහා පමණක්ම අදාළ වී ඇති බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
(ix)	ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් විසින් ඉහත ඖෂධ 15 මිලදී ගැනීමට අදාළව මිල ගණන් ඇගයීම සඳහා 2023 පෙබරවාරි 22 දින සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත මිල කමිටුවක් පමණක් පත්කර තිබුණු අතර පිළිකා ඖෂධ වැනි විශේෂිත ඖෂධ ඇගයීම සඳහා තාක්ෂණික දැනුම ඇති විශේෂඥ වෛද්‍යවරයෙකු හෝ ප්‍රවීණයෙකු පත්කර නොතිබුණ අතර සෞඛ්‍ය අංශ හදිසි මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.1 ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකරනු ලබන අවස්ථාවලදී හදිසි මිලදී ගැනීම් කමිටුව විසින් තාක්ෂණික විශේෂඥයින්ගෙන් උපදෙස් ලබා ගතයුතු වුවද එපරිදි කටයුතු කළ බව තහවුරු නොවුණි.	-එම-	-එම-

(x)	තවද ඉහත මාර්ගෝපදේශයේ 2.1 ඡේදය ප්‍රකාරව සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ මිලදී ගත් අයිතමයන්හි මිලදී ගැනීමේ අවශ්‍යතාවය සාධාරණීකරණය කරමින් මිලදී ගත් අයිතමය, සැපයුම්කරු හා වටිනාකම ඇතුළත් වන පරිදි මාසික වාර්තාවන් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතියට ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රසම්පාදන අස්ථිත්වයේ අභ්‍යන්තර විගණක විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිරීක්ෂණය කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසානයේදී සාධාරණ හා ඵලදායී ක්‍රියාවලියන් සහතික කිරීමට වාර්තා කළ යුතු විය. එහෙත් ඉහත ඖෂධ වර්ග 15 ප්‍රසම්පාදන යට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-
(xi)	2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 58, 82 හා 101 වගන්ති අනුව සියලුම ඖෂධ ආනයනය, නිෂ්පාදනය, විකිණීම හා බෙදාහැරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලබා ගැනීම අනිවාර්ය වන අතර, ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳව අධිකාරිය විසින් තහවුරු කළ යුතු විය. නමුත් ඒ පිළිබඳව නොසලකා මෙම ප්‍රසම්පාදන යේදී අධිකාරියේ ලියාපදිංචිය නොමැති ඖෂධ 11ක් සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික (WOR) මත සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණි. තවද, ඉන් ඖෂධ 09ක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ විධිමත් කමිටු අනුමැතියකින් තොරව විශේෂ ක්‍රමවේදයක් (Special pathway) යටතේ නිකුත් කර තිබුණි. එබැවින් ලියාපදිංචියෙන් නිදහස් කිරීම සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමේදී අදාළ කමිටුව විසින් සලකා බලනු ලබන මිල සාධාරණත්වය, ඖෂධය පිළිබඳ අදාළ විද්‍යාලයේ මතය, ඖෂධයේ අවශ්‍යතාවය, දැනට පවතින ඒ හා සමාන ලියාපදිංචි ඖෂධ සංඛ්‍යාව, ඖෂධයේ ලියාපදිංචි තත්ත්වය, සැපයුම්කරුවන් සහ නිෂ්පාදකගේ ලියාපදිංචි තත්ත්වය, ගුණත්වය පිළිබව පෙර ගැටළු පැවතීම වැනි සාධක පිළිබඳව අවධානය යොමු කිරීමෙන් තොරව සහ ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය තහවුරු කරන ලේඛන ඇගයීමකින් තොරව ගැනුම් ඇණවුම, ඉන්ඩෙන්ටුව සහ	-එම-	-එම-

	ඉන්වොයිසිය වැනි ඇණවුම තහවුරු කරන ලේඛන පමණක් පරීක්ෂා කර අදාළ අනුමැතිය ලබා දී තිබුණි.		
(xii)	ඉහත සඳහන් ඖෂධ 15, 2024 ජූලි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබී තිබුණ අතර, ඒවායේ ඉන්වොයිසි වටිනාකම රු.මිලියන 132.90 ක්ද, සියයට 4ක් වූ සේවා ගාස්තුව වූ රු.මිලියන 5.31 ඇතුළුව මුළු වටිනාකම රු.මිලියන 138.21 ක්ද විය. විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් ලද රු.මිලියන 100 ක ප්‍රදානය සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් 2023 අගෝස්තු 17 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබාදී තිබුණද, සංස්ථාව විසින් වෛද්‍ය සැපයීම් අංශය වෙත එම වටිනාකම අඩු කිරීමෙන් තොරව මුළු වටිනාකම වූ රු.මිලියන 138.21 සඳහාම ගෙවීම් කිරිමට හරපත් ඉදිරිපත් කර තිබුණු අතර වෛද්‍ය සැපයීම් අංශය විසින්ද මෙම ඖෂධ සඳහා ඒ වන විටත්, රු.මිලියන 100 ක් ගෙවා ඇති බව නොසලකා මුළු වටිනාකම සඳහා ගෙවීම් වවුචර් පිළියෙල කර තිබූ අතර විගණන පරීක්ෂාවෙන් පසු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමණාකරු (පසු බෙදාහැරීම් මෙහෙයුම්) ගේ 2024 ඔක්තෝබර් 11 දිනැති ලිපිය මඟින් රු.මිලියන 100ක මුදල හරපත් වටිනාකමින් අඩුකරන ලෙස වෛද්‍ය සැපයීම් අංශයේ ගණකාධිකාරී වෙත දන්වා තිබුණි. ඒ අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ හා වෛද්‍ය සැපයීම් අංශයේ නිලධාරීන් විසින් හිතාමතා හෝ නොසැලකිල්ලෙන් ඉහත පරිදි කටයුතු කිරීම හේතුවෙන් රු.මිලියන 100 ක අතිරේක ගෙවීමක් සිදු කිරීමේ අවස්ථාව පැවති අතර, ඒ හේතුවෙන් මූල්‍ය විෂමාචාරයක් සිදුවීමේ අවධානමක් පැවති බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
(xiii)	අවබෝධයකින් තොරව හෝ නොසැලකිලිමත්ව කටයුතු කිරීමත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ නිලධාරීන් හිතාමතා හෝ නොසැලකිල්ලෙන් කටයුතු කිරීමත් නිසා මෙසේ රු.මිලියන 117.72 ක් හා රු. මිලියන 817.11 ක් ලෙස එකතුව රු.මිලියන 934.83 ක අතිරේක ගෙවීමක් සිදුකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව වර්ෂයකට වැඩි කාලයක්	-එම-	-එම-

	රජයේ අරමුදල් රු.මිලියන 934.83 ක් හා වර්ෂ 02 කට ආසන්න කාලයක් එ.ජ.ඩොලර් 12,150 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සාවද්‍ය ආකාරයට රඳවා තබා ගෙන ඇති බවත්, 2022 හා 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ ඩොලර් ගිණුම මඟින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලබා දී තිබුණු එ.ජ.ඩොලර් 49,680 ක් සඳහාද මේ ආකාරයටම හර නිවේදනපත් සකසා ගෙවීම් සඳහා වෛද්‍ය සැපයීම් අංශයට යොමු කර ඇති බවත් විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය. ඒ අනුව ආර්ථික අර්බුදය පැවති 2022/2023 කාල වකවානුව තුළ වෙනත් අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයීම් ප්‍රසම්පාදනය සඳහා යෙදවීමට හැකියාව පැවති රු.මිලියන 934.83 ක හා එ.ජ.ඩොලර් 61,830 ක රජයේ අරමුදල් විගණනය විසින් අනාවරණය කරන තෙක් වර්ෂ 02 කට අධික කාලයක් නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් අනවශ්‍ය ලෙස රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත රඳවා තබා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට සිදුකර ඇති අහිතකර බලපෑම කොපමණද යන්න මැනිය නොහැකි බව අවධාරණය කෙරේ.		
(ච)	2025 වර්ෂය වන විට අහෝසි කර ඇති ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය පවත්වාගෙන ගිය HQ Colombo ගොඩනැගිල්ලේ පළමු මහලෙහි Rare wing කොටස සහ පස්වන මහල බදු කුලී පදනම මත ලබාගැනීමේ දී ආරක්ෂිත තැන්පතු හා විදුලිය තැන්පතු ලෙස පුද්ගලික සමාගමක් වෙත ගෙවා ඇති රු. 7,570,493 ක මුදල ගිවිසුම අවසන් වීමට පෙර මාසික කුලී සඳහා හිලව් කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට ගිවිසුම්ගත කාලය අවසන් වී මාස 14ක කාලයක් ගත වී ඇතත් එම තැන්පත් මුදල් අයකරගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇතත් මේ දක්වා කිසිදු නීතිමය පියවරක් ගෙන නොමැති අතර අදාළ තැන්පතු මුදල් අයකර නොගැනීම පිළිබඳව විමර්ශණයක් සිදුකර ඊට වගකිවයුතු පාර්ශවයන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කළ යුතු බව නිරීක්ෂණය කෙරේ.	මේ සම්බන්ධ කටයුතු කඩිනමින් සිදු කරන ලෙස අතිරේක ලේකම් (සංවර්ධන) හා ප්‍රධාන නීති නිලධාරී වෙත දන්වා ඇති බව.	අදාළ තැන්පතු මුදල් අයකර නොගැනීම පිළිබඳව විමර්ශණයක් සිදුකර ඊට වගකිවයුතු පාර්ශවයන්ගෙන් හෝ අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(ඡ)	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2023 දෙසැම්බර් 04 දිනැති අංක SM/PSRP/14/2022/SWASTHA-Vel.II දරන ලිපියට අනුව වාර්ෂික ඖෂධ තොග	-එම-	වාර්ෂිකව ඖෂධ තොග සමීක්ෂණයට භාජනය කර ඌණතා අයකර

	සමීක්ෂණය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත සමීක්ෂණ මණ්ඩලයක් මඟින් වාර්ෂිකව දෙසැම්බර් 31 දිනට සිදු කළ යුතු වුවත්, 2023 හා 2024 වර්ෂයන්හි ඖෂධ තොග සමීක්ෂණය විගණිත දින වූ 2025 මාර්තු 10 දින වන විටත් කිසිදු රෝහලක සිදුකර නොතිබුණි.		ගැනීමට හෝ අතිරික්තතා ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුය.
(ෂ)	පොළොන්නරුව ශික්ෂණ රෝහලේ විකිරණ අංශයෙහි A කාමරයේ ස්ථාපිත විකිරණ යන්ත්‍රයෙහි රු.මිලියන 7 ක් පමණ වටිනා කොටසක් වන Table Detector, 2021 නොවැම්බර් 20 දින අක්‍රිය වීමෙන් වූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.	අදාළ නියෝජිත ආයතනය 2021 නොවැම්බර් 25. දින යන්ත්‍රයෙහි table detector එක නිෂ්පාදිත රට වන ජපානය වෙත යොමු කර ඇති බව, අනතුරුව 2023 මාර්තු 31 අලුත් වැඩියා කිරීමට නොහැකි බව දන්වා උපකරණය මෙම රෝහල වෙත නැවත ලබාදී ඇති බව, 2021 ඔක්තෝබර් 01 **දින** power adaptor එකක් උපකරණයට ලබාගෙන ඇති බවත් 2021 ජූලි 30 battery replace කර ඇති බවත් සඳහන්ව ඇති බව, එබැවින් මෙම උපකරණය ක්‍රියා විරහිත වීම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වා මුදල් රෙගුලාසි 104 මඟින් වාර්තා කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් සිදු කර හානිය සම්බන්ධයෙන් වගකිවයුත්තන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.
(ස)	ලෝක බැංකුවේ ණය ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරිමේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මත UNOPS ආයතනය හරහා මිලදීගෙන තිබුණු Blood Glucose Strips ශල්‍ය අයිතමය හා Atracurium Besylate **හා** Nitroglycerine Sublingual Tablets 0.5 mg (GTN) යන ඖෂධ අයිතම 02 රෝහල් වෙත බෙදා නොහැර වෛද්‍ය සැපයීම් අංශ ගබඩා තුළම කල් ඉකුත්වී තිබුණු අතර කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
	(i) රෝගීන්ගේ රුධිරයේ සීනි මට්ටම මැන බැලීම සඳහා භාවිතා කරන Blood Glucose Strips – Adults අයිතමයේ ඇණවුම් කරන ලද එ.ජ.ඩොලර් 600,000 ක් පිරිවැය වූ (ආසන්න වශයෙන් රු.මිලියන 219) ඒකක 5,000,000 කින් සියයට 50 ක් හෙවත් රු.109,500,000 ක් වටිනා ඒකක 2,500,000 ක් 2023 මාර්තු 20 දින වෛද්‍ය සැපයීම් අංශයේ අංක 54 ගබඩාවට ලැබී තිබුණි. එම	පිළිතුරු ඉදිරිපත් කර නැත.	විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

	තොගය එම ගබඩාව තුළ වර්ෂ 01 මාස 09 කට ආසන්න කාලයක් අදාළ ලේඛන නොලැබීම මත යැයි සඳහන් කරමින් භාණ්ඩ ලැබීම් සටහන් කිරීමකින් තොරව පැවති අතර 2025 ජනවාරි 31 දින වන විට වෛද්‍ය සැපයීම් අංශ ගබඩා තුළදීම එම තොගය රෝහල්වලට බෙදා නොහැර කල් ඉකුත් වී තිබුණි.		
(ii)	මෙම වකවානුව තුළ UNOPS ආයතනය හරහා ලබාදෙන තොගවලට අදාළ ලේඛනවල පැවති අඩුපාඩු හේතුවෙන් ඖෂධ තොග තාවකාලිකව ගබඩා කිරිමේ වැරදි ක්‍රමවේදයක් වෛද්‍ය සැපයීම් අංශය තුළ අනුගමනය කර ඇති බවත්, ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂකගේ උපදෙස් මත මෙම තොගයට අදාළ ඉන්වොයිසි, ඇසුරුම් ලැයිස්තු ආදිය නොමැතිව ගබඩා භාරකරු විසින් අදාළ තොගය භාර ගෙන තිබුණි. ඊට මාස 02කට පසු එනම් 2023 මැයි 31 දින වන විට එම ලේඛන වෛද්‍ය සැපයීම් අංශ තොග පාලන ඒකකයට ලැබී තිබියදීත්, UNOPS ආයතනය හරහා ලබා දෙන වෛද්‍ය සැපයීම් සම්බන්ධීකරණය සඳහා වෛද්‍ය සැපයීම් අංශය තුළ ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස වෙනම ඖෂධවේදියකු පත්කර තිබියදීත්, නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම හේතුවෙන් මෙම කල් ඉකුත් වීම සිදු වී තිබුණි.	-එම-	-එම-
(iii)	2023 වර්ෂය වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශ ගබඩා තුළ සිදුකරන ලද වාර්ෂික තොග සමීක්ෂණයේදී මෙලෙස GRN නොකරන ලද තොගයක් පැවතීම පිළිබඳව තොග සමීක්ෂණ මණ්ඩලයට අනාවරණය නොවීම හේතුවෙන් අදාළ සමීක්ෂණ මණ්ඩලය තම සමීක්ෂණ කටයුතු නිවැරදිව හා වගකීමෙන් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදු කළේ නම් මෙම අයිතමය කල් ඉකුත් වීම වළක්වා ගත හැකිව තිබුණි.	-එම-	-එම-
(iv)	Blood Glucose Strips අයිතමයට අදාළ 2021 හා 2022 වර්ෂයන්ට අදාළ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉදිරිපත් කළ ප්‍රධාන ඇණවුම්වල පැවති ගැටළු හේතුවෙන් ඒ වන විට රෝහල් තුළ මෙම අයිතමයේ	-එම-	-එම-

හිඟයක් තිබුණු අතර 2022 වර්ෂයේදී රෝහල් විසින් රු. 59,607,902 ක දේශීය මිලදී ගැනීම් සිදුකර පැවති අතර නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශය තුළ ඒකක මිලියන 2.5 ක තොග පැවතියදී එම තොගය රෝහල් වෙත නිකුත් නොකිරීම නිසා 2023 වර්ෂය තුළදීද රෝහල් විසින් රු. 52,097,126 ක දේශීය මිලදී ගැනීම් සිදුකර තිබුණි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ඊට පෙර ඒකකයක් රු. 11 කට මිලදී ගන්නා ලද මෙම අයිතම UNOPS ආයතනය හරහා ඒකකයක් රු. 43 බැගින්ද තොග හිඟය හේතුවෙන් රෝහල් විසින් ඒකකයක් රු. 83 ත් රු. 112 ත් අතර ඉහළ මිල ගණන්වලට මිලදී ගෙන තිබුණි.		
(v) පිරිවිතර අනුව මෙම අයිතමය සමඟ නොමිලේ සැපයිය යුතු Blood glucose meter 2000 ක් හා Lancet pin 4,980,000 ක් එ.ජ.ඩොලර් 87,680 ක් වැය කරමින් ව්‍යාපෘතිය හරහා මිලදී ගෙන තිබුණු අතර Blood Glucose Strips ඒකක මිලියන 2.5 කල් ඉකුත් වීමත් සමඟ Lancet pin ඒකක මිලියන 2.5 ක ප්‍රමාණය භාවිතයට ගත නොහැකිව නිෂ්කාර්ය වීමේ අවධානමක් ඇති වී තිබුණි.	-එම-	-එම-
(vi) කල් ඉකුත් වූ Blood Glucose Strips ඒකක මිලියන 2.5 සඳහා පිරිවැය, නිෂ්කාශන ගාස්තු හා දේශීය මිලදී ගැනීම් සඳහා යොමු වීම හේතුවෙන් රු.198,057,949 ක් රජයට පාඩු සිදු කරමින් නොසැලකිලිමත්ව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-
(vii) මීට අමතරව ලෝක බැංකු ණය ආධාර යටතේ UNOPS ආයතනය හරහා ඇණවුම් කරන ලද එ.ජ.ඩොලර් 129,000 ක් වටිනා (ආසන්න වශයෙන් රු.38,055,000) Atracurium Besylate **25**mg/**2.5**ml USP Injection ඖෂධ ඒකක 250,000 ක් 2023 ජූලි 06 දින වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණු බවත්, ශීත දාම ඖෂධ ගෙන්වීමේදී පවත්වා ගත යුතු ශීතදාම තත්ත්වයන් පිළිබඳව තහවුරු කර ගැනීමට අවශ්‍ය උෂ්ණත්ව දත්ත මාපක සටහන් නොමැති වීමෙන් මෙම ඖෂධය ප්‍රතික්ෂේප කර ඇති	-එම-	-එම-

	නමුත් මෙම වාර්තාව නිකුත් කරන විටත් වර්ෂ 02 කට ආසන්න කාලයක් වෛද්‍ය සැපයීම් අංශයේ අංක 06 ශීත ගබඩා තුළ ගබඩා කර 2025 මාර්තු මාසයේදී කල් ඉකුත් වී තිබුණි. ඒවා ඉවත් කිරීමට UNOPS ආයතනය ක්‍රියාමාර්ග ගෙන නොමැති බව විගණනයේදි නිරීක්ෂණය වූ අතර මෙහි පිරිවැයට අමතරව මෙම ඖෂධ නිෂ්කාශනය හා වරාය ප්‍රමාද ගාස්තු ලෙස රු.829,811 ක් ගෙවා තිබුණි.		
(viii)	වෛද්‍ය සැපයීම් අංශයේ සීමිත ශීත ගබඩා ධාරිතාවයක් පවතින බැවින් ප්‍රතික්ෂේපිත ඖෂධ තොගයක් මෙලෙස ශීත ගබඩා තුළ තබාගැනීම නිසා ගබඩා කළමනාකරණය ද දුෂ්කර වී ඇති බව නිරීක්ෂණය වූ අතර 2025 මාර්තු මස කල් ඉකුත් වූ මෙම ප්‍රතික්ෂේපිත ඖෂධ තොගය තවදුරටත් ශීත ගබඩා තුළ ගබඩා කර තැබීම වෛද්‍ය සැපයීම් අංශයට අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.	-එම-	-එම-
(ix)	UNOPS ආයතනය හරහා මිලදී ගත් Nitroglycerine Sublingual Tablets 0.5 mg යන ඖෂධය ද වෛද්‍ය සැපයීම් අංශයේ නිර්ණායකවලට අනුකූල නොවන බැවින් වෛද්‍ය සැපයීම් අංශය වෙත භාර නොගත් ඖෂධ තොගයක් බව නිරීක්ෂණය වූ අතර මෙම ඖෂධය විගණිත දිනය වන විටත් වෛද්‍ය සැපයීම් අංශයේ දෙවන මහලේ ගබඩා කර තිබුණි. රු.මිලියන **71** කට ආසන්න වටිනාකමකින් යුතු මෙම ඖෂධය ඉවත් කර ගැනීම සඳහා UNOPS ආයතනය විසින් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.	-එම-	-එම-
(x)	UNOPS ආයතනය හරහා මිලදී ගත් Blood Glucose Strips, Atracurium Besylate හා GTN ඖෂධ සියල්ල කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව කල් ඉකුත් වී විගණිත දිනය වන විටත් වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩාවල ගබඩා කර ඇති අතර මෙම ඖෂධ කල් ඉකුත් වීම වළක්වා ගැනීමට හා වෛද්‍ය සැපයීම් අංශයේ නිර්ණායකවලට යටත්ව මෙම ඖෂධ සැපයීමට හෝ එම සියලු කාර්යයන් විධිමත්ව සම්බන්ධීකරණය කිරීමට කටයුතු කර නොතිබුණ අතර මේ සඳහා වැයවූ මුළු පිරිවැය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	-එම-	-එම-

	(xi) ඉහත අයිතමවලට අමතරව තත්ත්වයෙන් අසමත් වූ අයිතමද ඇතුළත්ව රු.මිලියන 890.16 ක් වටිනා වෛද්‍ය සැපයීම් අයිතම 892 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සැපයීම් අංශය තුළත් රෝහල් තුළත් කල් ඉකුත් වී තිබුණි.	-එම-	-එම-
(හ)	මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් පිළිවෙලින් ඖෂධ ඌණතා, කල්ඉකුත් වීම් හා හානිවීම් රු.මිලියන 22.91 ක් රු.මිලියන 218.04 ක් හා රු.මිලියන 199.26 ක් සම්බන්ධයෙන් වසර 4 සිට වසර 15 ක අතර කාලයක් ගතවී ඇතත් විගණිත දිනය වූ 2024 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	-එම-	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතුය.
(ළ)	2022 සිට 2024 දක්වා කාලය තුළ ගාල්ල ජාතික රෝහලට, රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය හරහා සහ සමසෞඛ්‍ය විද්‍යා පීඨය හරහා පැමිණි Elective පාඨමාලා හැදෑරූ විදේශීය සිසුන් පිළිවෙලින් 876 ගෙන් හා 73 ක ගෙන් එකතුව රු.මිලියන 168.19 ක මුදලක් ලැබී තිබුණු අතර එම මුදලින් ගාල්ල ජාතික රෝහලට ගෙවිය යුතු සියයට 25.9 කට සමාන රු.මිලියන 43.56 ක් මෙන්ම 2024 වර්ෂය වෙනුවෙන් විශ්ව විද්‍යාල මුදල් අනුකමිටු තීරණ අනුව වෛද්‍ය පීඨය විසින් ගාල්ල ජාතික රෝහලට ගෙවිය යුතු රු.250,000 ක් සමඟ එකතුව රු.මිලියන 43.81 ක් වූ මුදල් 2025 මාර්තු විගණිත දින දක්වාම අදාළ පීඨ විසින් රෝහලට ප්‍රේෂණය කර නොතිබුණි.	තත්ත්ව ප්‍රවර්ධන අරමුදලේ ආදායම් හා වියදම් පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද බව, තවද රුහුණු විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී සහ සම සෞඛ්‍ය විද්‍යාපීඨයේ ලේඛකාධිකාරී වෙතින් පිළිතුරු කැඳවා ඇති බව.	අයවිය යුතු සියලු මුදල් නිවැරදිව ගණනය කර අයකර රාජ්‍ය ආදායමට බැර කිරීමටත් එ් බව විගණනයට තහවුරු කිරීමටත් කටයුතු කළ යුතුය.
(ෆ)	2022 සිට 2024 දක්වා කාලය තුළ ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහලට, රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය සහ සම සෞඛ්‍ය වෛද්‍ය පීඨය හරහා පැමිණි Elective පාඨමාලා හැදෑරූ විදේශීය සිසුන් පිළිවෙලින් 122 ගෙන් හා 83 ක ගෙන් එකතුව රු.මිලියන 12.07 ක මුදලක් ලැබී තිබුණු අතර එම මුදලින් ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහලට ගෙවිය යුතු සියයට 25.9 ක් හෙවත් රු.මිලියන 3.13 ක් මෙන්ම විශ්ව විද්‍යාල මුදල් අනුකමිටු තීරණ අනුව 2024 වර්ෂය වෙනුවෙන් ජර්මන් ශ්‍රී ලංකා කාන්තා රෝහලට ගෙවිය යුතු රු.100,000 ක් සමඟ එකතුව රු.මිලියන 3.23 ක් වූ මුදල් 2025 මාර්තු විගණිත දින දක්වාම එක් එක් පීඨ විසින් රෝහලට ප්‍රේෂණය කර නොතිබුණි.	විගණනය විසින් කරුණු පෙන්වා දීමෙන් අනතුරුව මේ වන විට වෛද්‍ය පීඨය වෙතින් රු.300,000 ක මුදලක්ද සම සෞඛ්‍ය වෛද්‍ය පීඨය වෙතින් රු. 233,045 මුදලක් ද ලැබී ඇති බව, තවද මේ වන විට විදේශීය වෛද්‍ය සිසුන් සම්බන්ධයෙන් ක්‍රමනුකූලව තොරතුරු ලබාගැනීමට සැලසුම් අංශය මඟින් විධිමත් වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතින බව.	-එම-

(අඅ) ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ අධ්‍යක්ෂගේ නිල නිවස සංවර්ධනය කිරීම, භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් කරන ලද විගණනයේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i)	ආයතන සංග්‍රහයේ **xix** වැනි පරිච්ඡේදයේ 1.1 යටතේ ප්‍රතිපාදන නොමැති වුවත්, අධ්‍යක්ෂගේ නිවාසය සඳහා ගෘහ භාණ්ඩ ලබාගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) අනුමැතිය ලබා දී තිබුණි.ඒ අනුව රු.239,535ක් වටිනා ගෘහ භාණ්ඩ හා විදුලි උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනයෙන් තොරව ඇණවුම් කර සපයා තිබුණි. තවද රෝහල් අවශ්‍යතා සඳහා මිලදී ගන්නා ලද රු.258,755 ක් වටිනා ගෘහ හා විද්‍යුත් උපකරණ වර්ග 06 ක් අධ්‍යක්ෂගේ නිවසෙහි පරිහරණය සඳහා යොදා ගෙන තිබුණි.	මේ වන විට එම භාණ්ඩ අධ්‍යක්ෂ නිල නිවසේ ඇති අතර මේ සඳහා කිසිදු ගෙවීමක් සිදු කර නොමැති බව, මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි වැටලීම් අංශය විසින් විමර්ශනයක් සිදු කරමින් පවතින අතර එම වාර්ථාව අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා බවත් මේ වන විට ගබඩා සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතර ඉන් පසුව ඉල්ලුම් කර ඇති අංශ වලට බෙදා හැරීමට කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර කඩිනමින් විමර්ශනය සිදු කර එම වාර්තාව හා ගන්නා ක්‍රියා මාර්ග විගණනයට ඉදිරිපත් කටයුතු කළ යුතුය.
(ii)	රෝහල් අධ්‍යක්ෂ වෙත ලබා දී අධ්‍යක්ෂගේ නිවස වටා රු. 28,000 ක් වැය කර කම්බි කණු 14 ක් යොදා ගෙන සකස් කරන ලද වැට ගලවා තාප්පයක් ඉදිකර තිබුණු අතර, තාප්පය ඉදිකිරීමේදී ගලවන ලද කම්බි කණු කිසිවක් රෝහල සතුව නොතිබුණි. තිබුණු නිවාසයේ 2024 දෙසැම්බර් 02 දිනෙන් පසුව කුකුල් කූඩුවක් සකස් කර තිබුණු අතර, ඊට අමතරව සිමෙන්ති ගල් හා දැල් යොදා ඉදි කර තිබුණු තවත් කොටසක් කඩා දමා ඇති බව 2025 මාර්තු 25 දින සිදු කරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි වැටලීම් අංශය විසින් විමර්ශනයක් සිදු කරමින් පවතින අතර එම වාර්ථාව අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව, මීට අමතරව ඇඹිලිපිටිය පොලිස් ස්ථානයෙන් පරීක්ෂණ සිදු කරමින් පවතින බවත් තාප්පය සකස් කිරිමේදි සවිකර තිබූ කම්බි කණු 14 ගලවා රෝහල් අධ්‍යක්ෂ නිල නිවාස පරිශ්‍රයේ තිබූ අතර පසුව රෝහල් අධ්‍යක්ෂකගේ උපදෙස් පරිදි එම පරිශ්‍රයේ පාංශු ඛාදනය වැළැක්වීම සඳහා වැටි සකස් කිරිමට මෙම කම්බි කණු භාවිතා කර ඇති බව.	-එම-

(අආ) නාගොඩ ශික්ෂණ රෝහලේ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදි පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i)	රෝහල තුළ ජනනය වන සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් පුද්ගලික සමාගමක් සමඟ එළඹ තිබුණු ත්‍රෛපාර්ශ්වික ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව අදාළ පුද්ගලික	ඉදිරියේදී මේ පිළිබඳ නොපමාව සොයා බලා වැඩිපුර ගෙවීමක් සිදුවී ඇත්නම් ඉදිරි බිල්පත් වලින් අයකර ගැනීමට කටයුතු	ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් රජයට අයවිය යුතු සියලු

	සමාගම විසින් රෝහල වෙත සැපයිය යුතු අපද්‍රව්‍ය වෙන්කිරීම හා ගබඩා කිරීමට අවශ්‍ය වන සංකේත කරන ලද වර්ණ සහිත ඇසුරුම් මලු සපයා නොතිබීම හේතුවෙන් 2021 වර්ෂයේ පෙබරවාරි සිට 2023 වර්ෂය අවසානය දක්වා කාල පරිච්ඡේදය තුළ කහපාට මලු 205,140 ක් මිලට ගැනීම වෙනුවෙන් රු. 3,717,974 ක් රජයට පාඩු වී තිබුණි.	කරන බව.	මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
	(ii) 2024 වර්ෂයේ අප්‍රේල්, මැයි සහ ජූනි සඳහා රෝහලේ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම කහ වර්ණයෙන් යුත් මලු 5260 ක ප්‍රමාණයක් පමණක් අදාළ සමාගම විසින් සපයා තිබුණද රෝහලේ මාසික කහ වර්ණයෙන් යුත් බෑග් අවශ්‍යතාවය වූ 7000 ක ප්‍රමාණය සමඟ සැසඳීමේදී එම ප්‍රමාණය කිසිසේත්ම ප්‍රමාණවත් වී නොතිබුණි. එසේම සායනික අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා අවම වශයෙන් gauge 300 ක ඝනකමකින් යුත් මලු සැපයිය යුතුව තිබුණද සපයා තිබූ මලුවල ගණත්වය gauge 110 ක් පමණක් වී තිබුණි.	-එම-	-එම-
(අඇ)	2017 අප්‍රේල 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සියලුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු අතර 2017 මැයි 12 දිනැති අංක DMS/0016 දරන භාණ්ඩාගාර ලේකම් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත නිකුත් කර තිබුණු ලිපිය ප්‍රකාරව,සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කළ හැකි පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වග බලා ගත යුතු විය.නමුත් අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශයට, එයට අයත් රෝහල් හා ආයතන සඳහා රු.මිලියන 31.08 ක් වැය කර ස්ථාපිත කර තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 213 ක් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවති අතර වර්තමාන වැටුප පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේදීද වැටුප් සඳහා රු.මිලියන 45,333 ක් ද අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.මිලියන 39,717.63 ක්ද වශයෙන් මුළු මුදල රු.මිලියන 85,050.63 ක් ගෙවා තිබුණි.එසේම අතිකාල හා නිවාඩු දින වැටුප්	සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වන ජීව වෛද්‍ය ඉංජිනේරු හා වෛද්‍ය සැපයුම් අංශයේ ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කරන අතර අමාත්‍යාංශ ගොඩනැඟිල්ල තුළ ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකර ඇති අතර ඇඟිලි සලකුණු ලියාපදිංචි කළ පසු ඒවා භාවිතා කළ හැකි බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධ වාර්තා තබා ගැනීමටත්, ඊට අනුකූල වන පරිදි නිලධාරීන්ගේ අමතර රාජකාරි දීමනා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වා ගෙන යාමටත් කටයුතු කළ යුතු අතර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.

වෙනුවෙන් වැය කර තිබුණු මුළු මුදල වැටුප් පිරිවැයෙන් සියයට 87.6 ක් පමණ වී තිබුණි.

5. තිරසර සංවර්ධන අරමුණු ලඟ කර ගැනීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළව තිරසර සංවර්ධන දර්ශක 42 ක් හඳුනාගෙන තිබුණු අතර ඉන් දර්ශක 26 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රගතිය වාර්තා කර නොතිබුණි. තවද ප්‍රගතිය වාර්තා කරන ලද දර්ශක 09ක අවශ්‍ය කාර්යසාධන මට්ටම කරා ද ළඟා වී නොතිබුණි.	අවශ්‍ය මැදිහත්වීම් වෙනස් කරන බව, මේ සම්බන්ධ දත්ත ක්ෂේත්‍රයන් එකතු කරමින් පවතින අතර, ඒවා තහවුරු කිරීමෙන් පසු මාස කිහිපයකින් ඉදිරිපත් කළ හැකි බව.	2030 වන විට අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීම සඳහා වාර්ෂිකව පසුවිපරම් කරමින් අවශ්‍ය ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට වැටුප් තල අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතනවලට අදාළ අනුමත සමස්ථ කාර්යමණ්ඩලය 97,986 ක් හා එදිනට තථ්‍ය කාර්යමණ්ඩලය 84,106 ක් විය. ඒ අනුව සමස්ථ කාර්යමණ්ඩලයේ 13,880 ක ඌණතාවයක් පැවතුණි. එසේවුවද තනතුරු 279 කට අදාළව නිලධාරීන් 14,853 ක ඌණතාවයක්ද තනතුරු 37 කට අදාළව නිලධාරීන් 937 ක් අතිරික්තවද සේවයේ යොදවා තිබුණි. මේ තුළ පැවති තනතුරු 58 කට අදාළව නිලධාරීන් 14,536 ප්‍රමාණයක් ආයතන තුළ ඌණව පැවතීම මෙන්ම ඇතැම් ආයතනවල නිලධාරීන් 3,484 අතිරික්තව පැවතීමත් නිරීක්ෂණය වූ අතර මෙලෙස අතිරික්තය හා ඌණතා තුළනය නොකර මෙසේ සේවයේ යෙදවීම කළමනාකරණයේ දුර්වලතාවයක් බව නිරීක්ෂණය විය. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඉහත අතිරික්ත හා ඌණතාවයන් පැවති තනතුරුවලට අමතරව තවත් තනතුරු 31 කට අදාළව නිලධාරීන් 694 ක කාර්යමණ්ඩල අතිරික්තයක් පැවතුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් 07 දින අමාත්‍යාංශයට අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) නමින් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ එක් තනතුරක් සඳහා අනුමැතිය ලබාදී තිබුණද එම තනතුර සම්පූර්ණ	ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සේවකයින් සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තිමය තීරණයකට එළඹිය යුතු බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සඳහන් කර ඇති බව, තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක **DMS/CI/H& N/O** හා 2010.06.11 දිනැති ලිපිය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති ගබඩා භාරකරු තනතුරු 102 ක් යටපත් කර වෛද්‍ය සැපයීම් සහකාර තනතුරු 104 ක් ඇති කිරීමට කටයුතු කර ඇති බව, අවිධිමත් ලෙස බඳවාගෙන තිබුණු මුදුරු මර්දන සහයකයින් බඳවා ගැනීම පිළිබඳව රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන දැනුම් දුන් පසු ඒ අනුව කටයුතු කරන බව.	කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමටත් ඒ ඒ රෝහල් හා ආයතනවලට අනුමත කාර්යමණ්ඩලය නොඉක්මවා නිලධාරීන් හා සේවකයින් අනුයුක්ත කිරීමටත් අනුමැතියක් රහිත තනතුරුවලට අදාළ අනුමැතීන් ලබාගැනීමටත් කටයුතු කළ යුතුය.

	කිරීමට කටයුතු කර නොතිබුණි. ඩෙංගු මර්දන කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත අවිධිමත් ලෙස බඳවාගෙන තිබුණු මදුරු මර්දන සහයකයින් 1,102 දෙනෙකු සේවයේ යොදවා තිබුණද ඉන් තනතුරු 671 ක් වෙනුවෙන් පමණක් 2024 වර්ෂයේදී අනුමැතිය ලබාගෙන තිබුණි.		
(ආ)	2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති XVIII වැනි පරිච්ඡේදයේ 193 වගන්තිය ප්‍රකාරව සෑම රජයේ නිලධාරියෙක්ම ස්ථානමාරු කිරීම් වලට යටත් කළ යුතු වුවද 2024 සැප්තැම්බර් 30 දිනට රිජ්වේ ආර්යා ළමා රෝහලේ කාර්ය මණ්ඩලයට අදාළව සේවා කාළය අවුරුදු 05ත් 10ත් අතර නිලධාරීන් 520 දෙනෙකුද, අවුරුදු **10**ත් 20ත් අතර නිලධාරීන් 389 දෙනෙකුද, අවුරුදු **20**ත් 30ත් අතර නිලධාරීන් 219 දෙනෙකුද අවුරුදු 30ට වැඩි නිලධාරීන් 33 දෙනෙකුද සේවයේ යොදවා තිබුණි.එසේම තනතුරු 26 කට අදාළ නිලධාරීන් 422 ක් වර්ෂ 06 ත් වර්ෂ 33 ත් අතර කාලපරිච්ඡේදයක් පොලොන්නරුව ශික්ෂණ රෝහලේ අඛණ්ඩව සේවයේ යෙදී සිටින බව නිරීක්ෂණය විය . තවද ,මහනුවර ජාතික රෝහලේ හෙද කාර්ය මණ්ඩලය සඳහා නිශ්චිත අභ්‍යන්තර මාරු ප්‍රතිපත්තියක් හෝ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන අතර මහනුවර ජාතික රෝහල තුල හෙද නිලධාරීන් 426 දෙනෙකු වසර 10 සිට වසර 31 දක්වා වූ දීර්ඝ කාලයක් එකම ඒකකය තුල හෝ එකම අංශය තුල සේවයේ නිරත වී තිබුණි. තවද රෝහල තුල හෙද කාර්ය මණ්ඩලයේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි.	මහනුවර ජාතික රෝහලේ හෙද නිලධාරින් 426 න් 204 ක් පමණ සේවයේ යොදවා ඇත්තේ විශේෂිත ඒකකවලට බැවින්, රෝහල තුළ අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රමවේදයක් සකස් කිරිම සම්බන්ධව විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි වෙත දන්වා ඇති බව,පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විශේෂිත පුහුණු වීම් ලබා ඇති සේවකයින් හා රහස්‍යභාවය සහිත අංශවල (මෘත ශරීරාගාරය, වෛද්‍ය ලේඛනාගාරය වැනි) සේවකයින් හැර අන් සියලු සේවකයින් වසර කිහිපයකට වතාවක් ස්ථාන මාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව, පොළොන්නරුව ශික්ෂණ රෝහලේ ස්ථාන මාරු ඉල්ලා සිටින කාර්යමණ්ඩලයට පමණක් වාර්ෂිකව ස්ථාන මාරු ක්‍රියාත්මක වන බව.	2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති **XVIII** වැනි පරිච්ඡේදයේ 193 වගන්තිය ප්‍රකාරව කටයුතු සිදු කළ යුතු අතර අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	හෙද නිලධාරීන් බඳවා ගැනීමේදී හා හෙද පුහුණුව ලබා දීමේදී නිවැරදි ආකාරයෙන් පෞද්ගලික ලිපිගොනු ආරම්භ කර පවත්වා නොගැනීම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ විවිධ වූ ආයතන අතර අන්තර් සම්බන්ධතාවයක්, නොදැනුවත්කම් හෝ වංචාසහගත ක්‍රියාකාරකම් හේතුවෙන් 1984 හෙද පුහුණු පාඨමාලාවට ඇතුළත්ව 1988 ජූලි 18 දින හෙද නිලධාරිණියක ලෙස පත් වූ නිලධාරිණියක උප්පැන්න සහතික 02 ක් හා ජාතික හැඳුනුම්පත් 02 ක් මගින් පරස්පර තොරතුරු පෞද්ගලික ලිපිගොනුවට වංචා සහගත ලෙස ලබාදී තිබුණි. ලේඛනයන්ට අනුව එම නිලධාරිණිය 2022 නොවැම්බර් 01 දින විශ්‍රාම යා යුතු වුවද කූඨ ලේඛන ඉදිරිපත් කර එය හෙළිදරව් වූ අවස්ථාව	අදාළ හෙද නිලධාරිණිය සම්බන්ධයෙන් EJ/පොදු ලිපිගොනු දරන ලිපියෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් අංක MH/FS/PI/09/2023/B-175/354 යටතේ මූලික විමර්ශනයක් සිදු කරමින් පවතින අතර, අදාළ මූලික විමර්ශනය මෙතෙක් අවසන්ව නොමැති බව.	පෞද්ගලික ලිපිගොනු විධිමත්ව පවත්වා ගෙන යාමටත් අදාළ මූලික විමර්ශනයන් කඩිනමින් අවසන් කිරීමටත් කටයුතු කළ යුතුය.

	වන 2023 වර්ෂයේ අගෝස්තු 20 දින දක්වාම සේවයේ යෙදී සිටිමින් වංචා සහගතව කටයුතු කර ඇති අතර විශ්‍රාම යායුතු දිනෙන් පසුවද ඇයට මාස 10 ක් සඳහා රු. 648,680 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.		
(ඇ)	2002 වර්ෂයේ ජනවාරි 07 දින සිට විකිරණ ශිල්පියෙකු ලෙස පත්වීම් ලද නිලධාරියකු අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදී ඔහු විශ්‍රාම ගොස් මාස 08 ක් ඉක්මවා යන අවස්ථාව වූ 2024 අගෝස්තු 30 දක්වාද සේවය ස්ථිර කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. එමෙන්ම සේවා මුක්ත තාවයකට දෙන අනුග්‍රාහ යටතේ රාජ්‍ය සේවයේ ඖෂධවේදියෙකු ලෙස 2017 මාර්තු 20 දින මහනුවර ජාතික රෝහල වෙත පත්වීම් ලබා තිබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විශ්‍රාමික නිලධාරියෙකු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි 06 ඡේදය ප්‍රකාරව විශ්‍රාම වැටුප සමඟ හිමිවන ජීවන වියදම් දීමනාවේ ඉතිරි අර්ධය මාසික දීමනාව සමඟ ලබා දිය යුතු වුවද සම්පූර්ණ ජීවන වියදම් දීමනාව ඔහු වෙත ලබා දී තිබුණි. ඒ අනුව ඔහුවෙත රු. 398,830 ක් වැඩිපුර ගෙවා තිබුණි.	2024 සැප්තැම්බර් 13 දිනැති අංක TA/02/RG/PF/05/2002 දරන ලිපිය මඟින් 2002 ජනවාරි 07 දින සිට වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සභාවේ විකිරණ ශිල්පි තනතුරෙහි ස්ථිර කිරිම සෞඛ්‍ය ලේකම් අනුමත කර ඇති බව, 2017 මාර්තු 20 දින සිට 2024 ඔක්තෝබර් 31 දින දක්වා වැඩිපුර ගෙවා ඇති රු. 398,830 ක මුදල වැටුපෙන් අයකර රජයේ ආදායමට බැර කිරිමට කටයුතු කරන බව.	වැඩිපුර ගෙවා ඇති මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.